





# බෞද්ධ ගන්ධාරය

ඉතිහාසය, චිත්‍රකලාව සහ ගෘහනිර්මාණ ශිල්පය




ගල් කටුවෙන් සෞන්දර්යය නිර්මාණය
කරණු වස් දහඩිය මුගුරු හෙළූ
කලාකරුවන්ටයි
ඔවුන්ගේ කලා කෘති නම් සුරක්ෂිතව ඇත
එහෙත් ඔවුන් අපෙන් වියෝවී බොහෝ කල්ය

# බෞද්ධ ගන්ධාරය

ඉතිහාසය, චිත්‍රකලාව සහ ගෘහනිර්මාණ ශිල්පය

ඉශාන් එච් නදීම්



පකිස්ථානු මහ කොමසාරිස් කාර්යාලයේ ව්‍යාපෘතියකි
කොළඹ (ශ්‍රී ලංකාව)

954.918 **Ihsan H. Nadiem**
Buddhist Gandhara/Ihsan H. Nadiem
Lahore : Sang-e-Meel Publications, 2003
104p.:Photos.
1.History-Gandhara
2. Pakistan History.I. Title

Originally published in 2003
by
**Niaz Ahmed**
Sang-e-meel Publications
**LAHORE (PAKISTAN)**

Translated by
**M. S. A. Hussain** (B.A) Dip in Journalism
**Aruni Vishwa Attauda**

Expert review
**Prof. Anura Wickramasinghe**

Printed at
**Unie Arts (Pvt) Ltd.**
# 48B, Bloemendhal Road, Colombo 13.

with permission of
**THE HIGH COMMISSION FOR PAKISTAN**
Colombo, Sri Lanka.

954.918 **ඉශාන් එච් නදීම්**
බෞද්ධ ගන්ධාරය / ඉශාන් එච් නදීම්
ලාහුර් : සැංග්-ඊ-මීල් ප්‍රකාශන 2003
104 පි :. ඡායාරූප
1. ඓතිහාසික-ගාන්ධාරය
2. පාකිස්ථාන් ඉතිහාසය

සිංහල පරිවර්තනය
**එම්. එස්. ඒ. හුසෙයින්** (B.A) Dip in Journalism
**මහාචාර්යය අරුණී විස්වා අතාවුද**

විශේෂඥ පරිශිලක
**අනුර වික්‍රමසිංහ**

මුද්‍රණය
**සීමාසහිත යුනි ආට්ස්** (පෞ)
48බී, බ්ලුමෙන්ඩල් පාර
කොළඹ - 13

**පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ**
අනුමතිය අනුවයි.

# පටුන


| | | |
|---|---|---|
| | පෙරවදන | 7 |
| 1. | ගන්ධාරයේ ඉතිහාසය | 9 |
| 2. | බුදුරදුන්ගේ ජීවිතය | 15 |

ඔහුගේ ඉගැන්වීම
බෞද්ධ ධර්ම ග්‍රන්ථ

| | | |
|---|---|---|
| 3. | බුදුරදුන් පිළිබඳ ජාතක කථා සහ පුරාවෘත්ත | 23 |

දීපංකර පුවත, වෙස්සන්තර ජාතකය
මහාමායා දේවියගේ සිහිනය, සිහිනය පැහැදිලි කිරීම
සිද්ධාර්ථ උත්පත්තිය, කුමරුන් තැබූ පියවර හත, හඳහන
සිද්ධාර්ථ හා යසෝදරාගේ විවාහ මංගල්‍යය
රජමාලිගයේ ජීවිතය, සිද්ධාර්ථගේ ප්‍රථම භාවනාව
ගිහිගේ හැරයාම, මහා අභිනිෂ්ක්‍රමණය
ඡන්නට හා කන්ථකට ශුභ පැතීම
බ්‍රාහ්මණයන් සමඟ ප්‍රථම හමුවීම
මෝක්ෂය ලබා ගැනීම සඳහා උපවාසය,
පෙළඹවීම හා මාරප්‍රහාරය, බුද්ධත්වයට පත්වීම
පළමු ධර්ම දේශනය, ශ්‍රාවස්තියෙහි ප්‍රාතිහාර්යය,
බුදුන්ගේ පිරිනිවන් පෑම, බුදුන්ගේ ආදාහනය,
බුදුන්ගේ ධාතු බෙදහැරීම

| | | |
|---|---|---|
| 4. | ගන්ධාර චිත්‍ර කලාව | 41 |

කාල නිර්ණය

| | | |
|---|---|---|
| 5. | ගන්ධාර ගෘහ නිර්මාණ ශිල්පය | 59 |

ස්තූප
ආගමික ගොඩනැඟිලි ඉදිකරන ස්ථාන තෝරීම

| | | |
|---|---|---|
| 6. | ගෘහ නිර්මාණ ආදර්ශන | 65 |

I. **තක්ෂිලා නිම්නය**

1. පළමුවන නගර පෙදෙස - බීර් මෞන්ඩ්
2. දෙවෙනි නගර පෙදෙස - සිර්කප්
3. තුන්වෙනි නගර පෙදෙස - සිර්සුක්
4. ධර්මරාජික ස්තූප හා භික්ෂු ආරාම
5. ජවුලියන් සංඝාරාමය
6. මොහ්රා මොරාදු ස්තූපය හා සංඝාරාමය
7. ජන්දියාල් විහාරය

II. **පෙෂවෝර් නිම්නය**

1. ෂා-ජී-කි-ඪේරි
2. තක් - ඊ- බාහි සංඝාරාමය

III. **සිවට් නිම්නය**

1. බුකාරා සංඝාරාමය
2. පන්ර් සංඝාරාමය
3. සයිදු ෂරීෆ්

ආරම්භයේ දී බුද්ධාගම ආගමක් නොව ජීවිතය පිළිබඳ දර්ශනයකි. බුද්ධත්වයට පත් බුදුන් වහන්සේ දෙවි කෙනෙක් නොවූහ. කම්සැප සෙවීම සහ දුෂ්කර තවුස් චර්යාවට මැදි වූ මැදි පිළිවෙත දේශනා කළ උන් වහන්සේ සියලු දුකින් මිදීමේ මාර්ගය දේශනා කළ සේක. පසුකාලීනව ප්‍රගතිශීලී චින්තනයේ බුදුන් වහස්සේ දේවත්වයෙන් පිදීමට සුදුසු කෙනෙක් බවට පත්විය.

බුදුරජාණන් වහන්සේ ප්‍රථම වරට මිනිස් ස්වරූපයෙන් ප්‍රතිනිර්මාණය කළ හෙයින් ගන්ධාර කලාවට ගෞරවය හිමිවේ. ශාක්‍යමුනි සංකේතයකින් දක්වනු වෙනුවට මිනිස් සිරුරින් දැක්වීම කණිෂ්ක රජුගේ පාලන සමයෙහිදී බෞද්ධාගමේ පූජා විධීන්ගේ ඉස්මතුවීමක් හේතුකොට සිදු වූවක් විය හැකිය

මහාචාර්යය එෆ්.ඒ. ඛාන්
පාකිස්තානයේ ගෘහනිර්මාණ ශිල්පිය හා කලාව

# පෙරවදන


ගන්ධාර යුගයේ නටබුන් වලින් ගහනව පැවැති වයඹ දේශසීමා ප්‍රදේශයට මා අනුයුක්ත කරනලද අවස්ථාවේ එහි පැවැති බෞද්ධ අවධිය පිළිබඳ සවිස්තර නුවුවත් සරල වගයෙන් හෝ පොතක් බිහිවිය යුතු බව මා සිතතුළ තදින් බලපැවැත්විණි. මෙම විෂයට අදාළව තිබූ පොත් බොහෝවිට නොයෙකුත් ප්‍රදර්ශන හෝ ප්‍රදර්ශන සඳහා තිබූ නාමාවලියක ස්වරූපය යත් ඒවාවූ අතර සම්පූර්ණ විෂයට අදාළ ඒවා නොවිය. ගන්ධාර කලා ශිල්පය වෙනුවෙන් තිබූ අනෙකුත් පොත් ස්වල්පයක් වූ අතර ඒවාද දකුණු ආසියාන්තික උපමහාද්වීපය පිළිබඳ යථාර්ථය විදහා දක්වීමට තිබූ ඒවා විය. එම නිසා මා මෙහි දක්වන තොරතුරු බොහෝවිට මේ ප්‍රදේශයේ පවතින බෞද්ධාගම පිළිබඳවත් ප්‍රදේශය පිළිබඳවත් වනු ඇත. බෞද්ධ කලාව, ගෘහනිර්මාණ ශිල්පය හා මේ ප්‍රදේශයේ ඉතිහාසය කෙටියෙන් දක්වන අතර එය ගිහියකු මෙන්ම විද්වතෙකුද මැනවින් අවබෝධ කරගනු ඇත. මෙම උත්සාහයේදී කෙතරම් දුරට මා සාර්ථක වී ඇද්දැයි තීරණය කිරීම පාඨකයාට භාරකරමි.

මෙම කෘතිය ලිවීමේදී නොයෙකුත් අයුරින් මට උදව්කල මිතුරෝ බොහොමයක් වෙති. මීට ප්‍රථමවාර වලදී මෙන්ම චෞද්රි නියාස් අහමඩ් නිතරම මාව දිරිමත් කල අතර එය මා තුළ වූ ධෛර්යය වැඩි දියුණු කරමින් මෙවැනි සියුම් විෂයක් කෙරෙහි මා සිත යොමු කිරීමට පෙළඹුණි. චෞද්රි අෂ්සාල් අහමඩ් මහතාද මට අවශ්‍යව තිබූ වෙනත් පොත්පත්ද සපයා දීමෙන් මෙවැනි වැදගත් කර්තව්‍යයක් නිමාකර ගැනීමට උදව්විය. ඒ ගැන එම දෙපොලට මම ස්තුතිවන්ත වෙමි. ඓතිහාසික නවකථා, සංචාර කථා තීරු රචනා වැනි දේ ලියන ලේඛක ඇම් රෆීක් ඩොගාර් මහතා මාව දිරිමත් කරමින් ඔහුගේ වටිනා කාලය සමහර අංශ පරීක්ෂා කිරීමෙන් හා විග්‍රහ කිරීමෙන් මට උපකාරි විය. ගන්ධාර ඓතිහාසික හා කලාත්මක කරුණු ගැන අවබෝධයක් ලබාගන්නා අවස්ථාවේදී ස්ථිර නිගමනයකට පැමිණීමට පෙර කරුණු සාකච්ඡා කිරීමෙන් හා ඒ පිළිබඳ උදව් උපකාර කිරීමෙන්ද කළ උපකාරය ගැන ඔහුටද ස්තුති වන්ත වෙමි.

ගන්ධාරය පිළිබඳ කරුණු අවබෝධකර ගැනීමේදී මෙන්ම මීට ප්‍රථම 'සින්ද්' පිළිබඳ කරුණු හැදෑරීමේදීත් දුර්ලභ ගණයේ පොත්පත් සපයා දීමෙන් මට උදව් කළ අමනාත් අලි මහතාටද මගේ ස්තුතිය හිමිවිය යුතුය.

මගේ පවුලේ අයගෙන් ලැබුණු උදව් ගැන මා මේ අවස්ථාවේ සඳහන් නොකළොත් මා විසින් මාගේ රාජකාරිය පැහැරහැරීමක් වනු ඇත. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කරණතාක් කල් ඉතා ඉවසිලිවන්තව හා කාරුණිකව එම අයගේ පහසුව නොබලා කාලය මිඩංගු කරමින් මා වෙනුවෙන් කැප කිරීමක් සිදුවුණි. එම නිසාම මේ අවස්ථාවේදී, සුරය්යා, අසිම්, ඉරාම් හා ආසෙෆ් මෙන්ම මවුසුමා ශාමා හා කුඩා දරුවන් තිදෙනා වන උජාලා, සෝයා, හා අයෙෂා ටද ස්තුති වන්ත වෙමි.

**ඉශාත් එච්. නදීම්**
පකිස්තානයේ හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ හා
ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ බාහිර මහාචාර්ය



පරිච්ඡේදය 1




# ගන්ධාරයේ ඉතිහාසය

බොහෝ දිගුකලක සිට දුර්ලභ ගණයේ ශිෂ්ටාචාරයක් හා සංස්කෘතියක් පකිස්ථානයට උරුමව පවතී. ක්‍රි.පූ. අර්ධ දෙවෙනි හා තුන්වෙනි සහස්‍රක මධ්‍යයේ පටන් ලෝකයේ පැවැති සමකාලීන ශිෂ්ටාචාර අතරින් ඉතා ප්‍රසිද්ධියක් දරූ ඉන්දු නිම්නයේ හරප්පා ශිෂ්ටාචාරය අසහාය ලෙස වැජඹිණි. එම ශිෂ්ටාචාරයේ පිරිහීමත් සමග ප්‍රාදේශීය ශිෂ්ටාචාර නැගී සිටින්ට විය. ඒ අතරින් ගන්ධාර නමැති ප්‍රදේශයෙන් බලවත් ශිෂ්ටාචාරයක් බිහිවිය ක්‍රි.පූ. 1 වෙනි සහස්‍රකයේ ක්‍රි.ව. 7 වෙනි ශත වර්ෂය දක්වා පකිස්ථානයේ ඊසාන දිග ප්‍රදේශය තුළ එය ව්‍යාප්ත විය.

සාමාන්‍යයෙන් ගන්ධාර නමැති ප්‍රදේශයට ගැණෙනුයේ පකිස්ථානයේ වයඹ දිග ප්‍රදේශයේ බොහෝ කොටස් හා නැගෙනහිර ඇෆ්ගනිස්ථානයයි. ආදි යුගයේදී තක්ෂිලා ඇතුළුව කාබුල් හා ඉන්දු ගංගා සන්ධිස්ථානයේ ආරම්භයේ සිට ප්‍රදේශය 'වරණ' යන නමින් ව්‍යවහාර කෙරුණි. එය ගන්ධාරය බවට ක්‍රමයෙන් පරිවර්තනය වූයේ කෙසේ දැයි පුරා විද්‍යා කරුණු හෝ වෙනත් කරුණු වලින් පැහැදිලි නොවේ. සමහර විටෙක එම ප්‍රදේශය යම්කිසි කාලසීමාවක් සඳහා රජකළ ගන්ධාර නමැති රජෙකුගේ නමින් හඳුන්වා ඇති බවට අපැහැදිලි කරුණු ඉදිරිපත්වේ. 'පුරාණ' පවසන්නේ මුන්ධාට නමැති අයෙකු විසින් ඔහු පරාජය කරන ලද බවයි බවයි.

ක්‍රි.පූ . 558-28 දක්වා කාලයේ මහා සයිරස්ගේ ආකිමිනියන් අධිරාජ්‍යයේ, ගන්ධාර නමැති ප්‍රදේශය, කොටසක්ව පැවැති බව ඉතිහාසගත කරුණු අනුව පෙනේ. ඩේරියස්ගේ බිසුටුන් ශිලා ලිපියට අනුව (ක්‍රි.පූ : 516) දී ගන්ධාර සහ එහි වෙන්වීමක් ගැන සඳහන්වන අතර, එය ඉන්දියාවෙන් වෙන්වූ වෙනම රාජ්‍යයක් වශයෙන් පැවැති බව පෙනේ. එය අකිමීනියන් අධිරාජ්‍ය අණසකට යටත් වූවකි.





ගන්ධාරයේ සිතියම - පකිස්තානය හා අවට රටවල්

මේ කාලයේදී (ක්‍රි.පූ. 519) අධිරාජ්‍යයේ පාලන ප්‍රදේශ 22ට මෙම ප්‍රදේශයද ඇතුළත් කිරීම නිසා එහි තිබූ ස්වෛරී භාවය තාවකාලිකව ඉවත් කරන ලදී. කෙසේ වෙතත් ඉරාණය හා මධ්‍යම ආසියාව සමඟ තිබූ වූල් වෙළඳාම මෙන්ම මාර්ග සම්බන්ධය ප්‍රධාන කර්තව්‍ය වශයෙන් පවත්වාගෙන යන ලදී. ලේඛන වාර්තා නොමැති වූවත් ක්‍රි.පූ: 327 ග්‍රීක සතුවේදී මහා ඇලෙක්සැන්ඩර් විසින් ගන්ධාරය ආක්‍රමණය කරනතුරු මෙය පළමුවෙනි මහා පර්සියන් අධිරාජ්‍ය සතුව පැවැති බව අනුමාන කළ හැකිය.




සමහර උගතුන්ගේ අදහසට අනුව ගන්ධාර යන නාමය පළමුවෙන්ම හමුවන්නේ ඍග්වේද සමයෙහිය. ක්‍රි. පූ : දෙවෙනි සහස්‍රකය දක්වා දිවෙන එය පැරණි ඉන්දීය ගාථා සංග්‍රහයකි. මෙම ප්‍රදේශය සාමාන්‍ය වශයෙන් හැඳින්විය හැක්කේ දකුණු ආසියාවේ වයඹ දිග ප්‍රදේශය වශයෙනි. එය නැගෙනහිර පකිස්ථානයේ තක්ෂිලාවේ සිට බටහිරින් ඇෆ්ගනිස්ථානයේ ජලාලාබාද් දක්වා වේ. ආකිමිනියන්, හෙලනිස්ටික් හා රෝමානු කාලසීමාවල බිහිවූ ග්‍රන්ථ අනුව ඉහත සඳහන් ප්‍රදේශයේ ගන්ධාරය පිහිටා තිබූ බව පිළිගෙන ඇත. මෙම අපැහැදිලි සීමා නිර්ණයට හේතුවී ඇත්තේ ප්‍රමාණවත් නොවන සේම ස්ථිරසාර සීමා නිර්ණයන් නොමැති කමයි.

පැහැදිලි සීමාවන් දැක්වීමට නොහැකි වීමට තවත් හේතුවක් වී ඇත්තේ මේ සැම ශතවර්ෂයකම සීමාවන් වෙනස් කිරීමයි. ක්‍රි.ව. 7 වන ශත වර්ෂයේදී පැමිණි චීන වන්දනා කරු හියුංත් සාන් ගේ විස්තර වල නිවැරදි සීමා පිළිබඳ තොරතුරු දක්නට ලැබේ. වර්තමාන පෙෂවෝර් නිම්නය, උතුරින් කඳුකර දිස්ත්‍රික්ක වන සවට් සහ බර්නර්, නැගෙනහිරින් ඉන්දු ගංගාව දක්වාද ප්‍රදේශයට ඔහු ගන්ධාර නමැති රාජ්‍යය වශයෙන් සඳහන්කර ඇත. ඉහත සඳහන් සීමාවන් තුළ ඩර් සහ බජවුර් යන ප්‍රදේශ ගන්ධාර භූමියේ අරය වශයෙන් පිහිටියත් සමහර විද්වතුන් එම ප්‍රදේශ වෙනත් ඒකකයක් වශයෙන් පෙන්වාදීමට උත්සාහ දරා ඇත්තේ ඊට යාව ඇති ගිනිකොණ දිගින් පිහිටි දිස්ත්‍රික්ක යා කරමිනි. තක්සලාව ඉන් එකකි.




ක්‍රි.පූ. 5 වන ශතවර්ෂයේ සිටි ග්‍රීක ඉතිහාසඥයෙකු වන හෙරෝඩෝටස්, ගන්ධාරය ඉතා ධනවත් රටක් වශයෙන් සඳහන් කර ඇත. තවදුරටත් ඔහු සඳහන්කර ඇත්තේ පර්සියානු ක්සර්සයි රජුට, ග්‍රීක්වරුන්ට විරුද්ධ යුද්ධයේදී හේවායින් සැපයූ බවත්ය. කෙසේ වෙතත් ඒ කාලය වනවිට ගන්ධාරය පර්සියානු සහ දකුණු ආසියානු වේද සම්ප්‍රදායයෙ උණුදිය හැලියක් බවට පත්වී තිබුණි. තක්ෂිලාව එහි ප්‍රධාන නගරය බවට පත්ව තිබූ අතර එය උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රධාන ස්ථානයක් බවටද පත්ව තිබුණි.

ක්‍රි.පූ : 327-26 මහා ඇලෙක්සන්ඩර් විසින් ගන්ධාරය අල්ලාගැනීමෙන් පසු ප්‍රදේශයේ සබඳතා ග්‍රීසියන් සමඟ පැවැත්වීමට ආරම්භ විනි. ස්වට් හි ඔරා, පුරකලාවති, වර්තමානයේ චර්සද්දා සහ හන්ඩ් අවට ප්‍රදේශයන් ග්‍රීක අධිරාජයා විසින් අත්පත් කර ගන්නා ලදී.




*Kapilavastu and other places*

කපිල වස්තු සහ අනිකුත් ස්ථාන


ඔහු තක්ෂිලාවේ මාසයක් වාසයකළ බව ප්‍රකාශිතයි. හයිඩස්පස් ගඟ (වර්තමානයේ ජේලුම් ගඟ) අසබඩදී ඉන්දියාවේ පෝරස් රජ සමඟ ක්‍රි.පූ : 325 වර්ෂයේ පැවැති ප්‍රසිද්ධ අවසාන සටනින් පසු දකුණු ආසියාතු උප මහා දීපයෙන් පලවා හරින ලදී. වර්ෂ දෙකකට පසු ක්‍රි.පූ. 323 දී ඔහුගේ මරණය නිසා ඉතා බලවත් ලෙස මෞර්ය අධිරාජ්‍යය දුබල තාවකට පත්වූ ස්වදේශික පාලකයා වන චන්ද්‍රගුප්ත මෞර්ය විසින් අධිරාජ්‍යයාගේ ප්‍රාදේශීය පාලකයා වන සෙලුකස් නිකාටර්ට විරුද්ධව ඇතිකරන ලද සාක්ෂික කැරැල්ල නිසා හිනුදුකුස් වලට දකුණෙන් පිහිටි ඉන්දීය භූමියට ඇති හිමිකම් අතහැරීමට සිදුවීමේ හේතුව නිසා පාලන මෞර්ය පෙලපත බිහිවීමට ඉවහල් විය. මෙම කොටසේ ඇලෙක්සැන්ඩර් සහ ඔහුගේ දුර්වල ග්‍රීක් පාලකයින්ගේ ක්‍රියාකාරී කාලසීමාව ඉතා කෙටි එකක් විය. මේ වනවිට ග්‍රීක සමාජීය හා සංස්කෘතික විධි ප්‍රාදේශීය සමාජය තුළට තදින් කාවැදී තිබුණි. කෙසේ වෙතත් රෝලන්ඩ්ට අනුව උතුරු ඉන්දියාවේ ඇලෙක්සැන්ඩර් විසින් කරන ලද වටලෑම් ප්‍රමාණයට වඩා වැඩියෙන් පෙන්නුම් කර ඇත. මෙය ගන්ධාර ප්‍රදේශයට සහ එහි කලා පිළිබඳව විමසීමේදී සත්‍යයක් බව පෙනේ. ඊසාන දිග ඉන්දියාවේ ගංගානම් ගඟ අසබඩ පාඨලිපුත්‍ර (පසුව පැට්නා නමින් හැඳින් විය) නමැති මෞර්ය වංශික ප්‍රධාන නගරය බිහිවීම නිසා උතුරෙන් පර්සියාව හා ග්‍රීසිය දක්වා ප්‍රධාන වෙළඳ මාර්ගයක් බිහිවිය. ක්‍රි.පූ. 3 වන ශතවර්ෂයේදී බෞද්ධාගම වැළඳගත් මෞර්ය වංශික රජුවන අශෝක, කිසියම් කාලසීමාවක් සඳහා ගන්ධාරයේ පාලකයා වශයෙන් කටයුතු කළේය. ඔහුගේ පාලන කාලසීමාවේදී මෙම ප්‍රදේශය බෞද්ධ භූමියක් බවට පරිවර්තනය කරන ලදී. (පළමු ථෙරවාද බෞද්ධාගමට පටහැනිව) මහායාන බෞද්ධාගම මෙහි හිස එසවීමට මෙය ඉවහල්වූ බව පෙනේ. ගන්ධාරයේ බෞද්ධ නීතිය පිළිබඳ ප්‍රකාශනයට අදාළ කාලසීමාව අශෝකගේ මාදන් දිස්ත්‍රික්කයේ (ගල්) සෙල් ලිපියෙන් මනාව පැහැදිලිවේ. මෙම දිස්ත්‍රික් දෙකම වයඹ පළාත් දේශසීමාවෙහි පිහිටා ඇත. ක්‍රි.පූ. 232 දී අශෝකගේ මරණයත් සමඟ මෞර්ය අධිරාජ්‍යයේ ක්‍රමානුකූල ඇදවැටීමේ හේතුවෙන් මෙම ප්‍රදේශය විදේශීය ආක්‍රමයන්ට භාජන වුනි.

චන්ද්‍රගුප්ත මෞර්යයගේ බල පරාක්‍රමයන්ට, ඇලෙක්සන්ඩර් ගෙන් පසු බලයට පත්වූ සෙලූකස් නිකටර් හට මුහුණදිය නොහැකිව හින්දුකුස් වලටත් එහා දක්වා පසුබැමේ හේතුව නිසා හෙලනිස්ටික් බලය පැරැණි නගරයක්වන බැක්ට්‍රියා හි ඒකාබද්ධව රඳවා තබාගැනීමට ඉවහල් විය. මෙම පසුබැසීම වර්තමාන ඇෆ්ගනිස්ථානයේ නගරයක්වන බාක්ත් අවට භූමියකි.

3 වන ශත වර්ෂයේ මැදභාගයේදී සෙලූසිඩ්ගේ බලවත් අධිරාජ්‍යය කොටස්වලට කැඩී වෙන්විය. ඉරානය පාතියන්ස් නමැති අයෙකු විසින් වෙන්කරගන්නා ලද අතර ග්‍රීක් කුමාරයෙකු වන ඩියෝඩොටස් විසින් බැක්ට්‍රියාවේ නිදහස ප්‍රකාශ කරන ලදී. බැක්ට්‍රියන් ප්‍රදේශය පොලනිස්ටික් පාලන ප්‍රදේශයෙන් සම්පූර්ණයෙන් වෙන්ව තිබුණත් හෙලන්ස්ටික් සමඟ සංස්කෘතික ගති පැවතුම් පවත්වාගෙන ගිය බැව් පැහැදිලිවේ. රොලන්ගේ අදහසට අනුව එහි පාලකයින් හමුදාමය පාලනයක් ගෙනගියත් මෙම තනිවූ නැගෙනහිර ග්‍රීක ජනපදය ආසියාවේ හෙලන්ස්ටික් කලාවන් හා අදහස් ස්ථාපනය කළ අතර විශිෂ්ට මුදල් සම්භාරයක්ද මුද්‍රණය කරන ලදී.

ගන්ධාරය ඇතුළුව කාබුල් මිටියාවත ඩියෝඩොටස්ගේ මුණුබුරා වන ඩිමිට්‍රියස් විසින් ක්‍රි.පූ 190 දී නැවත අල්ලා ගන්නා ලදී. කෙසේ වෙතත් ග්‍රීක පෙලපතේ පාලකයා වන ඉයුක්‍රටයිස් විසින් ගන්ධාර හා බැර්ටියාවේ භූමි ප්‍රදේශ ඩිමිට්‍රියස්ගේ උරුමකරුවන්ට නොපමාව අහිමිකරන ලදී. මෙම කාලසීමාවත් සමගම ග්‍රීක් කුමාරවරුන් කිහිප දෙනෙකුගේ නම් සඳහන්වී ඇතත් ඔවුන්ගේ පාලනය ඉතාකෙටි කාලසීමාවකට සීමා වී තිබුණි. ඉතිහාසයට අනුව ක්‍රි.පූ. 135 වන අවට කාලයේදී මෙම භූමිය ඔවුන්ට අහිමිවූ අතර ආක්‍රමික කණ්ඩායමක් වන සකාස් වරුන්ට එය හිමි විය. ඔවුන්ගේ උත්පත්තිය පිණිසත් වූ අතර ක්‍රි.පූ. පළමුවන ශතවර්ෂය අවට කාලයේදී පර්තියන් වරුන් නැගෙනහිර හා බටහිර ඇෆ්ගනිස්ථානයෙන් පලවාහරින ලදී සකා පාලකයින්ගෙන් කෙනෙකු වන මාවුස් හෝ මෝගා දකුණු ආසියාතු උප මහාද්වීපයේ වයඹදිග ප්‍රදේශය, කයිබර් ගිරිදුර්ගයේ නැගෙනහිර ප්‍රදේශය ක්‍රි.පූ. 90 අවටදී අල්ලාගැනීම නිසා ග්‍රීක අධිරාජ්‍යය කාබුල් මිටියාවතට පමණක් සීමා කරන ලදී.

සිතියන් වර්ගයාගේ තවත් කොටසක් වන යුචි එචි වර්ගයා විසින්, සකාස් වරුන්, ක්‍රි.පූ. පළමුවන ශතවර්ෂයේ අගභාගය අවටදී පළවා හරින ලදී. මෙම වර්ගය චීන පැවැත්මෙන් එන අය වන අතර දකුණු ආසියාතු ඉතිහාසඥයින් හට ඔවුන් කුෂාන් වරුවෙති. සංචාරක සකාස්වරුන් පලවා හරිමින් ඔවුහු ගන්ධාරයෙහි පදිංචි වූහ. කුෂාන් අධිරාජ්‍යයේ මුල්ම අධිරාජ්‍ය වරුන් දෙපලක් වන හෙරොයිස් සහ කුජුල කඩ්පීසස් කුෂාන් භූමියේ ප්‍රදේශ වැඩියෙන් අල්ලාගත් අතර, ඔහුගේ පුතාවන් විමා කඩ්පීසස් විසින් ක්‍රි.ව. 99 දී තක්ෂිලාව අල්ලාගන්නා ලදී. තක්ෂිලා නගරය ඉවත්කර දකුණු ආසියාතික උප මහාද්වීපයේ ඊසාන දිගින් පිහිටි කුෂාන් අවසාන වරට බිහිකිරීම සිදුවූයේ ක්‍රි.ව. 64 දී බව සාමාන්‍ය පිළිගැනීමයි. කුජුලා කඩ්පීසස් ප්‍රසිද්ධියක් දරන්නේ ප්‍රදේශයේ ශක්තිමත් පාලනයක් පවත්වා ගැනීම සඳහා පමණක් නොව ඔගස්ටස්හි රෝමානු අධිරාජ්‍ය සමඟ සහායෝගිතාවක්ද පවත්වාගෙන ගිය බවය.


බුදුන්ගේ හිටගත් ප්‍රතිමාව

කෙසේ වෙතත් කුෂාන් පාලකයින්ගෙන් වඩාත්ම ප්‍රසිද්ධියට පත්වූයේ විමාගේ පුතු කණිෂ්කයා. බටහිරින් මාස සිට නැගෙනහිරින් කෝටාන් දක්වාත් කොරොස් මියා හා සොග්ඩියා ඇතුළු උතුරින් අරල් මුහුදේ වෙරළ දක්වාත් ඔහුගේ අධිරාජ්‍ය විශාල බිම් ප්‍රදේශයක් පුරා පැවැතිණි. දකුණු දෙසට වර්තමානයේ ඇෆ්ගනිස්ථානය, සම්පූර්ණ ඉන්දු නිම්නය, දකුණු කෙළවරේ මුදුනත හැර දකුණු ආසියාතු අර්ධද්වීපයේ සියලුම කොටස්, නැගෙනහිර

මුහුදු තීරයට සමාන්තරව පිහිටි භූමි භාගයද වේ. ඔහුට පළමුව සිටි අශෝක මෙන් කණිෂ්කද බුදු දහම වැළඳගත් අයෙක් විය. ඔහුගේ රාජධානියේ අස්සක් මුල්ලක් හැර ගොඩනඟා ඇති බෞද්ධ ආරාම, සත්‍ය, බුදුන්ගේ හෝ බුද්ධ ශ්‍රාවකයින්ගේ ධාතු නිදන්කර ගොඩනඟා ඇති සත්‍ය වැනි ගොඩනැගිලි ඉහත සඳහන් ආගම පිළිගත් අයෙකු බවට ඇති ප්‍රධාන සාධක වේ.

කණිෂ්කගේ නියම පාලන කාලය පිළිබඳ විවිධ මතයන් උගත් ලෝකයේ උගතුන් අතර පවතී. ක්‍රි.ව. 128 සිට 144 දක්වා කාලය, ඔහුගේ පාලනය පිළිබඳ, මූලික අවධිය වශයෙන් ගනන් ගත හැකිබව සමහරුන්ගේ මතයයි. කෙසේ වෙතත් ක්‍රි.ව. 78 සිට 110 දක්වා කාලය සිංහාසනාරූඪවූ කාලය වශයෙන් ගිනිය හැකි බවට සාක්ෂි ඇත. මෙම කාලසීමාවේදී ගන්ධාරයේ බෞද්ධ කලාව ඉතා දියුණු තත්වයකට පත්ව තිබූ නිසා ඔහු උත්තම පාලකයා වශයෙන් සලකන ලදී. කුෂ්කන් රජ පෙලපත වර්ෂ 150ක පමණ කාලයක් තුළ වැජඹිණ. ක්‍රි.ව. 241 දී ඉරානයේ 1 වෙනි ෂපූර්, ගන්ධාරය ආක්‍රමණය කර කණිෂ්ක රජපෙළ අන්තිමයා වන වාසුදේවගේ පාලන තන්ත්‍රය අවසන් කරන ලදී. ක්‍රි.ව. 390 සිට 5 වන ශතවර්ෂය දක්වා ගන්ධාරයේ කුෂාන් පෙලපත පවත්වාගෙන යන ලදී.
විශේෂයෙන් කණිෂ්කගේ කාල සීමාවේදී ගන්ධාර චිත්‍ර කලාව නමින් බෞද්ධ චිත්‍ර කලාවක් මෙම ප්‍රදේශයේ බිහිවිය. ග්‍රීක් දෙවියන් වන ඇපලෝ සහ පර්සියානු හිරුමඩල හෝ ප්‍රභා මණ්ඩලයට සමකරමින් හෙලනිස්ටික් සහ ඉන්දියානු බලපෑම් මත පළමුවන වතාවට බුදුරජුන් මනුෂ්‍ය ස්වරූපයෙන් ඉදිරිපත් කරනු ලැබීය. ගන්ධාර ප්‍රදේශයට බුදුරජුන් කිසිදිනෙක නොපැමිණියත් කුෂාන් බෞද්ධ යතිවරයන් විසින් ලියන ලද කෘති වලින් එම ප්‍රදේශය බෞද්ධ ශුද්ධ භූමියක් ලෙස හඳුන්වා දී ඇත්තේ පෙර ආත්ම භවයේදී ශාක්‍යමුනි හෝ බුදුන්ගේ යම් යම් සිද්ධීන්වලට අදාළ ප්‍රදේශ ඇසුරුකර ගනිමිනි. කුෂාන් වරුන්ගේ අනුග්‍රහය යටතේ ගන්ධාරය බෞද්ධාගමේ මධ්‍යස්ථානයක් බවට පත්කරන ලද අතර බොහෝ කලක් යනතුරු දකුණු ආසියානු උපමහාද්වීපයේ මෙන්ම චීනයෙනුත් බෞද්ධ වන්දනාකරුවෝ එහි පැමිණීමට පටන්ගත්හ.

ගන්ධාරය විශිෂ්ටතම සෞභාග්‍ය කාලසීමාවකට එළඹියේ කුෂාන් අධිරාජ්‍ය වරුන්ගේ කාලසීමාවේදීයි. එසේම මෙම කාලසීමාව ප්‍රතිමා නෙලීමේ ශිල්පය පිළිබඳ ඉතාම දියුණු කලාවක් තිබූ කාලයක් ලෙසද සලකනු ලැබේ. මේ කාලයේ ගන්ධාරයේ තිබූ ගෘහ නිර්මාණ ශිල්පයද එකල තිබූ සිත් ඇදගන්නා සුළු කලාව බවට පත්ව තිබිණි

කුෂාන් වරුන්ගේ බලය සමග විස්මය ජනක කලාව හා සංස්කෘතිය නිසා තැනින් තැන යන එප්කාලිප්ටිස් නොහොත් සුදු හැන්ස් වරුන් අතින් මාරාන්තික පහරක් දෙමින් ගන්ධාරය හා පන්ජාබය ආක්‍රමණය කරන ලද්දේ පස්වන ශතවර්ෂයේ තුන්වන කාර්තුවේදීය. ඔවුන් යන සෑම තැනකම විනාශ කිරීම හා නැතිභංග කිරීම ඔවුන්ගේ ගතියකි. ආක්‍රමණය කිරීමේ දිනය ක්‍රි.ව. 460 වශයෙන් ගණන් බලා ඇත්තේ චීන වන්දනාකරු වන සැංයුං විසින් කරන ලද විස්තර අනුවය. ඔහු මෙම ප්‍රදේශයට පැමිණ ඇත්තේ ක්‍රි.ව. 520 අවට කාලයේ දීය. මෙම දිනය පුරාවිද්‍යාත්මකව ස්ථිර කර ගැනීමට හැකිවී ඇත්තේ තක්ෂිලාවේ ගින්නට හසුව ගොඩගන්නා ලද ගංගාරාමයන් ගෙන් ලැබුණු තොරතුරු අනුවයි.

ගන්ධාරයේ පසුකල ඉතිහාසය සඳහා ඉතිහාසඥයින්ට සම්පූර්ණයෙන්ම චීන වන්දනාකරුවන් මත යැපෙන්නට සිදුවිය. මෙම ප්‍රදේශයට ඔවුන්ගේ පූජනීය ගමන් බිමන් ඇරඹීම ලේඛන ගතකර ඇත. ක්‍රි.ව. 5 වැනි ශතවර්ෂය වැනි ආදි කාලයක පටන් ඒවා සිදුකර ඇති බව පෙනේ. ඔවුන්ගෙන් පළමු වැන්නා වන පාහියම් පෙෂවෝර් නිම්නයට පැමිණ ඇත්තේ ක්‍රි.ව. 400 පසුවනවාත් සමගය. කණිෂ්කගේ ආරම්භයෙන් පසු පැවතෙන්නන් සමාධිමත්ව බවත් හොඳත් ආරක්ෂා කළබවත් ඔහු පවසයි. ඉහතින් සඳහන් කළ පරිදි අනෙක් චීන වන්දනාකරු සංයුං ය. ඔහු ගන්ධාරයට පැමිණියේ එම ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ඉප්කාලිටිස් නොහොත් සුදු හැන්ස් වරුන් විසින් විනාශකර දමමින්, සංඝාවාස ගිනි තබමින් හා මිනිසුන් ඝාතනය කරමින් බෞද්ධාගම සම්පූර්ණයෙන් විනාශකර දැමූ කාලයකට පසුවය.

අවසාන චීන වන්දනාකරු සුවං සෑන්, ශතවර්ෂයකට පසුව දකුණු ආසියාවේ උප මහාද්වීපයේ වයඹ දිග කොටසට පැමිණි පසු ඔහු දුක්කේ රට අභාවයට පත්වන තත්ත්වයක තිබූ බවයි. බොහෝදුරට මනුෂ්‍ය වාසයකින් තොර හා බෞද්ධ ආයතන සම්පූර්ණ පරිහානියකට පත්ව තිබූ බවයි. සුදු හැන්ස් වරුන්ගේ ආක්‍රමණයෙන් ශතවර්ෂ දෙකකට පසු හුවං සන්ග් වැරැදි ලෙස පවසන්නේ බෞද්ධ ආරාම විනාශ කරන ලද්දේ මිහිර්ගුල නමැත්තෙකු විසින් බවයි. ඔහුගේ නම වටා බොහෝ කෲර, වනචාරී සහ වදහිංසා පැමිණවීම ගැන කරුණු දූනටමත් සොයාගෙන ඇත. කලකදී ඉතාමත් නවීන හා අලංකාර ගන්ධාර කලා ශිල්ප නැවත කිසිදිනෙකත් ඇති නොවන සේ සම්පූර්ණයෙන්ම වැනසී ඇත. 7 වන හෝ සමහර විටෙක 8 වන ශතවර්ෂය පමණ වනතුරු මෙම කලා ක්‍රමය තරමක් දුරට හෝ කාශ්මීරයේ සහ ඇෆ්ගනිස්ථානයේ පැවැති බවට සටහන් වී ඇත.

වැනසුණු නගර හා ආගමික සිද්ධස්ථාන අතහැර යාම හා ප්‍රයෝජනයක් නොගැනීම නිසා ශතවර්ෂ ගණනාවක් යනවිට ඒවා පොළොවේ ටොන් ගණනින් පස්කඳු බවට පත්විය. 12 වන ශත වර්ෂයේදී පුරා විද්‍යාඥයින්ගේ ඉස්කෝප්පයට පිංසිදුවන්නට මෙම ස්ථාන පොළව යටින් මතු පිටට ගෙන ඒමින් ඒවා පැරැණි වටිනා වස්තූන් බවට පත්කරන ලදී.

පරිච්ඡේදය 2


# බුදුරදුන්ගේ ජීවිතය




බුදුරජාණන් වහන්සේ දකුණු ආසියාවේ සිටි ඉමහත් දාර්ශනිකයෙකු මෙන්ම බෞද්ධාගම සොයාගත් අයද වේ. එතුමා වර්තමාන කාලයේ නේපාලයේ දකුණු මායිමේ ටෙරායි පළාතේ පිහිටි ශාක්‍ය රාජධානියේ කපිලවස්තු නොහොත් කපිලවස්ත්තු නමැති ස්ථානයේදී ක්‍රි.පූ 563 හෝ 488 උපත ලැබීය. එතුමා ශුද්ධෝදන රජතුමාගේත් මහාමායා දේවියගේත් පුතුණුවන් වන අතර රජගුර හා පාලක පක්‍ෂයක් වන ක්‍ෂත්‍රිය වංශයට අයත්වේ. එතුමාගේ පෞද්ගලික නම සිද්ධාර්ථ විය. (කැමැත්තෙන් ඉටුකරන) ජීවිතයේ පසුකාලයේදී එතුමා ශාක්‍යමුනි (ශාක්‍යයන්ගේ ඥානවන්තයා) වශයෙන් ද හඳුන්වන ලදී. එතුමාගේ පොදු ව්‍යවහාරික නම වූයේ ගෞතම බුද්ධය. එය පවුලේ නමක්වන ගෞතම (වෛදික සමයේ ඉතා පැරණි රිස්හිස් හෝ සියර්ස් යන පවුල් වලින් එකක් විය.)

බුද්ධ යන නාමයෙන් සඳහන් වූයේ අවබෝධය ලබාගත් තැනැත්තා යනුවෙනි.' මීට අමතරව බෝධි සත්ව යන නමිනුත් තථාගත හා මෛත්‍රිය (අනාගත බුද්ධ) යනුවෙන්ද හැඳින්වුණි.

බුදුරජාණන් වහන්සේගේ ඓතිහාසික ජීවිතය ගැන ලැබී ඇති සටහන් බොහෝවිට මිථ්‍යා මත හා පුරාවෘත්ත මුල් කරගෙන ලියවී ඇති ඒවායි : හේතුව මේවා ලියවී ඇත්තේ එතුමාගේ පිරිනිවන් පෑමට බොහෝ කලකට පසු එතුමා අනුගමනය කළ විඥාන වාදීන් විසිනි. ඒ හේතුව නිසා ඉතිහාසගත වීමට අවශ්‍යව තිබූ බොහෝ සත්‍ය කරුණු ගිලිහී ඇත. එමනිසා දත් එකකින් තවත් එකක් බේරා සත්‍ය කුමක්දැයි පැහැදිලි කර දක්වීමට අපහසුව ඇත.



කපිලවස්තු නගරය

එතුමාගේ ජීවිත කථාව පටන්ගන්නේ මෑණියන් වන මහාමායා දේවිය රාත්‍රියේ නිදාසිටියදී ලක්ෂණ සුදු අලියෙකු ඇගේ කුසයේ එක් අංශයකින් ගර්භාෂයට ඇතුළු වනවා දකීමෙනි. බ්‍රාහ්මණයින්, හින්දු පූජකයින් එම සිහිනය විග්‍රහකර ඇත්තේ මැයට උපදින්නේ පුතකු බවත් ඔහු මුළු ලෝකයටම අධිපති පාලකයෙක් හෝ බුදුවරයෙක් වන බවයි. පවත්නා තොරතුරු අනුව පිළිසිඳ ගැණීමෙන් මාස 10ක් ගිය තැන, අග බිසව දේවදහ පිහිටි ඇගේ දෙමව්පියන් වෙත යාමට තීරණය කළ බවයි. සියල්ල සූදානම් කිරීමෙන් පසු ඇගේ සහපිරිවර සමඟ රන් දෝලාවකින් ඇය ගමන ආරම්භ කළාය. නගර දෙවයේම මහජනයාට අයිති ලුම්බිණි නම් සල් උයනක් අතර මග හමු විය. විසාක (මැයි) මාසයේ පුන්පොහෝ දා මෙම ස්ථානයේදී තිරයකින් වටකරන ලද ඇය බුදුන්ට උත්පත්තිය ලබා දුනි. වර්තමානයේදී රුම්න්දේයි නමින් හඳුන්වන එතුමා උපන් ස්ථානයයි.

එය නේපාලයේ දකුණු දිග මායිමේ පිහිටා ඇත. මෙම අවස්ථාව සිහිවීම පිණිස අශෝක මහාධිරාජයා විසින් පිහිටුවන ලද එම ස්මාරකය අදටත් පවතින අතර ලෝකයේ සියලුම ප්‍රදේශ වලින් බෞද්ධයෝ මෙය නැරඹීමට පැමිණෙති.

දැනට පවතින සාධක අනුව බුදුරදුන් පැහැදිලිවම ස්ව කැමැත්තෙන් කල්පනාකාරීව භාවනාවේ යෙදී සිටිබව පෙනේ. එතුමාගේ පියාණන් ඇත්ත වශයෙන්ම මෙම ක්‍රමය ගැන අපැහැදීමට හේතුවූයේ සෙන්පතියෙකු හා පාලකයෙකු වීම මිසක් දාර්ශනිකයෙකු හෝ ආගමික නායකයෙකු වනවා දැකීමට ඔහුගේ තිබූ අකමැත්ත නිසයි. බ්‍රාහ්මණයින් විසින් කියන ලද අනාවැකිවලට අනුව රජතුමා නිතරම කනස්සල්ලෙන් පසුවූයේ ඔහුගේ පුතා රජමාලිගාව හැරදමා බුද්ධත්වය ලබාගැනීම පිණිස තැනින් තැන ඇවිදිනු ඇතිය කියා. පියාගේ අදහසට අනුව තරුණ කුමරා සුඛෝපභෝගී ජීවිතයක ඇති දැඩි කළ අතර, සිද්ධාර්ථ තරුණ කුමරා වයස 16 දී විවාහ දිවියකට ඇතුළත් කළේ ඔහුගේ නෑනා වන 16 වන වියේ පසුවූ යශෝධරා කුමරිය සමගයි. රාජකීය ජීවිතේ සියලුම ලෞකික ක්‍රියාකාරකම් වල නිරත වූවත්, ඔහුගේ සිත බැඳී තිබුණේ වෙනත් ආකාරයක වෙනත් දේවල් කෙරෙහිය. මේ හේතුව නිසා අනිවාර්යයෙන්ම ඔහුට මාලිගාව හැරදා බුද්ධත්වය ලබාගැනීම පිණිස තැනින් තැන ඇවිදීමට සිදුවිය.

සාම්ප්‍රදායානුකූලව එක් දවසකදී ඔහුට වයසක මිනිසෙක්ද, ලෙඩවූ අයෙක් හා මළමිනියක් හමුවිය. එවිට ඔහුට එක්වරම තරයේ හැඟීගියේ මනුෂ්‍ය වර්ගයාට පොදු වශයෙන් ඇත්තේ විඳවීම බවයි.




මහමායා දේවියගේ සිහිනය

29 වන වසරේදී ඔහු ඇවිදින අවස්ථාවලදී ශාන්ත දාන්ත බවින් හා නිශ්චල බවින් යුත් ශ්‍රමණධාරියෙකු හමුවිය. ඉන්පසු ඔහු විසින් සියලු ලෞකික ආශාවන්, ධනය හා පවුල හැරදා සත්‍යය සෙවීමේ අදිටනින් පැවිදි ජීවිතයක් ඇරඹීමට අදිටන් කරගන්නා ලදී. බෞද්ධ ධර්මයට අනුව මෙම තීරණය මහාභිනිෂ්ක්‍රමණය වශයෙන් හඳුන්වන ලදී. මෙය බෞද්ධයන් විසින් බුදුරදුන්ගේ පමණක් නොව ලෝක ඉතිහාසයේද වෙනස්වූ මොහොතක් වශයෙන් සලකන ලදී.

උතුරු ඉන්දියාවේ ඔහු විසින් කරන ලද සැරිසැරීම් වලදී බුදුරදුන් විසින් පළමුව කරණ ලද්දේ හින්දු ධර්මය පිළිබඳ සොයා බැලීමයි. හින්දු කුලගෝත්‍ර ක්‍රමය පිළිකුල් සහගත බවින් යුතුවූ නිසා තවුස් බලය සම්පූර්ණයෙන්ම අසාර්ථක එකක් වී ඇති බව අවබෝධ වූ හෙයින් ඒ පිළිබඳ වෙන්නට ගිය මුලාවෙන් මිදීමට හැකිවිය. සත්‍ය සෙවීමේ චාරිකාව එතුමා විසින් තව දුරටත් පවත්වාගෙන යන ලදී. මේ කාලයේදී ඔහු පලමුව ආගමනය කළ නිසා, ඔහුගේ අනුගාමිකයන් පස්දෙනා අහිමි කරගන්නා ලදී.

වර්තමානයේ ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ බුද්ධගයා නමින් හඳුන්වන ගයා අසබඩ බෝ ගසක් යට භාවනා කරමින් සිටියදී එතුමා ක්‍රි. පූ. 528 දී පමණ බුද්ධත්වයට නොහොත් මහාගයාන් බවට පත්විය. මෙය සියළුම දුක්වේදනා වලින් මිදීමට ඇති මාර්ගය බව එතුමාට අවබෝධ විය. ඉන්පසු ඉතා කෙටි කාලයක් වර්තමානයේ වාරනාසී නමින් හැඳින්වෙන මුව උද්‍යානයේදී එතුමා ප්‍රථම දේශනාව පවත්වන ලදී. මෙම දේශනය අඩංගු ලියවිල්ල සුරක්ෂිතව තැන්පත්කර ඇත. බෞද්ධ ධර්මයේ හරය එහි අඩංගුවී ඇතැයි විශ්වාස කෙරේ.

යහපත් මගේ 'සත්‍ය මාර්ගයේදී පළමුව ඔහු හැරදාගිය පස්වග මහනුන් බෙනාරස් වලදී නැවත බුදුරදුන් හා එක්විය. එම අය සමඟ එතුමා ගංගානම් ගඟේ මිරීයාවතට ගමන් කලේය. අතර කුලය ගැන තැකීමක් නැතිව, එතුමාගේ ධර්මය දේශනා කිරීම, අනුගාමිකයින් රැස්කිරීම හා සංඝ සමාජ ඇති කිරීමද ඕනෑම අයෙකු විසින් පිළිගන්නා අයුරින් සකස් කරන ලදී. ටික කලකට පසු එතුමාගේ පියාණන්ගේ ඇරැයුම් පරිදි එතුමාගේ උපන් ගමට පැමිණ පියාණන් භාර්යාව සහ පවුලේ අනෙකුත් අය, ඔහුගේ අලුතෙන් බිහිකරන ලද ආගම ධර්මයට හරවන ලදී. 45 අවුරුද්දක් ආගමික කටයුතු වලින් පසු 80 වෙනි අවුරුද්දේදී නේපාලයේ කුෂිනාගර හිදී පිරිනිවන් පෑ සේක. බෞද්ධ කථා අනුව එම සිද්ධිය මහා පරිනිර්වාන වශයෙන් දක්වේ. රාජකීය උපහාර මධ්‍යයේ එතුමාගේ දේහය ආදාහනය කරන ලද අතර එයින් ඉතුරු වූ ධාතු කොටස් 8 කට බෙදා දකුණු ආසියානු උපමහාද්වීපයේ ස්ථාන අටකදී ඉදිවන සෑය වල තැන්පත් කිරීමට වෙන් කරන ලදී.




ලුම්බිණියේ පිහිටා ඇති අසෝකගේ සිහිවටනය




ජපානයෙන් පැමිණි හිමිවරුන් පිරිසක් බුදුරජාණන් වහන්සේගේ උපන් ස්ථානය වූ ලුම්බිණි හි දී

## උන්වහන්සේගේ ඉගැන්වීම්


බුදුරජාණන් වහන්සේ විසින් සිය අනුගාමිකයින්ට උතුම් සූත්‍රය වන චතුරාර්ය සත්‍යය උගන්වන ලදී. මෙය දුක්විඳීම, දුක් ඇතිවීමට හේතු දුක නැති කිරීම හා දුක නැති කිරීමෙ මාර්ගය යනුවෙන් සිව් වැදෑරුම්වේ. ඔහුගේ ඉගැන්වීම් අනුව මෙම මාර්ගය වැටී ඇත්තේ පුරුද්දක් වශයෙන් ඉන්ද්‍රියන් පිනවීමෙ හෝ ස්වයං වින්දනයේ නොවන බවයි. උතුම් වූ අෂ්ඨාංගික මාර්ගය මැදුම් මාවත වශයෙන් එතුමා විසින් උගන්වන ලදී. මෙම මාර්ගය සෑදී ඇත්තේ සත්‍ය දර්ශනය, නිවැරුදි දැක්ම, නිවැරදි කථාව, නිවැරදි පැවත්ම, නිවැරදි දිවිපෙවෙත, නිවැරදි උත්සාහය, නිවැරුදි සිතීම හා නිවැරුදි කල්පනාව යනුවෙනි. එය සම්පූර්ණ නිවන් අවබෝධය ලබාගැනීම මාර්ගය සඳහා ඇස් ඇරවීමක් හා නුවණ යෙදවීමක්ද වේ. එහි නියම අදහස වන්නේ සියලු ආකාරයෙන් ජීවත්වීම සඳහා තෘෂ්ණාව හා ආශාව නැති කිරීමයි. එහි ප්‍රතිඵලය වන්නේ දුක් විඳීම නැති කිරීමයි. එය ඇත්ත වශයෙන්ම නිසල තත්ත්වයකට වඩා වැඩි, සියලු ආශාවන් පිළිබඳ පළපුරුද්දක් ලබා එයින් නිදහස් වූ අයෙකු වැනිය.

මරණ මංචකයෙහි වැතිර සිටිද්දී එතුමන්ගේ ශ්‍රාවක ගෝලයින් හට අන්තිම අවවාදය වශයෙන් ප්‍රකාශ කළේ 'සියලු ද්‍රව්‍යයන් අභාවයට පත්වන සුලුයි. නොපමා ඔබගේ ගැලවීම සඳහා කටයුතු යොදන්න. (අප්‍රමාද)'

මෝක්ෂය ලබාගැනීමට දරන උත්සාහයේදී මූලික වශයෙන් අවශ්‍ය වන්නේ සිල් රැකීම, සදාචාර සම්පන්න වීම, එයින් අදහස් කරන්නේ ප්‍රාණඝාතනයෙන්, සොරකම් කිරීමෙන්, සල්ලාල කමින්, බොරු කීමෙන්, කේලාම් කීමෙන්, සැපවත් ජීවිත ගත කිරීමෙන්, ධනය රැස්කිරීමෙන්, ලේ සෙලවෙන ක්‍රියා කිරීමෙන් හිරු හෝ බ්‍රහ්ම නැමදීමෙන් හා අනෙකුත් නොයෙක් ක්‍රියාකාරකම් වලින් වැළකීමයි. ඊළඟට අවශ්‍ය වන්නේ සිත එක්තැන් කිරීම නොහොත් සමාධිය, තීක්ෂණ බුද්ධිය, නොහොත් ප්‍රඥාවයි. මේවා ප්‍රගුණ කිරීමෙන් අවසාන වශයෙන් බුද්ධිය හෝ සම්බෝධිය හා නිර්වාණය ලබාගැනීමට හැකි වේ.

# බෞද්ධාගමික ධර්ම ග්‍රන්ථ

බුදුරදුන්ගේ පිරිනිවනින් සති කිහිපයකට පසු පළමුවන බෞද්ධ සංගායනාව රාජ්ගිර් වලදී පවත්වන ලද අතර එහි මූලිකත්වය දැරුවේ මහාකාශ්‍යප විසිනි. ධර්මය (ආගමික ධර්මය) හා විනය (සංඝ විනය) සම්පූර්ණ කිරීම පිණිස එහිදී විවිධ සංඝ සමාජ හෝ සංඝයා වහන්සේලා පන්සිය නමක් සහභාගි විය. මෙම සංගායනාවේදී විනය පිටකයට අදාල බලධාරීන් (බඳුන නොහොත් ශ්‍රමය ආචාරීන්ගේ ධර්ම සංග්‍රහය) හා ධර්ම පිටනය (ආගම ධර්මයේ කූඩය) පිළිබඳ බලධාරීන් වූයේ උපාලි හා ආනන්ද ය. බුදුරදුන්ගේ පිරිනිවනින් අවුරුදු සියයකට පසු දෙවෙනි බුද්ධ සංගායනාව පවත්වන ලදී. වෛසාලියේ භික්ෂූන් වහන්සේලා විනය පිටකයට පටහැනි වනයේ



බුදුරජාණන් වහන්සේගේ උපන් ස්ථානය වූ ලුම්බිණි හි දී හිමි නමක් නමස්කාර කරන ඇයුරු


සමහර ක්‍රියාකාරකම්වල යෙදී සිටි හෙයින් මෙම සංගායනාවේදී මෙම කාරණය සාකච්ඡාවට භාජනය කරණ ලදී. කෙසේ වෙතත් වෛසාලියේ භික්ෂූන් වහන්සේලා එම ක්‍රියාකාරකම් අත්හැරීම ප්‍රතික්ෂේප කල නිසා බෞද්ධාගමේ විශාල දෙදරුම්කමක් ඇතිවිය. මුල් අයුරින් ධර්මය පිළිපැදි අය ස්ථවිර නමින් හැඳින්වූ අතර වෙනස්වීම් වල සිටි අය මහාසම්භික වරුන් වශයෙන් ව්‍යවහාරයට එන ලදී. තුන්වන බෞද්ධ මහා සංගායනාව අසෝක අධිරාජයාගේ පාලන කාලයේදී පාඨලීපුත්‍ර හිදී පවත්වන ලදී. ලාංකීය වංශකථා අනුව බුදුරදුන්ගේ පරිනිර්වානයෙන් වර්ෂ 236ක් ගියතැන මොග්ගලී පුත්ත ථෙරගේ මූලිකත්වයෙන් පවත්වන ලදී. එම මණ්ඩලය විසින් බෞද්ධ ග්‍රන්ථ වලට අළුත් සංශෝධනයක් එක්කරන ලද අතර එය අභිධර්ම පිටක නමින් ව්‍යවහාරයට පත්වුනි. (විශේෂ ධර්මකඩය) කලින් පැවැති පිටක දෙකේ දාර්ශනික පැහැදිලි කිරීම් මෙම අළුත් පිටකයේ අන්තර්ගත විය. කණිශ්ක මහාධිරාජයාගේ කාලයේ හතරවන සහ අන්තිම බෞද්ධ සංගායනාව පැවැත්විනි. බෞද්ධාගමේ අංශ කිහිපයකින් සර්වස්තවාදී භික්ෂූන් 500කගේ අර්බුදකාරී දහම නිරාකරණය කිරීම් සඳහා එම සංගායනාවට සහභාගි විය. ප්‍රසිද්ධ චීන වන්දනාකරු හියුංසාන්ට අනුව කාශ්මීරයේ කුන්ඩලවාන නමැති ස්ථානයේදී පැවැත්වුවත් තවත් චීන සටහන් අනුව මෙය පවත්වා ඇත්තේ ගන්ධාර ප්‍රදේශයේ දීය. කෙසේ වෙතත් තවත් බලධාරියෙක් පවසන්නේ ජුලුන්දාර් නමැති ස්ථානයේ දී මෙය පැවැත්වූ බවයි. මෙම සංගායනාවේ දේශන මාලාවේදී සකස්කරන ලද විභස ශාස්ත්‍ර හා අනෙකුත් කෙටි සංග්‍රහයන් රතු තඹ තහඩුවක කොටා සීල්තබා ස්තූපයක තැන්පත් කරන ලදී. උතුරු දකුණු ආසියානු පරම්පරාවන් පමණක් හතරවන සංගායනාව ගැන සඳහන්කර ඇතත් ලාංකීය සමාජය මේගැන මුනිවත රැක ඇති බව සටහන් කරනු කැමැත්තෙමි. එම සංගායනාව ගන්ධාරයේ පවත්වන්නට ඇති බවට සිතීමට බොහෝ ඉඩකඩ ඇත. වර්තමානයේ පවතින ධර්ම සංග්‍රහය, පළමුවන හෝ දෙවන සංගායනාවේ ඒවා තරම් පැරණි ඒවා විය නොහැක. එක සංග්‍රහයක් වන 'කථාවතු' ක්‍රි.පූ. 3 වන පාරම්පරිකයන් පවසන්නෙ, පූජනීය සංග්‍රහයන් සහ ටීකාවන් පොත්වල සටහන් වී ඇත්තේ ක්‍රි.පූ. 1 වෙනි ශතවර්ෂයේ දී බවයි. ටීකාවලින් වෙනස්වන, පැහැදිලිව වෙන්කොට හඳුනාගෙන ඇති ධර්ම සංග්‍රහයන්, පාලි වශයෙන් ක්‍රි.ව. 5 වන ශතවර්ෂයේදී හඳුන්වන ලදී. ඒවායේ භාවිතයට ගෙන ඇති භාෂාව මාගදානම් නිරුක්ති හෝ මගද වාසින්ගේ භාෂාව නැතහොත් ඉන්දියාවේ දකුණු බිහාරයේය. ඇත්ත වශයෙන්ම බුද්ධාගමේ පැරණි කාලයේ භාෂාව විය හැකි නමුත්,



අසෝකගේ කාලයට පෙර එය භාවිතයෙන් ඉවත්වී ඇතිබව පෙනේ. ඔහුගේ ශිලාලිපි ලියා ඇත්තේ වෙනත් භාෂාවකිනි.



මහා පරිනිර්වාන



පරිච්ඡේදය 3

# බුදුරදුන් පිළිබඳ ජාතක කථා සහ පුරාවෘත්ත



දීපංකර ජාතකය

ජාතක යන්නෙහි නියම අර්ථය 'උත්පත්තියයි' බුදුන්ගේ පෙර ආත්මයන් පිළිබඳ ඉතා ප්‍රසිද්ධ කථා පාලි හා සංස්කෘතවල ඇත. බෞද්ධාගමේ සියළු අංශවල මෙම කථා සුරක්ෂිතව ඇත. ඉන්දියාවේ ශාන්චි හා බාරට් වැනි දකුණු ආසියානු කලාවන්හි ජාතක කථා ඉතා විශාල වශයෙන් දක්නට ලැබේ. ගන්ධාරයෙහි මෙම කථා ඇත්තේ අල්ප වශයෙනි. බුදුන්ගේ ජීවිතයට අදාල පුරාවෘත්ත කථා මෙහි විශාල වශයෙන් දක්නට ලැබේ. බුදුරජාණන් වහන්සේ සාධාරණ සදාචාරාත්මක හා ධර්මිෂ්ඨ ක්‍රියාවන් විධියට ජාතක කථාවල පෙනීසිටියත් ගන්ධාර කලාවන්හි එතුමාගේ ජීවිතය වීරයෙකු වශයෙන් පෙන්වා ඇත.

ජාතක කථා සැම විටම ආරම්භ කරන්නේ, එය ප්‍රකාශ කිරීමට සිදුවන හේතුව සඳහන් කරමිනි. එය අවසාන කරන්නේ වර්තමාන බුදුන්ගේ ජීවිතයේ විස්තර හෙළිදරව් කරමිනි. මෙම කථාවල විශාල වෙනස්කම් ඇත. අනාගත බුදුන් වෙනත් වෙනත් නවරූපවලින් පෙනී සිටී, ඔහු රජකු, දෙවියකු, ඇතෙකු ආදි වශයෙනි. සැම අවස්ථාවකම කථාවට අදාල සදාචාරාත්මක යමක් උගන්වයි.

භාරත රජ පෙලපතේ මහා කාව්‍ය එකතුව මහාභාරත සතුන් පිළිබඳ පුරාවෘත්ත (පංචතන්ත්‍රය) පුරාවෘත්තවල එකතුව (පුරානස්) දකුණු ආසියාවේ බෞද්ධ නොවන පුරාණ කාව්‍ය පිළිබඳ ස්ථාන බොහෝ බෞද්ධ ජාතක හා සමාන්තරව ඇතිබව සඳහන් කිරීම වැදගත් වේ. බුදුන්ගේ උත්පත්ති කථා හා ඔහුගේ පෙර ආත්ම භාවයන් උණුසුම් හැඟීම් වලින් හා විශාල ලෙස සිතින් මවාගත් විස්තර ගන්ධාරයේ සිතුවම් බවට පත්කර ඇත. මෙම කථා කැටයම් හා චිත්‍ර වශයෙන් බෞද්ධ ලෝකයේ සැම තැනම නිරූපනය කර ඇත. මැටි, හොඳින් පිලිස්සූ මැටි, ගල් ලෝහ හා බදාම වශයෙන් බෞද්ධ කලාකරුවන් විසින් මේවා නැවත නිෂ්පාදනය කර ඇති බැව් සොයාගෙන තිබේ.

බුදුන්ගේ ඉතා ප්‍රසිද්ධ ජාතක කථා හා පුරාවෘතවලින් සමහරක් මීළඟ පිටුවල පෙන්වා ඇත.

# ① දීපංකර කථාව

ගන්ධාර චිත්‍රකලාවේ ජාතක කථා අතුරින් ඉතාමත්ම ප්‍රසිද්ධ ජාතක කථාව දීපංකර ජාතක කථාව විය හැක. එය පිහිටා තිබුනේ ගන්ධාර රාජධානියට යාබදව පිහිටි ඇෆ්ගනිස්ථානයේ නින්ග්‍රාහර් නගරයේ හිය. බොහෝවිට ගල්වල කොටා ඇති එම ජාතක කථාව විශාල වශයෙන් ගන්ධාර ප්‍රදේශයේ දක්නට ලැබේ. බෞද්ධත්වයට පත්වන පුද්ගලයාට බුද්ධ යන නාමය පටබඳින බව මෙහිලා සඳහන් කල යුතුව තිබේ. අපේ ඓතිහාසික බුදුන්ට පෙර බුදුරජවරුන් 24 දෙනෙක් සිට ඇත. ඒ සියළු දෙනාගෙන්ම පළමුවැන්නා දීපංකර වශයෙන් හඳුනාගෙන ඇත.


බුදුන් පළමු ආත්මයේදී වේදයෙහි ඉතා දක්ෂ බ්‍රාහ්මණියෙක් වශයෙන් ඉපදී සිටි කථාවයි මේ. පාලියේ හා සංස්කෘතයේ මීට වඩා වෙනස් ප්‍රකාශයන් තිබේ. ගන්ධාර කැටයම් වල දක්නට ලැබෙන්නේ සංස්කෘතික ලක්ෂණයි.

මහාවංශ ප්‍රකාශනය අනුව දීපංකර රජකුමාරකෙි. ඔහුගේ රාජකීය පියාගේ නම ආචිමට් නම් විය. බුද්ධත්වයට පැමිණීමෙන් පසු එතුමා, පියාගේ නගරය වන දීපාවති නගරයට වැඩම කරවන ලදී. කුමාරයා පිළිගැනීම සඳහා ගැලපෙන අයුරින් උත්සව සංවිධානය කර තිබුනි. ඒ අතර තුරේ වේදයෙහි දක්ෂ මේඝා නමැති තරුණ බ්‍රාහ්මණයෙක්ද එම නගරයට පැමිණියහ. ඒ අතරතුරේදී දිය බඳුනක් සහ නෙලුම් මල් 7ක් රැගෙන යන තරුණ ගැහැනු ළමයෙකු මුණ ගැසින. මේ උත්සවය කුමක් සඳහා පවත්වන්නේ දැයි ඇගෙන් විමසන ලදී. දීපංකර නොබෝ වේලාවකින් මෙහි පැමිණෙන බවත්, බුදුන් වහන්සේට පූජාකිරීම පිණිස කාසි 500 ක් දී නෙලුම් මල් පහක් ලබාගත් බවත් තවත් දෙකක් නොමිලේ ලබාදුන් බවත් ඔහුට ප්‍රකාශ කරන ලදී. ස්වාමියාට පූජාකිරීම සඳහා එම නෙලුම් මල් තමාට භාරදෙන ලෙස මේඝා ඇගෙන් ඉල්ලන ලදී. දානවලදී ඔහුට ලැබුනු කාසි පන්සියයක් ඇයට පිරිනැමීය.



දීපංකර ජාතකය

මේ ආත්මයේදී මෙන්ම ඉදිරි ආත්ම වලදීත් ඇය තමාගේ භාර්යාව කරගන්නට කැමැත්තේ නම් ඇය මීට කැමැති බව ප්‍රකාශ කරන ලදී. බ්‍රාහ්මයා එවිට කියා සිටියේ ඔහු විශිෂ්ය දැනුමක් ලබාගැනීම සඳහා ගවේශනයක යෙදී සිටින නිසා, ඔහුට විවාහ වීමට නොහැකි බව දන්වා සිටින ලදී. තමන් නෙලුම් මල් ලබාගැනීමේ අදහසින් බලකිරීම මත ඔහු එකඟවිය. දීපංකර පැමිණෙනවාත් සමඟ නෙළුම්මල් පහ ඔහු වෙත දිගුකලේය. ඔහුගේ මුහුණ වටා තිබූ වට රවුමේ මෙම මල් රැඳුනි. ගැහැණු ළමයාද එයම කලවිට ඇගේ නෙළුම් මල් දෙකද මුහුණ වටා පැවැති එම වලල්ලේ රැඳුනි. වතුර භාජනය පසෙකින් තැබූ මේධංකර දනගසා බුදුරදුන්ගේ පාද ඔහුගේ හිසකෙස් වලින් පිරිපහදු කරන ලදී. මේ වන විට දීපංකර දනගෙන සිටියා මෙන් කොතරම් ප්‍රමාණයක් පිං රැස්කරගෙන සිටිනවාද, එසේම කපිලවස්තු පුර, ශාක්‍යයන් අතරේ නැවත ඉපිද ශාක්‍යමුනි බුද්ධ වශයෙන් ප්‍රසිද්ධියට පත්වන බව බෞද්ධ තොරතුරු වලට අනුව ඔහු මේ ලොවට සිද්ධාර්ථව නමින් බිහිවූ අතර අපගේ ඉතිහාසයේ බුදුරදුන් වූයේ එතුමායි. එතුමා මල් මිලදීගත් ගැහැණු ළමයා යසෝධරා වශයෙන් පෙනී සිටි අතර, එතුමාගේ භාර්යාව විය.



දීපංකර
ජාතකය

## ② වෙස්සන්තර ජාතකය



වෙස්සන්හර ජාතකය

රටේ රජතුමාගේ පුතු වශයෙන් උපත ලැබූ වෙස්සන්තර කුමාරයා ගැන මෙම ජාතක කථාවෙන් කියැවෙන්නේ බුදුන්ගේ අන්තිම ආත්මභාවය ගැනය. ඔහුගේ ත්‍යාගශීලී භාවය ගැන ඔහු ඉතා ප්‍රසිද්ධියට පත්විය. අවශ්‍ය වූ විටෙකදී වර්ෂාව ලබාදීමට හැකි සුදු ඇතෙක් ඔහු සතු විය. කාලිංග රටේ අවුරුදු ගණනාවක් පුරා දූඩි නියගයක් ඇතිවිය. එම රටේ රජතුමා බ්‍රාහ්මණයින්ගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් ගන්ධාර රටේ කුමරුවන විශ්වන්තරගේ ඇතා ඉල්ලමින් පිටත්කර හැරියේ ඒ මගින් කාලිංග රටේ පැවැති නියඟය අවසන් කර වර්ෂාව ලබාගැනීමේ අදහසිනි. කාරුණික කුමරු රාජකීය ඇතා ඔවුන්ට භාරදුන්නේය. මේ කරුන මත පියතුමාගේ රටවැසියන් කෝපයට පත්විය. මේ හේතුව නිසා ඔහු රටින් නෙරපා හරින ලදී.

ඔහුගේ රටින් නෙරපා හැරීමේ හේතුව නිසා අනුමත කළ අදාල වනයට ඔහු පිටත් විය. ඔහුට සිටි එකම කණ්ඩායම වූයේ ඔහුගේ භාර්‍යාව සහ දරු දෙදෙනායි. ගමනේ අතරමඟදී ඔහුගේ වාහනයේ අශ්වයා පළමුවත් ඉන්පසු රාජකීය වාහනයත් දන්දෙන්නට යෙදුනි. පසුව කෲර බ්‍රාහ්මයෙකු විසින් ඔහුගේ දරුවන් දෙදෙනා ඉල්ලන ලදුව ඔවුන්ද භාරදෙන ලදී. අවසානයේදී ඔහුගේ ත්‍යාගශීලී බව පරීක්‍ෂා කිරීම සඳහා, දෙවියන්ගේ රජාවන ශක්‍රයා වෙස්වලාගෙන පැමිණ රජුගේ ත්‍යාගශීලී බව පරීක්‍ෂා කරමින් ඔහුගේ භාර්යාවද රැගෙන යන ලදී. කෙසේ වෙතත් මෙම කථාව අවසන් වන්නේ කුමාරයාට මෙම පරීක්‍ෂණයෙන් ජයග්‍රහණය ලබා දෙමින් සිය පවුල සමඟ නැවතත් රජමාලිගයට පැමිණ වාසය කිරීමෙනි.

## ③ මහාමායා දේවියගේ සිහිනය



මහාමායා දේවියගේ සිනය

බෞද්ධ කථාවලට අනුව සිද්ධාර්ථ බෝධිසත්වයාණෝ මෙලොව උත්පත්තිය ලැබීමට පෙර තවත් දෙවිවරුන් මධ්‍යයේ තුසිත දිව්‍ය ලෝකයේ වාසය කළ බව කියැවේ. නියම අවස්ථාව පැමිණවිට අනෙකුත් දෙවිවරුන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු දිව්‍යලෝකයෙන් බැස මෑණියන් වන මහාමායා දේවියගේ දකුණු ඇලයෙන් කුස තුලට වැදුනේ රතු හිසක් හා හොඬවැලක් ඇති ලස්සන පාද හා දල සයකින් යුතුවූ සුදු ඇතෙකුගේ ස්වරූපයෙනි. මේ සෑම දෙයක්ම මහාමායා දේවිය ඇගේ සිහිනයෙන්ද දකින්නට යෙදුනි.

## ④ සිහිනය පැහැදිලි කිරීම

මහාමායා දේවිය ඇය දුටු සිහිනය ගැන ඇගේ ස්වාමියාවන සුද්ධෝදන රජතුමාට උදෑසන දන්වන ලද අතර මෙය පැහැදිලි කිරීමට බ්‍රහ්ම වරුන් කැඳවන ලෙස දන්වන ලදී. ඔහුගේ නියෝගය මත සිහින විග්‍රහ කිරීමේ මනා දක්ෂතාවයක් හා උගත්කමක් ඇති බ්‍රාහ්මනයින් කැඳවන ලදී. සිහිනයට අනුව රජ බිසව පිළිසිඳගෙන ඇති බවත් පිරිමි දරුවකු උපදින බවත් අනවැකි කියන ලදී. අසිත නමැති ප්‍රඥවන්තයා අදහාගත අයුරින් මහා ප්‍රීතියෙන් සිනා යමින් රාජකීය යුවලට කියා සිටියේ මෙතුමියට උපදින කුමාරයා ලෝකයටම අධිපති අධිරාජයෙක් හෝ බුදුන් වහන්සේ කෙනෙකු වනු ඇති බවයි.

## ⑤ සිද්ධාර්ථ උත්පත්තිය

මහාමායා රැජින, බෝධිසත්වයෝ දස හිරුමයක් තම ගර්භාෂයේ හොවගෙන සිට දේවදහ පිහිටි තම පියාණන්ගේ නිවසට යාමට තීරණය කරන ලදී. අතරමගදී හමුවූ සල්ගසින් යුතු ඉතා දැකුම්කළු උයනක් වන ලුම්බිනි උයනේ විවේක ගැනීමට අදහස් කලාය. ඉන්පසු උතුම්වූ සල්ගස මුලට පැමිණ එහි මලින් පිරි සල් අත්තක් අල්ලා ගැනීමට



සිද්ධාර්ත්ත කුමරුගේ උපත

අදහස් කරනවත් සමඟම, මලින් පිරි සල් අත්තක් එතුමියගේ අතලඟට නැමී පහත්විය. නැමුනු සල් අත්ත දිගුකල අතින් අල්ලාගන්නවාත් සමගම කිසිම අපවිත්‍රතාවයකින් හෝ විලිරුදාවකින් තොරව ඇය පුතෙකු වැදුවාය.



උපත ලැබූ ස්ථානය හා සිද්ධාර්ථ කුමරුගේ පියවර හත

## ⑥ කුමරුන් තැබූ පියවර හත

කිසිවකුගේ උදව්වකින් තොරව මහාමායාදේවී බිසව දරුවකු ප්‍රසූත කළාය. උපත සිදුවීමත් සමඟම කිසිවකුගේ ආධාර උපකාරයකින් තොරව සෑම දිසාවකටම පියවර හත බැගින් ගමන් කරන ලදී. අඩිය තබන සෑම පියවරක් පාසාම පොලවෙන් නෙළුම් මලක් පැන නැගුනි. පළමුව නැගෙනහිර දෙස බලා ඔහු ප්‍රකාශ කලේ. 'මුළු ලෝකයටම මම ප්‍රධානියා වෙමි. මින්පසු මම නැවත නූපදිමි.'



පියවර හත තවත් අයුරකින්

## ⑦ හඳහන

ඉතාමත් ප්‍රීතියෙන් සහ සතුටු සිතින් මහාමායා දේවිය පුතනුවන් සමඟ කපිලවස්තු පුරයට පෙරලා පැමිණියාය. කුඩා දරුවාගේ අනාගතය ගැන අනාවැකි ප්‍රකාශකිරීම සඳහා නැවත වරක් මාලිගාවේදී රිශි අසිත කැඳවන ලදී. රිසි හඳහන සූදානම්කර එය රාජකීය දෙපලට පැහැදිලිකර දෙන ලදී. අනාවැකි ප්‍රකාශකරමින් ඔහු කියා සිටියේ, දරුවා බුදුවරයෙකු හෝ ඔහුගේ ශාරීරික ළර්ත (ඇහි බැමිදෙක අතරේ කැරකී සිටි බබලන කෙස්ගහ) හා උශ්නිෂා

(ඉදිරියට නෙරා ඇති හිස) නිසා මුළු විශ්වයටම අධිපති අධිරාජයෙකු වනු ඇති බවයි. අනාවැකියට අරුත් කිහිපයක් ඇති නිසා රාජකීය දෙපල එතරම් සතුටුවූයේ නැත්තේ රජතුමාට අවශ්‍ය වූයේ ඔහුගේ පුතනුවන් රණ-ශූරයෙකු වී ඔහු ගේ ඇවෑමෙන් පදවි ප්‍රාප්ත වනු දකිමයි.



ලග්නය

## 8 සිද්ධාර්ථ හා යසෝදරාගේ විවාහ මංගල්‍යය

සිද්ධාර්ථ හා කුමාරි යසෝදරාගේ විවාහ මංගල්‍යය ප්‍රාදේශීය චාරිත්‍ර ක්‍රමය අනුව සිදුකරන ලදී. රාජකීය දෙමව්පියන් සහ අනෙකුත් අය පිරිවරාගෙන රජකුමරු මනාලියගේ නිවසට ගොස් පූජනීය ගිණිමැලය වටා නියමිත වට ප්‍රමාණය යාමෙන් පසු විවාහ බන්ධනයට ඇතුලත් විය.

## 9 රජමාලිගයේ ජීවිතය

සුද්ධෝදන රජු ඔහුගේ පුතාගේ අසාමාන්‍ය පළපුරුදු ගැන කලකිරීමට පත්විය. තරුණ අවධියේ ලෞකික දේට ඇලුම් කරමින් හා ප්‍රිතිවෙමින් සිටිනවා වෙනුවට කල්පනා කරමින් තනිව වාසය කිරීටම මෙම කුමරු කැමැති විය. සිද්ධාර්ථ ගැන රිසි අසිත විසින් පෙන්වා දී ඇති පරිදි ඔහු ලෝකයටම අධිපති පාලකයෙකු හෝ බුදු කෙනෙකු වන බවට අනතුරු අඟවා ඇති නිසා තැති ගැනුනු ස්වභාවයෙන් රජතුමා පසුවිය. එමනිසා ඉන්ද්‍රයන් පිනවීමට කැමැතිවන පරිදි, තරුණ, ලක්ෂණ සිංදු කියන ලඳුරියන් නිතරම ඔහුවටා සිටීමට සලස්වන ලදී. යශෝධරා සමහ විවාහවීමෙන් පසු එක් එක් කාලයට ගැලපෙන පරිදි මාලිගා තුනක් වෙන්කර දෙන ලදී. වටකුරු ඇස් බැම හා නෙත් කොනින් බලන දිග ඇස් ඇති මිහිරි සිනහවෙන් යුත් මිහිරි හඬින් හා මනහර රැගුමින් යුත් ගී ගයන තරුණ ලඳුන් ඔහුවටා එක්රොක් වීමට සලස්වන ලදී.



රජමාලිගා ජීවිතය

## (10) සිද්ධාර්ථගේ ප්‍රථම භාවනාව

සුද්ධෝදන රජතුමා වරක් සිද්ධාර්ථ කුමරු සී සාන තරඟයක් නැරඹීමට රැගෙන යන ලදී. අඩ නිරුවතින් සිටි තරඟකාර සීසාන්නෝ තරඟය දිනවීම සඳහා ඉක්මනින් දිවවීමට ගොනුන්ට පහර දෙන්ට විය. හිරුරැස් තදින් පායන විට සී සාන්නෝ හා ගොනුන් දහඩිය වැගිරීමට පටන්ගති. ඒ අතරතුරේ පොලවෙන් කුහුඹියන් හා අහසින් කුරුළු රංචු බිමට පාත් විය. පහරදීම නිසා සතුන්ගේ කරවල් වලින් ලේ ගලමින් සිටීමත්, මධ්‍යහ්නයේ හිරු රැස් මැද වෙහෙසට පත් ගොවීන් හා කුරුල්ලන් විසින් ගිල දමන ලද කෘමීන්ද දැකීමෙන් සිද්ධාර්ථ කුමාරයාගේ හෘදය ශෝකයට පත්විය. මෙම ස්ථානයෙන් ඉවත් වී විවේක ගැනීමට අදහස් කරන ලදී. ඔහු මෙම ස්ථානයෙන් විවේකී ස්ථානයකට ගොස් ජම්බු ගසක් යටට වී භාවනා කිරීමට පටන් ගත්තේය. රජතුමා ඔහුගේ පුතු නොමැතිවූ හෙයින් ඔහු සෙවීමට ඇමතිවරුන් පිටත්කර යවන ලදී. ඔහු භාවනායෝගීව සිටින බව ඔවුන් දුටු අතර, බැසයන හිරුගේ රැස් දහර වලක්වමින් ඔහුට සෙවන සපයන ගස ඔවුන්ට දකගත හැකි විය. මෙය ඇසීමෙන් පසු රජතුමා එම ස්ථානයට වහා පැමිණීමෙන් පසු දුටුවේ, ජම්බුගසේ ස්ථිර සෙවන යට කුමාරයා භාවනානුයෝගීව සිටින බවයි. ඔහු කුමාරයාගේ දෙපා ඉදිරිපිට වැඳ වැටුනි.



සිද්ධාර්ථගේ උපත

## (11) ගිහිගෙ හැරයාම

ප්‍රීතිමත් අවස්ථාවකට පසුව යසෝදරා තද නින්දේ පසුවූ අතර සිංදු කියමින් නැටුම් රඟපාමින් සිටි ගැහැනු ළමුන් නොයෙකුත් විකාර ස්වරූපයෙන් නිදා සිටිය. සැපවත් ජීවිතයක් ගතකරමින් සිටි සිද්ධාර්ථ කුමරු තමා සිටි අසුනින් නැගිට මාලිගාව හැර සත්‍ය සෙවීම සඳහා පිටත්විය.

## (12) මහා අභිනිෂ්ක්‍රමණය

ඔහු ඔහුගේ අස්ගොව්වා වන ඡන්න නින්දෙන් ඇහැරවා, ජවසම්පන්න පාද ඇති කන්ථක නම් අශ්වයා රැගෙන එන ලෙස දන්වූයේ අමරණීයත්වය සොයා අද යාමට අදහස් කරන බවයි. යක්ෂයින් එවිට ඔවුන්ගේ ශරීර නවා අත්වල ඇඟිලි තුඩු වලින් කන්ථකගේ කුර වලින් ඔසවන ලදී. අලින්ටවත් ඇරිය නොහැකි ඉතා ශක්තිමත් නගරයේ ගේට්ටු කිසිම ශබ්දයක් නොනැගා, ඉබේම විවෘත විය. ඒ අයුරින් කුමාරයා නගරයෙන් පිටත්විය.



මහා පිටත්ව යාම

මහාභි නිෂ්ක්‍රමණයේ අතර මඟදී මාරගේ නපුරු ආත්මය ඉදිරිපත්වී මහාභිනිෂ්ක්‍රමණය අත්හරින්නේ නම්, මුළු ලෝකයේම බලය සිද්ධාර්ථ වෙත ලබාදෙන බවත් ගිහිගෙය අත්හැරයාම නවත්වන ලෙසත් දැන්විය. නමුත් බෝධිසත්ව මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය.



මහා පිටත්ව යාමේ දී විවෘතවූ කපිලවස්තුවේ පිවිසුම

## (13) ඡන්නට හා කන්ථකට ශුභ පැතීම

රජමාලිගාව රාජකීය නගරයෙන් වෙන්වූ පසු සිද්ධාර්ථ නොයෙකුත් ගෝත්‍රිකයින්ගේ රටවල් පසුකරන ලදී. දිවාකාලය එළඹෙන්ම කන්ථක අසුපිටින් බැස පැමිණ සිටි දෙවිවරුන්, නාග, යක්ෂ, ගාන්ධ, අසුර, ගරුඩ, කින්නර ආදී විශාල පිරිසකගෙන් සමුගන්නා ලදී. දෙවිවරුන් පිටත්වූ පසු පැළඳ සිටි ආභරණ හා කන්ථක නම් අශ්වයා, අසරු ඡන්නට භාරදී සැපවත් ජීවිතයක සියළු අංගයන්ගෙන් නිදහස් වීමට තීරණය කරන ලදී.




## ⑭ බ්‍රහ්මචරුන් සමඟ ප්‍රථම හමුවීම

බුද්ධත්වය ලබාගැනීමේදී, සිද්ධාර්ථ, යම් යම් ගැටලුවලට මුහුණ පාන්නට සිදුවිය. එම නිසා බ්‍රහ්මයින්ගෙන් උපදෙස් ලබා ගැනීමට ඔහු කල්පනා කළේය. පළමු අය මුන ගැසී සාකච්ඡා කලත් සෑහීමකට පත්නොවුනි. දෙවෙනි අය සමඟ සාකච්ඡා කලත් ප්‍රශ්නය නිරාකරණය කිරීමට නොහැකි විය. ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට ඇති හොඳම මාර්ගය නම් කිසිවකු සමඟ සාකච්ඡා නොකර තමාම එය විසඳාගත යුතු බවයි.

## ⑮ මෝක්ෂය ලබා ගැනීම සඳහා උපවාසය

සාමාන්‍ය මිනිසකුට කල නොහැකි, නිරාහාරව සිටීමේ උපවාස ක්‍රියාවන්වල සිද්ධාර්ථ නිරත විය. හම සහ ඇට පමණක් ඉතුරුවන සේ හයමාසයක් පුරා තම ශරීරය කෘෂ භාවයට පත්වන තුරු ඔහු උපවාසයේ යෙදී සිටියේය. එතරම් අමාරු ක්‍රියා මාර්ගයක් ඉතා සාර්ථකව ගෙනගියත් බුද්ධත්වය ලබාගැනීම සඳහා ඉන් කිසිම ප්‍රතිඵලයක් අත්නොවීය. ඔහු කල්පනා කලා, බඩගින්නේ හිඳිමින්, පිපාසයෙන් පෙලෙමින්, ශරීරය කෘෂ බවට පත්කරමින්, හොඳ මනසක් ලබාගැනීම අසීරු බව.



හොඳ මනසක් පතා සිද්ධාර්ථ
උපවාසසේ යෙදීම

## (16) පෙළඹවීම හා මාර ප්‍රහාරය

ඒ අතරතුරේදී මාර කල්පනා කලා සිද්ධාර්ථ උතුම් ඥානය ලබාගෙන, ඒ මඟින් අනෙකුත් අය නිරයෙන් ගලවා ගතහොත් ඔහුගේ බලය අසීමිත ලෙස පහත වැටෙන බව. එම නිසා සිද්ධාර්ථ මෙම මාර්ගය පහදාගැනීමෙන් වැලැක්වීමට සියලු උත්සාහයන් යොදෙනු ලැබීය. පළමුව ඔහු බලය හා විනෝදය සඳහා වරදෙහි බැඳීමට පොරොන්දු දීමට උත්සාහ කලා. මේ සඳහා තමාගේ දූ වරුන් කුමාරයා ඉදිරියේ රඟපෑමට නියෝග කලා. කෙසේ වෙතත් බෝධිසත්ව මේ කිසිම පෙළඹවීමකටවත්, ප්‍රතිචාරයක් නුදුන් නිසා මාර බොහෝ කේන්තියෙන් පසුවූවා. මාර ඔහුගේ කණ්ඩායමත් සමඟ සිද්ධාර්ථ ඉදිරියේ නොයෙකුත් ආවේග වලින් පොලු, මුගුරු, කඩු, කිණිසි, අතැතිව ඌරු, මාළු, අශ්ව, බූරු හා ඔටු මුහුණු වලින් සැදී අනාගත බුදුන් භය කිරීම සඳහා එතුමා වටකරන ලදී. ශාක්‍යමුනි ඒ කිසිවක් ගනන් ගත්තේ නැත. මාර එවිට බොහෝ දුකට හා අධෛර්යයට පත්විය.



මාර ප්‍රහාරය

## 17 මහා අවබෝධය


බෝධිසත්ව එවිට නිදා සිටින සර්පයකුගේ දරණගසා සිටින අයුරින් සෙලවිය නොහැකි ආකාරයෙන් පාද හරස් කොට ඔහුගේ අවයව පිහිටුවා 'මාගේ කාර්‍යය සම්පූර්ණ වනතුරු මෙම ඉරියව්වෙන් නැගී නොසිටිමි' කියමින් අධිෂ්ඨාන කර ගත්හ. සිව්වන දිනයේ හිමිදිරිය වනවිට සියල්ල නිසල බවකින් පසුවුනි. ඔහු සර්වඥාතාග් නුවණ හිමිකරගෙන සිටියේය. එතුමා සියල්ල දත් නුවණ හිමිකරගන්නා විට වයින් පානය කල සත්‍රියකයේ මිහිතලය සෙලවෙන්නට විය. සතර දිග්භාගයෙන්ම මහා ජන ගංගාවක් පැමිණි අතර නගරයේ විශාල බෙර දෝංකාරය දෙන්නට විණි. ශාරීරික අපහසුතාවන් ගැන නොබලා, ඇසිපිය නොහෙලා සිහින් පමණක් සියල්ල බලමින් ඔහු ඒ අයුරින් සිටියේය.

## 18 පළමු ධර්ම දේශනය

මහා අවබෝධයට පත්වීමෙන් පසු බුදුන් තපස් බවින් මිදුනු අවස්ථාවේ ස්වාමියා අතහැර ගිය මුව උද්‍යානයේ සිටින පස්වග මහණුන්ට ධර්මය දේශනා කිරීමට තීරණය කලේය. ඒ අනුව ඔහු  මුව උද්‍යානයට ගොස් පළමුවන ධර්ම දේශනාව පවත්වන ලදී. බුද්ධත්වයට පැමිණීමෙන් පසු දේශනා කරන ලද පළමුවන ධර්මදේශනාව බෞද්ධ ඉතිහාසයේ වැදගත් තැනක් ගනී. සංස්කෘත භාෂාවෙන් එය 'ධර්මචක්‍ර පවත්වන' යන නමින් සඳහන් කර ඇත. එයින් අදහස් කරන්නේ නීතිය නැමති චක්‍රය ක්‍රියාත්මක කිරීමයි. ආරම්භයේදී බුදුරදුන්ගේ පිළිමය එළිදැක්වීමට පෙර එම ස්ථානය පිළිබිඹු කලේ රෝදයකිනි. කෙසේ වෙතත් ගන්ධාරයේ මෙය පෙන්වා ඇත්තේ බුදුරදුන් වාඩිවී දහම් දෙසන ආකාරයෙනි. සමහර බිතු සිතුවම්වල මෙය පෙන්වා ඇත්තේ රෝදයක් කරකවන ආකාරයෙනි.



පළමු ධර්ම දේශනය



බුදුරදුන් කපිලවස්තු නුවරට වැඩීම

## ⑲ සරස්වතියෙහි ප්‍රාතිහාර්‍යය



සරස්වතියෙහිදී විශේෂයෙන් ගොඩනඟන ලද වේදිකාවක ප්‍රසේනජිත් රජු ඉදිරියේ රාජ්ගිර්හි ඔහුගේ මිථ්‍යාදෘෂ්ඨික ගුරුවරුන් හය දෙනෙකු හැරවීම සඳහා බුදුරදුන් විසින් ඔහුගේ ආශ්චර්‍යය ජනක බලය ප්‍රදර්ශනය කරන ලදී. ආශ්චර්‍යය ජනක බලයක් තිබූ ඔවුන් විසින් බුදුන්ට අභියෝග කරන ලදී. බෞද්ධ ග්‍රන්ථ වලට අනුව බුදුරදුන් එතුමාගේ උඩ සහ පහත කොටස් වලින් වරින්වර ගිණිදූල් සහ ජලපහරවල් නිකුත් කරමින් අහසට පාවන ලදී. ඒ අතරම නොයෙකුත් දිසාවන්ට අහසේ පාවෙන නොයෙකුත් ස්වරූප වලට වෙනස්වන අයුරුද, බුදුන් බණදේශනා කරන අතර වාරයේ ඒවා දිව්‍යලෝකයට යන ආකාරයද පෙන්වන ලදී. තවත් නාග රජවරුන් දෙදෙනෙකු වන නන්ද හා උපනන්ද ඉදිරියේ ඉතා ලස්සන නෙළුම් මලක් මවා පෙන්වන ලදී. බුදුරදුන් එම මල මත හිඳගෙන ධර්මය දේශනා කරන ලදී. සංස්කෘතයේ මෙම ඉරියව්ව ධර්මචක්‍ර මුද්‍රාව නමින් හැඳින්වේ.

සරස්වතියෙහි ප්‍රාතිහාර්‍යය




සරස්වතියෙහි ප්‍රාතිහාර්යය



පිරිනිවන් පෑම

## 20 බුදුන්ගේ අභාවය

මිනිසුන්ට ධර්මය දේශනා කිරීම සඳහා අනුගාමිකයින් හා ශ්‍රාවකයින්ගේ ප්‍රධානියා වන ආනන්ද සමඟ ගමන් කරන අතර ඔහු අසනීප වූ හෙයින් දිනෙන් දින දුර්වල තත්ත්වයට පත්වුණි. හිරන්නාවති ගඟ තරණය කිරීමෙන් පසු කුෂිනගර් හි කුෂිනාර නැම්මට පැමිණියේය. මෙය දැනට ඇත්තේ ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ ප්‍රාන්තයේයි. සල්ගස් පිහිටි භූමියට ඔහු පැමිණිවිට ආනන්දගෙන් ඔහු ඉල්ලා සිටියේ ඉතා මහන්සි නිසා වැතිරගැනීම සඳහා වේදිකාවක් සූදානම් කරන ලෙසයි. ඉන්පසු ඔහු පළමු වැනි ධ්‍යානයටත් එතැනින් ඉදිරියට සදාකාලික වන හතරවන ධ්‍යානයටත් පැමිණි පසු උතුම් වූ හෙතෙම මියපරලොව යන ලදී. සංස්කෘතික භාෂාවෙන් මෙය මහාපරිනිර්වාන වශයෙන් සඳහන්වේ.





බුදුන්ගේ ආදාහනය

## 21 බුදුන්ගේ ආදාහනය


බුදුන්ගේ කැමැත්ත අනුව ශරීරය පිළිබඳ අවසන් කටයුතු ප්‍රදේශ වාසීන්ට භාරවිය. ඒ අනුව මල්ල ප්‍රධානීන් විසින් අවසන් කටයුතු සූදානම් කරන ලදී. ඔහුගේ ශරීරය සුවඳ දර සඳයක තබා මල්ල ප්‍රධානීන් සතර දෙනා සෑයට ගිණිදැල් වීමට උත්සාහ කලත් එය අසාර්ථකවිය. ඉන්පසු මහා කාශ්‍යප පැමිණ බුදුන්ගේ දෙපාමුල වැටී සෑය වටා තුන්වරක් ගමන් කර නමස්කාර කරන ලදී. පැමිණ සිටි සියලුම භික්ෂූන් එය අනුගමනය කල පසු සෑයට ඉබේම ගිණිගත්තා ලදී. ශරීරය සම්පූර්ණයෙන්ම ගින්නෙන් දැවුනු පසු අහසින් ජලධාරා පොළවට පැමිණ පොලවෙන් උඩට විත් ගින්න නිවා දමන ලදී. මල්ල ප්‍රධානීන්ද සුවඳ විලවුන් පිරවූ භාජනවලින් එම ක්‍රියාවම කර මිනිසුන්ට ප්‍රනාමය පුදකිරීමට හැකිවන පරිදි ඉතුරුවූ භස්ම මන්ත්‍රන සභා ශාලාවේ දින තුනක් තබන ලදී.



බුදුන්ගේ දේහය

## (22) බුදුන්ගේ ධාතු බෙදාහැරීම

බුදුන්ගේ ආදාහනයෙන් පසු ධාතු නිදන්කිරීම සඳහා ප්‍රාන්ත හා ගෝත්‍රිකයින් කිහිපදෙනෙක් එම ධාතු අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී. මෙම ඉල්ලීම් කල අය අතර, කුෂිනාරාවෙහි මල්ලවයින් එවකට ධාතූන් සන්තකව තිබුනේ ඔවුන් අත හෙයින්, ඔවුන්ගේ අසල්වැසියන් වන වෛයිසාලේ ලිච්චවී වරුන් කපිලවස්තු වල ශාක්‍ය වරුන් අල්ලකප්පවල බුලිඡ් වරුන් හා පාවාවල මල්ලා වරුන්ද වේ. කුෂිනාරාහී මල්ලා වරුන් එම ධාතු තමන් සතුව තබාගන්නා බවට තදින්ම සිටි නිසා අනෙක් සියළුදෙනාම එකතුව ඔවුන්ට විරුද්ධව නැගී සිටීමට ධාතු ලබාගැනීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත් ද්‍රෝනා නමැති අයගේ මැදිහත්වීම නිසා එම ධාතු සමාන කොටස් අටකට බෙදා ඉල්ලුම්කරුවන් අතරේ සමානව බෙදා හැරීමට තීරණය විය. බෙදාහැරීමෙන් පසු නිදන්කරන ස්ථාන වලට ධාතු රැගෙන යන ලදී.



බුදුන්ගේ ධාතු බෙදා හැරීම



බුදුන්ගේ අවසන් කටයුතු සිදුවූ යැයි විශ්වාසය කෙරෙන නේපාලයේ ටෙරායි ප්‍රදේශය. එහි වාසය කළ මල්ලාවරුන් විසින් අවසන් කටයුතු සිදුකර ඇත.



නෙලුම් මලේ වැඩමින් බුදු දහම දේශනා කිරීම

පරිච්ඡේදය 4

# ගන්ධාර චිත්‍ර කලාව



ගන්ධාරයෙන් බුදුන් වැඩමවූ රූපය



මධුරාවේ බුදුන් වැඩමවූ ඇයුරු

ක්‍රි : පූ : 1 වෙනි ශත වර්ෂයේ සිට ක්‍රි : ව : 7 වන ශතවර්ෂය දක්වා විශේෂයෙන් ගන්ධාර ප්‍රදේශයේ දියුණුවූ ඇසින් නැරඹිය හැකි බෞද්ධ චිත්‍ර වශයෙන් ගෘහනිර්මාණ ශිල්පය කැටයම් ශිල්පය හා චිත්‍ර ශිල්පය දැන් සෑම තැනකම ගන්ධාර සිතුවම් කලාව වශයෙන් ප්‍රසිද්ධව ඇත. කුෂාන් පෙලපත යටතේද මෙම කලා ක්‍රමය විශාල වශයෙන් දියුණුවට පත්වූ බව පෙනේ. කුෂාන් චිත්‍ර කලාව සමකාලීන වන අතර මතුර්හි (දැනට ඉන්දියාවේ භාරට) එම චිත්‍රකලාව ප්‍රචලිතව පැවති බව පෙනේ. එහි ආරම්භය හා දියුණුව මුල් ඉන්දියානු මයුරු සුන්ග හා අන්ධාර චිත්‍රකලාවට පසු එහි ඇතිවූ බව පෙනේ. කෙසේ වුවත් එය දේශීය චාරිත්‍රයක් ඉදිරියට ගෙනයාම වශයෙන් නොසලකන ලදී.


ගන්ධාරයේ භූගෝලීය පිහිටීම බටහිර හා කුෂාන් පාලකයින්ට අනුව, ශෛලීය දියුණු කිරීමට ඇතිවූවක් මිස ඉන්දියානු චාරිත්‍රානුකුල බිහිවීම් වලට පටහැනි වූවකි. සමහර අංශ වලින් බටහිරට හැකිවන බව පෙනේ.



බුදුන්ගේ ජීවිත කතාව දැක්වීම

කෙසේ වෙතත් විෂය මාලාව ගැන බැලීමේදී එය ජාතික ගුරු කුලයන්හි පෞරාණික කලා ශිල්ප තාක්ෂණය නැවත බිහිවීමකි දකුණු ආසියාතු කැටයම් ශිල්පය තරමක් දුරට අවට ප්‍රදේශවල කරගෙන යන ලදී. ගන්ධාර අනුකරණයේ සදෘ හා අනෙකුත් පූජනීය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වේ.

වර්තමාන  කාලයේ ඉන්දියාවේ සාන්චි හා චතුර් වල ඇති ගොඩනැගිලිවල ඉදිරිපය ඇති වාම බව මෙයින් විදහාපායි. ගන්ධාර කලාකරුවෝ බෞද්ධ චරිතය නිර්මාණය කිරීමේදී බෞද්ධ කලාව බුදුන්ගේ චරිතාපදාන දර්ශන සඳහා යෙදීමෙන් විශාල පරිත්‍යාගයක් කර ඇත.



ශිංගාධර කඳුවැටියේ පිහිටි ස්තූපය

කලායතනයෙන් කරණ ලද නිශ්පාදන බොහෝ වේ. ගිණිය නොහැකි සංඛ්‍යාවක් පිළිම, ඉන් බෙහොමයක් බුදුන්ගේ හා බෝධිසත්ව වරුන්ගේය. තවදුරටත් බුදුන්ගේ ජීවිතය පිළිබඳ දර්ශන හා පුරාවෘත්ත පිළිබඳ ඒවා හමුවී ඇත. කැටයම් සඳහා යොදාගන්නා ලද ද්‍රව්‍ය අළුපාට නිල් හෝ කොළපාට ගල්පතුරුවේ පසුකාලයේ දී ඒවා බදාම විය.

ගන්ධාර ස්තූප ඒවායේ ඇති විසිතුරු බව නිසා එහි විශේෂත්වයක් පෙනේ. ගරාඳි සවරූපයක් නොමැතිව එම සිහිවටනයේ බඳට විසිතුරු බවක් ආරූඪකර ඇත.


දකුණු ආසියානු භූමියේ හෝ බටහිර අදහස්වල සංකල්පයක් හෝ ගන්ධාරයේ කිසි දිනෙක නොවිය. රෝලන්ඩ්ට අනුව ඉන්දියන් හා ගන්ධාර කලාව වෙනත් අංගවල වෙනම මාර්ගයක ඉදිරියට ගොස් ඇත. ඉන්දියානු බෞද්ධාගමේ ගුප්ත හා විශ්වාස කිරීමේ ලක්ෂණය නිසාත්. බටහිර කලාවේ මානුශ්‍ය ශ්‍රේත්ව නුසුදුසු කමින් ආනයනය කරණ ලද මේ ක්‍රම අභාවයට යාමත් සමග ගුප්ත කාලයේ නියම ඉන්දියානු අදහස් ඉස්මතුවීමට හේතුවිය.

කුෂාන් වරුන් එම භූමියට ආගන්තුකයින්වූ නිසා ඔවුන් විදේශීය කලා ක්‍රම උපයෝගී කරගන්නට යෙදුනි. ඒ අනුව ඔවුන් හින්දූවරුන් වශයෙන් ගිණිය නොහැක. ඔවුන්ගේ එවැනි භූමිවලදී ඔවුන් බෞද්ධාගම වැළඳගත් අතර විදේශීය චාරිත්‍ර ක්‍රම දකුණු ආසියානු උප මහාද්වීපයේ ස්වාධිපත්‍යය පවත්වාගෙන යාම සඳහා පුරුදු පුහුණු කරණලදී.

කුෂාන් අධිරාජයා වන කණිෂ්කගේ සහ ඔහුගෙන් පැවත එන්නන්ගේ රජයේ අනුමත කලාව වශයෙන් ගන්ධාර චිත්‍ර කලාව පැවැති බව කීම වඩාත් උචිත වන්නේ ක්‍රි : ව : 5 වන ශතවර්ෂයේදී ගුප්ත චිත්‍ර කලාව එය අභිබවා පැතිරුණු හෙයිනි.

සමහර උගතුන් සිතන්නේ ගන්ධාර ක්‍රමයේ උපත ග්‍රීක් රෝමන් ආභාශ්‍ය නිසා ඇතිවූවක් බවයි. ඉතා මැතක






කුෂන් රාජධානිය සහ බටහිර සම්බන්ධතාවය



විනය හුවා දක්වන සොයා ගැනීමක්

අදහස් වලට අනුව රෝම කලාව ඊට හේතුවූ බව කියයි.

## වෙනත් අරුතක් දෙන ග්‍රීක බෞද්ධ වචනය

නොමඟ යවන අර්ථයක් දෙන අතර එම කලාව සඳහාම ආදේශ කල එකකි. එය නිදිමතින් පසුව වන්නේ සිතෙහි ඇතිවුවක් විය හැක ලාහෝර්හි කෞතුකාගාරයට රජුගේ පැමිණීම ගැන සහ විස්තර කරන්නේ ග්‍රීක බෞද්ධ කැටයම්කල මිනිසුන්ගේ මතකයෙන් බැහැරව බොහෝ කලක් වුවත් ඔවුන්ගේ අත්වල මේවා තවමත් රැඳී ඇති බව පණ්ඩිතයින් පවසතත් දක්‍ෂ ලෙස හා ගුප්ත ලෙස ග්‍රීසියෙන් ආයතනයක් මෙයට ආවේග කර ඇති බවයි. ගන්ධාර කැටයම් ශිල්පයට ග්‍රීක චිත්‍ර කලාවේ හෙලනිස්ටික් හෝ හෙලනික් ක්‍රමයට සම්බන්ධයක් නැති අතර රෝමන් කලාවට වැඩි කිට්ටු සම්බන්ධයක් ඇති බව පෙනේ. ගන්ධාර කලාව රෝමන් අධිරාජයයේ නැගෙනහිර අනුකරණය වශයෙන් සවිස්තරව පෙන්වාදී ඇත. විශේෂයෙන් එහි ප්‍රාදේශීය හා පසුකාලීන දැක්ම වලින් එය පැහැදිලි වේ.

ගන්ධාර චිත්‍රකලාව ආගමික පරිසරයක සැරිසරයි. එහි සෑම ක්‍රියාකාරකම බුද්ධාගම මුල්වේ. කුෂාන් අධිරාජයා වන කනිෂ්කට එම කලාව පිළිබඳ පණාමය හිමිවේ. හේතුව වශයෙන් ඔහු බෞද්ධ ආගමිකයෙකු වන නිසයි. නමුත් සම්පූර්ණ වශයෙන් බැලු කල මෙය සත්‍යයක් විය නොහැක. මෙහි දියුණුව හා ආරක්‍ෂාව පිළිබඳ පිටුපසින් සිටි තැනැත්තා ඔහුවිය හැකි වුවත් එහි මූලිකයා සම්බන්ධයෙන් තවදුරටත් ඉදිරියට යා යුතුවේ.



හාරී පොටෙටිවරුන්

හෙලන්ස්ටික් චිත්‍ර ක්‍රමය ගෘහනිර්මාන ශිල්පය වශයෙන් හා කැටයම් ශිල්පය වශයෙන් දකුණු ඉන්දියානු ඈත මහාද්වීපයේ සකා පාතිහත් රජපෙලපත කාලයේ ගෙන ආ බවට සාක්ෂි එයට වේ. තක්ෂිලාවේ සුකාප් නගරයේදී කරන ලද කැනීම් වල්දී හමුවූ කැටයම් වල කොටස් වලින් හා ආරාමයන් බොහොමයකින් කරන ලද පරීක්ෂණ වල්දී මෙම මතය තහවුරු කර ඇත. ගන්ධාර කැටයම් ශිල්පයද ඇරඹුනේ මේ අවධියේ බව සැලකිය යුතුව ඇත.

මෙහිදී හමුවූ සමහර දේවල් විදේශීය සම්භවයක් සහිත ඒවාවූ බව නිවැරැදිව සොයාගෙන ඇත. තක්ෂිලාවේ සිකප් නගරයෙන් ගොඩගන්න ලද එම භාණ්ඩ අතරින් හිපෝක්‍රටීස් හා දියානිසුයුම්ගේ ඇලෙක්සැන්ඩ්‍රියන්ගේ ලෝහ භාණ්ඩ. සෘන්ගාත්මක සුවඳකින් යුත් වැසිකිලි පෝච්චි ද වේ. ඇෆ්ගනිස්ථානයේ බෙග්‍රෑම් නහරයේ කරන ලද කැනීම් වල්දී සිද්‍රික් වීදුරු රෝම ලෝහ, ප්ලාස්ටර් ප්‍රතිමා හමුවී ඇත. සොයාගන්නා ලද මෙම ද්‍රව්‍ය වලින් පෙනීයන්නෙත් සංස්කෘතික හා වානිජ සබඳතා ගන්ධාර හා රෝම රටවල් සමඟ පැවැති බවයි.

ගන්ධාරයෙහි මෙවැනි දේවල් හමුවීමෙන් පැහැදිලි වන්නේ හෙලන්ස්ටික් බලපෑම් තිබූ බවයි. කෙසේ වෙතත් බුද්ධිමතුන්ගේ අදහස වී ඇත්තේ රෝම අධිරාජ්‍යයේ නැගෙනහිර පෙදෙසේ කලාකරුවන් හා ශිල්පීන් විසින් ගන්ධාරයේ වැදගත්ම කොටසේ පළමුවෙනි බුදුන්ගේ පිළිමය නිර්මානය කළ බවයි. දකුණු ආසියා උපමහාද්වීපයට පිටින් ගෙන්වනු ලැබූ ප්‍රගුණ කලාකරුවන්ගෙන් සහ ඔවුන්ගේ ප්‍රාදේශීය සිසුන් විසින් ගන්ධාර කලායතනය ආරම්භ කළ බව පෙනේ. මනුෂ්‍ය ස්වරූපයෙන්ම බුදුරදුන්ගේ රූපය නිර්මානය කිරීම ගැන සමහර විද්වතුන් ගන්ධාර පාසැලට ප්‍රණාමය පුදකරන ලදී. මෙම උපකල්පනා ස්ථිර කිරීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමට නොහැකි වුවත් ගන්ධාර ප්‍රතිමාව අනෙක් කලායතනය වන මතුර කලාවෙන් සම්පූර්ණ යෙන්ම වෙනස්වේ. එය කලායතන දෙකේ වෙනස පැහැදිලිවම පෙන්වා දෙයි. මෙම උපකල්පනය ස්ථිර කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නොහැකි වුවත් ගන්ධාර ප්‍රතිමාව මතුර කලාවට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වූ මෙය කලායතන දෙකේ වෙනස පැහැදිලිව පෙන්වන්නකි. යල්සා මූලාශ්‍රයෙන් කෙලින්ම පැවතෙන ප්‍රතිමා වෙනුවට ගන්ධාර ක්‍රමය හැඟීම් වලින් බර හා මටසිලුටු බවින් යුත් ඇපලෝ මූර්තිය අනුගමනය කිරීමකි. පැවිදි වෘත්තියට හිමි සිවුරු සඳහා එන්යේ නැමුනන් පොටවල් ආදියට නියමිත ප්‍රමාණයෙන් සෑදීම නිසා ඉඳියානු කලා ක්ෂේත්‍රයේ පවතින වෙන් ඒවාට වඩා ස්වාභාවිකත්වය විදහාපායි. කෙසේ වෙතත් ප්‍රතිමා කලාවෙහි දක්නට ඇත්තේ දකුණු ආසියානු ලකුණු බව පෙනේ. බෝධිසත්ව රූප පෙන්වන කැටයම් බොහොමයක් ඒවාට රාජකීය තත්වය අන්තර්ගතකොට ඇති අතර සමහරක පෞද්ගලික මුහුණු ලක්ෂණ පෙන්නුම් කරයි.


යක්ෂි රූපය

ගන්ධාර කලාව පිළිබඳව විෂයවී ඇත්තේ ප්‍රධාන වශයෙන් ආගමික ස්වරූපයක් වුවත් කැටයම් වල මෝස්තරයට බලපා ඇත්තේ බටහිර ආසියාවද නැතහොත් හෙලන්ස්ටික් ස්වරූපයද යන්න විමසා බැලීම වරදක් නොවේ. එම පේර්සෙපොලිටන් නගරයේ මැසපොටේනියම් මෝස්තර හා ස්පිනික්ස් හා ගයිපොන් වැනි අතිවිශාල අස්වාභාවික සතුන් පුරාණ ඉන්දියානු ශාස්ත්‍රවේදී විසින් උකහාගෙන ඇත. කුෂාන් අධිරාජයාගේ රාජ්‍ය සභාවේ සේවය කල රෝමානු කරණය කල පූර්වේෂියානු කලාකරුවන් සන්ගාත්මක මල්වලා බඳුන්, අධි මානුෂීය වයින්, විසින් හිස් ඇති සත්ව වයින්, මුහුදු දේවතාවන්, අප්‍රිකාවේ ගංගාවල වාසය කරන විශාල සතුන් වැනි දේ නිර්මානය කල හෙලන්ස්ටික් චිත්‍ර කලාවේ බලපෑම් වේ.

මතුර හි ඇති වෙනසට වඩා ගන්ධාර කලාක්‍රමයේ ඇති කථාවස්තු, නිදහස් ප්‍රතිමා කලාව ප්‍රසිද්ධියට පත්ව ඇත. ප්‍රතිමා විද්‍යාව සැලසුම් කිරීමේදී මෙම ආරය පළමු ඉන්දියානු කලායතන විශාල වශයෙන් අනුකරණය කරන ලදී. නමුත් කලාක්‍රමයේ වෙනසක් ඇත. කාලයට අනුව කලා ක්‍රමයට වෙනස් වෙමින් පැවැතියද නිතරම එය ක්‍රමානුකූලව පවත්වාගෙන යන ලදී. මෙම ආයතනය සිතෙහි හටගන්නා දරුණු හැඟීම් ඒ අයුරින් ඉදිරිපත් කිරීමට ප්‍රසිද්ධය. කරන නිපදවීම් පොලවට සමාන්තරව නිපදවීමට මෙන්ම නා නා කොටස් වලින් යුක්තව අවශ්‍ය අවකාශය රැවටිලිකාර අන්දමට ඇතිවන පරිදි රූප සෑදීමටත් මෙම ආයතනය දක්ෂතාවයක් දැක්විය කල්යාමේදී දකුණු ආසියාවේ පැවැති ප්‍රාදේශීය ක්‍රමය පළමුවෙන් තිබූ ග්‍රීක රෝමන් නිදහස් ආරය බලා එය අනුකරනය කිරීමට පෙළඹුනි. පිළිම කපරාදු කිරීමේ ක්‍රමයේ විවිධාකාර අළුත් බලපෑම් තිබුනත් ක්‍රමයේ විශාල වෙනසක් නොතිබූ බව පෙනේ. මෙම සම්මුතිවාදය සමඟ නිපදවන ලද විශාල කලාකෘති වලට සම්පූර්ණයෙන්ම එකලෙස පවතින අයුරින් යම් බලපෑමක් කරන්නට සිදුවිය. දකුණු ආසියාවේ ස්ථිර පැවැත්මක් නොමැතිව හා පැහැදිලි විදේශීය ලක්ෂණ සහිතව ස්වාභාවික දියුණුවක් මෙම ආයතනයට ලබාගැනීමට අවකාශ නොතිබිනි.



කැටයම් කලාව දැක්වෙන රූප



මල්මාලා දරන්නෝ



බුද්ධ සහ බෝධි සත්වයින්

අවසානයේදී එය ඉවත්වී යාමය හේතුවිය. කෙසේ වෙතත් එය මධ්‍යම හා දකුණු ආසියාවේ කලාවට විශාල පරිත්‍යාගයක් කරන ලද, අතර සමහර ලක්ෂණ පසුකාලයකදී ගුප්ත කලාවට ආදේශ කර ඇත.



ට්‍රයිටොන්වරුන්

ආරම්භයේදී බුද්ධාගම ආගමක් වශයෙන් නොව දර්ශන වාදයක් ලෙස සලකන ලදී. ලෝක සම්මත වාදය අනුව බුදුරදුන් හෝ අවබෝධය ලබාගත් අය, දෙවියෙක් නොව සිත් කාවද්දන ගුරුවරයෙකි, තවුස්බව හා තමන්ගේ අභිලාෂයන් සිතින් පතන මැදි පිළිවෙත අනුගමනය කල ගුරුවරයෙකි. ශරීරය විඳින දුක් වේදනාවන්ගෙන් සම්පූර්ණ නිදහසක් ඉන් බලාපොරොත්තු විය. සිත දියුණු කිරීමේ ආයතන වලදී. පසුකලකදී බුදුන් වහන්සේ

දේවත්වයෙන් සලකන ලද අතර වැඳුම් පිදුම් කිරීමට පටන් ගන්නා ලදී. මේ ප්‍රතිවිරුද්ධ සිතිවිලි නිසා ඇතිවූ ප්‍රතිඵලය නම් හීනයාන හා මහායාන නමින් ප්‍රතිවිරුද්ධ මතධාරීන් දෙකොටසක් බිහිවීමයි. පසුව සඳහන්කල ආගමික සංකල්පය ගන්ධාර ප්‍රදේශයේ 1 වන හා 2 වන ශතවර්ෂයේදී විශේෂයෙන් කුෂාන් රජවන කණිෂ්කගේ කාලයේදී එහි තදින් ප්‍රචලිතවිය.

මෙම සංකල්පයන් දෙකෙහි බිහිවූ කලාකෘතීන් වල විශාල වෙනසක් දක්වන ලදී. හීනයාන ඇදහීම් වලදී බුදුරදුන් නිරූපනය කරන ලද්දේ සංකේතයකින් හෝ බුදුරුවකින්. සංකේතයකින් නිරූපනය කරන විට බුදුන් වෙනුවට, සිංහාසනයකින්, පාද සලකුණකින්, කුඩයකින්, අසරුවෙක් නැති අශ්වයෙකුගෙන් බෝ රුකකින්, ශීර්ෂ ආවරණයකින් හෝ කිසිවකු මධ්‍යයේ නොමැතිව පාසගල් වටා රොක්වී සිටින කලබලකාරී ජනතාවක්. අනෙක් අතට මහායාන සංකල්පය යටතේ බෝධිසත්ව වරුන් පිරී සිටින දේවත්වයෙන් සලකන බුදුන්ගෙන් මධ්‍යය සැකසී ඇත. මෙය ඇත්ත වශයෙන්ම විප්ලවීය ප්‍රතිමා විද්‍යාව හා සෞන්දර්‍ය විද්‍යාව පිළිබඳ වෙනස් වීමකි.




බුදුන්ගේ හිස කොටස



භක්ති නමදීම

## කාල නිර්ණය

ගන්ධාර කලාවේ කාල නිර්නය පිළිබඳ කොතෙකුත් ප්‍රශ්න නැගී ඇතත් විද්වතුන් හට එයට නියම අයුරින් පිළිතුරු දීමට අපොහොසත්ව ඇත. මෙම සැකසහිත භාවයට තුඩුදී ඇත්තේ නියම දිනයක් පිළිබඳ ස්මාරක නොමැතිකමයි. එය කැටයම් කොටන ලද ප්‍රතිමාවක් සොයාගැනීමේ අපහසුතාවයක් නොවන්නට පුළුවන්. ප්‍රතිමාවල කොටා ඇති අක්ෂර නියම කාල වකවානුවක් සඳහන් නොවන නිසා ස්ථිර කාල වකාවානුවක් ගැන සඳහන් කිරීම අපහසුකාරණයක්ව පවතී. දකුණු ආසියාතික උපමහාද්වීපයේ ඉතා පැරණියේ සිට පුරුදු කරගෙන එන චාරිත්‍රයක් වන්නේ වර්ෂ සඳහන් කිරීමට පුරුදුව සිටින්නේ රාජාභිෂේකව සිටින රජතුමාගේ හෝ රජපෙලපතේ පළමු වර්ෂයේ පටන්ය. මේ අනුව කිසියම් හෝ කැටයමක් ස්ථිර කාලසීමාවක පිහිටුවීමට අපහසුව පවතී.



කණිශ්කගේ
හස්තිය

මෙම ප්‍රශ්නය නිරාකරණය කරගෙන තිබෙන්නේ ස්ථිර නොමැති දිනයක් ප්‍රතිමාවලට ආරෝපනය කර රෝම කලාවට ඒවා සම කිරීමෙනි. මෙම මට්ටම උපයෝගී කරගනිමින් පුරාවිද්‍යාඥයින් විසින් පෙශාවාර් අසල ෂා - ජී - කි - ඩේරි වල තිබී හමුවූ කණිෂ්ක රජුගේ ප්‍රසිද්ධ ධාතු කරඬුව හඳුනා ගෙන ඇත. එය මෙතෙක් හමුවූ පැරණිම භාණ්ඩය වශයෙන් සැලකේ. රජුගේ පළවෙනි වර්ෂයේ සිට එයට දිනය ආයෝජනය කර ඇත. ගන්ධාර යෙහි ඇති පුරාණ නිපැයුම් ගෙන බැලුවොත් එහි ශෛලීය, අතිපුරාණ ඉන්දීය ශෛලීය හා බටහිරින් ලබාගත් ප්‍රතිමා

ශිල්පයේ මිශ්‍රනයකි. මල්මාලා පැලැදි කාමුකයින් මංජුසාවේ බෙරය වටේ භ්‍රමනය වන දර්ශනය උදාහරණයකි. එම කාලයට අයත් එම ශෛලියෙන්ම ෂා- පි- කි- ඩේරි ඇති කණිෂ්ක ස්තූපයේ අඩිතාලම සකෝ ප්‍රතිමා වලින් සැරසීම ඊට උදාහරණයකි.

ක්‍රි : ව : දෙවෙනි හා තුන්වෙනි ශතර්වෂවල්දී චාරසද්ධ වල බුදුන් නිර්මානය කරමින් ඇති ප්‍රතිරූප පැරණිම හා හොඳම නිදර්ශනය වශයෙන් සඳහන් කල හැකිය. තක් - ඊ - බාහි හා ශහ්රී බාහ්ලෝල් ද මෙම කාලසීමාවට අයත්වන අතර එම කාල සීමාව මෙහි මුදුන් මල්කඩක් වශයෙන් පැවැති ජෝන් මාෂල්ගේ තක්ෂිලාවෙහි කරන ලද කැනීම්වලට අනුව එහි පැවැති ඉදිකිරීම් වල ස්වභාවය ක්‍රි : ව : දෙවෙනි හා තුන්වන ශතවර්ෂ වලට අයත් බැව් පැහැදිලි කරගෙන ඇත. මෙම



ශක්රි බහාල් ප්‍රතිමාව
-නෙළුම් මල් දරා සිටින අත

කැටයම් වලට භාවිතා කල රෙදිතිර ආදිය රෝමන් වරුන්ගේ අධිරාජ්‍ය කාලයේ ක්‍රියාවක් බව පැහැදිලිවම පෙනේ. මෙම ස්ථානයේ පසුව කරන ලද පරීක්ෂණ වල්දී අවබෝධ වූයේ මෙහි යොදා ඇති රෙදි ලනුවලින් සැදුනු දැලක් අකුලා තිබූ බවයි. පසුව සඳහන් කල ආකාරයේ ප්‍රතිමා ඇෆ්ගනිස්ථානයේ බෙග්‍රාම් පෙදෙසින් පැමිණ ඇත. සිනිඳු ස්ත්‍රියකගේ බඳු බුදුන්ගේ ඇපලෝ නියත් පළමු මුහුණු ස්වභාවය විදූනු ස්වභාවයක් ගන්නා වෙස්මුහුණක් වැනි ස්වභාවයට පත්විය. එය තුන්වන සිට පස්වන ක්‍රි : ව : දක්වා කාලයේ රෝම ප්‍රතිමා පුරාවස්තු හා සමකල හැකිය.

මීට ප්‍රථමයෙන් සඳහන්කල පරිදි මනුෂ්‍ය ස්වරූපයෙන් පළමුවෙන්ම බුදුරදුන් ඉදිරිපත් කිරීම ගැන ගන්ධාර කලා නිකේතනයට ප්‍රසංසා හිමිවී ඇත.



සකෝ හි බුදුන්ගේ හිස

ලකුණු වෙනුවට සිද්ධාර්ථ මනුෂ්‍යයෙකු වශයෙන් ඉදිරිපත් කිරීම කණිෂ්කගේ මහා සභාවේ බුදුදහමට ලැදි කණ්ඩායමේ කිසියම් හෝ සම්බන්ධ කරණයක් නිසා විය හැකියැයි සිතීමට ඉඩතිබේ. පසුකාලීන පුරාවස්තු පිළිබඳ ලෝකයාගේ බලපෑම් මත මුල් අවධියේ බුද්ධ පිළිම විදේශීය ප්‍රතිමා ශිල්පීන්ගේ නිර්මාණයක් බව පෙනේ. එවැනි පිළිම කණිෂ්කගේ - කාසිවල මෙන්ම ඔහුගේ ප්‍රසිද්ධ පූජනිය සා - ජී- කි - ඬේරි වල තිබී හමුවූ කරඬුවේද හමුවිය. නමුත් මෙහි ඇත්තේ සුළු පිළිම සංඛ්‍යාවකි. හේතුව ඒවා කුඩාවීමයි. නමුත් එය චාරිත්‍ර විධියක් වශයෙන් ගිනිය නොහැක.

කිසියම් හෝ සම්ප්‍රදායානුකල ගන්ධාර පිළිමයක් විග්‍රහකර බැලුවොත් එය පළමුවන ශතවර්ෂයේ පැවැති රෝමානු කලාවේ මුලාකෘති අනුකරණය කර ඇති බව බොහෝ විද්වතුන්ගේ මතයයි.



කණිෂ්ක යුගයේ කාසි



ටක්හි-ඊ-බාහි වල ඉඳගෙන සිටින බුදුන්ගේ පිළිරුව

## ගන්ධාර කලා ක්‍රමයේ ප්‍රතිමා නිර්මාණය

ගල්වලින් හෝ බදමයෙන් දීප්තිමත්ව පවතින්නේ ඉතා කෙටි කාලයකි. තුන්වන ශතවර්ෂය වැනි ඈත කාල සීමාවේදී පිළිම තෙලීම හා බදමයෙන් කරන වැඩ නතරවූ බව විශ්වාස කෙරේ. ක්‍රි: ව: 241 වැනි කාලයකදී සසේනියන් ආක්‍රමණය සිදුවන අවස්ථාවේදී ගන්ධාර කලා ක්‍රමය ප්‍රගුණ කල මධ්‍යස්ථාන වලදී ගන්ධාර බුදු පිළිම හමුවූ බව උදාහරණ වශයෙන් පෙන්වා ඇත. කුෂාන් රජපෙළපත අවසානයේදී මෙම කලා ක්‍රමය අවසානයක් දක්වා යාමට හේතුවූයේ රාජකීය සම්බන්ධතාවයක් නොමැතිවූ නිසා මිස ආක්‍රමනිකයන් කළ විනාශයක් නිසා නොවේ. මෙම දිනය හා ක්‍රි:ව: 450දී සුදු හැන්ස්වරුන් ආක්‍රමනය කළ දිනය අතර තුර වෙනත් ප්‍රධාන කාර්‍යයක් සිදුවී නැති බවට අනුමාන කෙරේ. මෙම කාලය තුලදී සිදු කරන ලද ප්‍රධාන විෂය වී ඇත්තේ, ගල්වලින් හා බදම වලින් කරන ලද විසිතුරු වැඩ අළුත්වැඩියා කිරීමයි. මෙම කාලසීමාවේදී කරන ලද කැටයම් වැඩ වලින් පෙන්වා ඇත්තේ



ගන්ධාර පාසැලේ ප්‍රසිද්ධ බෝධිසත්ව රූපය



හිස් පලඳනාවක් සහිත බෝධිසත්ව රූපය



මෛත්‍රිය බෝධිසත්ව - ස්වර්ණාභරන පැළඳගෙන සිටීම

සර්වභාවනීය වැඩ වලින් රෝමානු කලාවේ තාක්‍ෂණික අඳුරු කාලයට අවතීර්ණ වී ඇති බවයි. දකුණු ආසියා ජාතික බුද්ධිමතුන් විදේශීය ගුරුන් සමඟ කරණ ලද නුවමාරුවක ප්‍රතිඵලයක් ලෙස කල්පනා කරයි.

ගන්ධාරයේදී මුලින්ම නිර්මානය කලේ බුදුන්ගේ පිළිරුව පමණක් නොව බුදුවීමට බලාපොරොත්තු වන අවශ්‍ය ලක්‍ෂණ ඇතිව බෝධිසත්ව වරුන්ගේ පිළිරුවක්ද නිර්මාන කිරීම ගැන මෙම ප්‍රදේශයට ප්‍රණාමය පිදිය යුතුය. අවබෝධතා ඥාණය ලබාගෙන ඓතිහාසික අවස්ථාවේ බුදුබවට පත්වනතුරු ඊට පෙර ආත්ම වලදී ඔහු බෝධි සත්වයෙකි. මෙම පිළිමවල ඇති චරිත ගැන  බැලීමේදී ඒවායින් පිලිබිඹු වන්නේ දිව්‍යමය වගයෙන් ආරූඪ කර ඇති බෝධිසත්ව රූපයි. සමකාලීන ඉන්දියා රාක්සවරුන් වෙත ආරූඪ කර ඇති රාජකීය ස්වරූපය මෞර්‍ය හා සුන්ගකාල වකවානුවේදී යක්‍ෂයින් පිලිබිඹු කිරීම සඳහා යොදගෙන ඇත. ගන්ධාර බෝධිසත්ව වරුන්හට හිස් වැසුම්, සවර්ණාභරණ හා මුස්ලිම්වරුන් පළඳින සායවල් පළඳවා තිබුනේ කුෂාන් හා ඉන්දියානු ප්‍රභූන්ගේ නියම ඇඳුම් පැළඳුම් ආදේශ කරමිනි. තක්ෂිලාවේදී හා තවත් ස්ථාන වලදී ගොඩගන්නා ලද හෙලන්ස්ටික් හා සර්මාලියන් රන්රිදී ආභරණ වල අනුකරණයන් මෙම රාජකීය පිළිමවලට සමානව ඇත.

ගන්ධාරයෙහි බුදුන්ගේ හා බෝධිසත්ව පිළිම වලට අමතරව එහි ඇති තවත් විලාසිතාවන්ගෙන් පෙන්වන්නේ රෝමානු හා දකුණු ආසියානු කලාවන්ගෙන් පැවත එන කලා බොහෝ කලක සිට එහිවූ බවයි.


ගන්ධාර කැටයම් කලාව ගැන කරන ලද ගවේශනයේදී මුල්කාලයේදී ඒ සඳහා යොදගෙන ඇත්තේ එම ප්‍රදේශයෙන් පහසුවෙන් සොයාගත හැකි නිල්පාට ගල්පතුරු හෝ කොළපාට ද්‍රව්‍යයන් බව පැහැදිලිවිය. මෙය පසු කාලයේදී බිත්ති කපරාරුව සඳහා ප්ලාස්ටික් වගී යේදීමට අවස්ථාව සැලසීමකි. ක්‍රි:ව: පළවෙනි ශත වර්ෂය තරම් ඈත කාලයක පටන් ප්‍රතිමා නිර්මානයේදී කපරාදුව සඳහා සියුම් හුණුවගී යොදගෙන ඇති බැව් පෙනේ. ක්‍රි. ව. තුන්වන



කුමරුවකුගේ ඇඳුමින් සැරසී සිටින බෝධිසත්ව හිටි පිළිමය



රත්මාල



රත්රන් කන් පලඳනාවන්



ඇඟිල්ලෙ පලඳින රත්රන් මුදු



සිංහ හිසකින් කෙලවරවන රන් වළල්ල



රන් වළල්ල



රන් වළල්ල



රන් වළල්ල

ශත වර්ෂයේදී ස්තූප හා විහාර සැරසීමේදී එම මාධ්‍ය වෙනුවට ගල් යොදාගෙන ඇත. විද්වතුන්ගේ මතය අනුව ගෘහ නිර්මානයන් සැරසීමේදී සියුම් හුණුබදාම පළමුවරට යොදාගෙන ඇත්තේ ඉරානයයි. ක්‍රි. ව. 241දී සාසනියන් ආක්‍රමනය මුළු ගන්ධාරයේත් පසුව මුළු ලොව පුරාවත් සියුම් හුණුබදාමය යෙදීමට හේතුවිය.

පස්වන ශත වර්ෂයේදී සුදු හැන්ස්වරුන්ගේ බලවත් ආක්‍රමණයෙන් පසුවත් මුලින් සඳහන් කලාසේ, ගන්ධාර චිත්‍ර කලාව නොනවත්වා ඉදිරියට ගෙනගිය බව පෙනේ. එතෙක් ඉතුරුව පැවැති සිහිවටන කිහිපයක අළුත්වැඩියාවන් ගන්ධාර කාලසීමාවට වඩා ඔබ්බට ගෙනගිය බවත්, කාශ්මීරයේත් ෆොන්ඩුකිස්තාන් හා ඇෆ්ගනිස්තාන් වැනි ඉතා දුර බැහැර ප්‍රදේශවල එවැනි කලාකෘති ක්‍රි වඃ 7 වෙනි ශත වර්ෂය තරම් ඈත කාලයක් දක්වා නොනවත්වා කරගෙන ගිය බවත් ළපනේ.



ජව්ලියන්ගි වෝටිව් ස්තූප

පරිච්ඡේදය 5





# ගන්ධාර ගෘහ නිර්මාණ ශිල්පය




හොන්වුකිස්තාන් බෝධිසත්ව රූපය

ගන්ධාර ගෘහනිර්මාණ ශිල්පය, දකුණු ආසියානු තාක්ෂණයෙන්ම දේශියත්වය ගන්වමින් ශ්‍රේෂ්ඨ ලෙස විදහාපාමින් චිත්තාකර්ෂණීය ලෙස ගෘහනිර්මාණ ශිල්ප කලාව සරසා ඇත. බටහිර ආභාශයෙන් ලබාගත් ගෘහනිර්මාණ ශිල්පයේ පැහැදිලි ලකුණු පෙනෙන්නට තිබුනත් දේශීය නිපැයුම් වල තිබුනේ සිත් කාවද්දන සුළු ගතියකි. ගන්ධාර ගෘහනිර්මාණ ශිල්පයේ දියුණුව කරා ඉදිරියට යාමේ හේතුව බෞද්ධ චින්තනයේ තිබු ගුප්ත අදහස විදහා පෑමකි. පාට වීදුරු, විවිධ වර්ණයෙන් යුත් බිත්ති කපරාරුව හා පාට බදම යෙදීමෙන් මෙම ගොඩනැගිලිවලට ජීවයක් ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් ශතවර්ෂ ගණනාවක් තුල බෞද්ධාගම මත යැපුනු ගන්ධාර ගෘහනිර්මාණ ශිල්පයේ මුල ධාතුව වශයෙන් මෙම විචාරවත් තාක්ෂණය හේතුවු බව පෙනේ

## ස්තූප

විශාල වශයෙන් නිපදවා ඇති බෞද්ධ ගොඩනැගිලිවල පොදු ගෘහනිර්මාණ ශිල්පය පැහැදිලි ලෙස පෙන්නුම් කරයි. ඒවා ප්ලාස්ටික් කලාවන්ගෙන් අලංකාර කර ඇත.


විශේෂයෙන් ස්තූපවල මුළු බඳ පුරාම වේ. සෙසු ප්‍රදේශ වලින් පෙනෙන්නේ ඒවායේ සරසා ඇත්තේ ගරාවැටුණු හා ප්‍රවිෂ්ඨවීමේ දොරටුයි.




මොහ් රා මොරාදු-ස්තූප

මෞර්‍ය කාලයට අයත් පොන්චි හා බාරුට්වල ඇති මුල් යුගයේ සැරසිලි වලින් ගන්ධාර වල ඇති ස්තූප ක්‍රමානුකූලව සරසා ඇති බැව් පෙනේ. බෙරය ඇති හෝ නැති අර්ධගෝලාකාර ස්තූප වටකුරු බඳ සහිත. තත්ත්වයකට වර්ධනය වූනි. විශේෂයෙන් කිව යුතුව ඇත්තේ වැඩි අවධානයක් යොමුව තිබුනේ එහි උඩ කොටසටයි. බෙර නොහොත් සිලින්ඩරාකාර බඳවල් උස අතට එකතු කිරීමේදී ගන්ධාර ස්තූප සාමාන්‍යයෙන් කුළුණක හැඩය ගන්වන ලදී. ඒ අනුව අවසානයේ උස දැක්වූනේ උස නැති කුරුට්ටෙකු මෙනි. විශේෂයෙන් මෙයින් තීරණය කලේ මෙවැනි ආකෘති වලින් පසු මුල්කාලයේ චීනයේ ස්තූප බිහිවූ බවයි.

මුල්කාලයේ ස්තූප වල අඩිතාලම හතරැස් හෝ බෙරයක හැඩය ඇති වටකුරු එකක් විය. රවුම් බෙරයක ආකාර ස්තූප සඳහා හොඳම උදහරණ ඇත්තේ තක්ෂිලාවේ ධර්මරාජිකා මොහ්රා මොරාදූ වල හා ස්වට්හි සයිදූ ෂරීෆ්වල බූකාරාහිය, හතරැස් වර්ගයේ ස්තූප සඳහා හොඳම උදහරණය නම් කයිබර්පාස්හි දැනට විනාශකර ඇති අල්මස්ජිඩ් ස්තූපයයි. කැනුම්කරුවන් විසින් ප්‍රකාශකර ඇත්තේ එහි මුල් අවස්ථාවේ මීටර් 12කට වඩා උසනැති හතරැස් අඩිතාලම් දෙකකින් යුතු බෙර ආකාරයේ කොටස් සමහර විට මුල් අවධියේ තට්ටු දෙකකින්ද හර්මිකාවෙහි ඉහළ කොටස රඳවා තිබූ අතර අවසානයේ හකුලන ලද කුඩයක ස්වරූපයක්ද ගන්නා ලදී. එහි ඉදිරිපස කරන ලද සැරසිලි සෑම අතකින්ම ඉන්දියානු හා සමස්ත ලෝකයේම ශ්‍රේෂ්ඨ එකතුවකි එම ගන්ධාර කලාව.



සාන්චි ස්තූප : අලංකාර බාලුස්තුදේ සහ දොරටුව



බූත්කාරා ස්තූපය

බෞද්ධයන්ට මුල් අවධියේ ස්තූපය සොහොන් ගෙයක් විය. කාලයාගේ ඇවෑමෙන් එය සම්මානනීය වස්තුවක් බවට පත්වී වන්දනාමාන කිරීමේ වස්තුවක් බවට පත්විය. මෙය කලක් යාමේදී බුදුන් හා එවැනි පූජනීය තත්වයට පත්වූ අයගේ ඉතුරුවූ ධාතූන් තැන්පත් කිරීමේ අධ ගෝලාකාර වාසස්ථානයක් බවට පත්විය. කෙසේ වෙතත් පසු කාලයේදී බුදුන්ගේ හෝ ඔහුගේ අනුගාමිකයින්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා සිහිපත් කිරීම සඳහා ස්තූප ගොඩනගන ලදී කාලයාගේ ඇවෑමෙන් ස්තූප ධාතූන් මෙන්ම ස්මාරක වන්දනාමාන කරන ස්ථාන බවට පත්විය. ආගමට ලැදි භක්තිවන්තයින් ආගමික කුශලතාවයන් තකා පූජා භාණ්ඩයක් ලෙස ස්තූප විශාල ප්‍රමාණයක්

ගොඩනගන ලදී. බුදුන්ගේ පරිනිර්වානයේ සලකුනක් ලෙස ස්තුප සලකන ලද අතර එතුමාගේ රුව මනුෂ්‍ය ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමට පෙර එතුමාගේ රුව ගල්වලද කොටන ලදී.

භාරුට් හා සාන්චිවල ඇති ස්තුප වටකරන ලද්දේ ගරාදි වැටවලිනි. ගන්ධාරයෙහි මෙම ක්‍රම දක්නට නොලැබිණි. එහි දක්නට ලැබුණේ ඝනකම් ගෝලාකාර හෝ හතරැස් ඉතා උසට නිමකරන ලද බැම් වශයෙනි. ස්තුපයේ අඩිතාලම සරසා තිබුණේ බුදුන්ගේ ජීවිත චරිත පිළිබිඹු වන පරිදිය. ස්තුපයෙහි බඳෙහිද සමහර අවස්ථාවලදී කැටයම් පේළි වලින් සරසන ලදී.

නියමිත සැලැස්මක් මත ස්තුප ගොඩනඟන ලදී. ගෝලාකාර බෙරයක හැඩයට සහ භූගෝලාධිකාර අර්ධගෝලාකාර හැඩයකින් යුත් දිග හැරුණු කුඩයක ආකාර එකක් උඩ එකක් සිටිනසේ දීසි හතකිනුත් මේවාට චක්‍රයයි කියනු ලැබේ. මෙම චක්‍ර උඩ අතට සිටින කණ්ඩායමක් විසින් උසුලාගෙන සිටිනු ලැබේ. හර්මික නමින් හඳුන්වන හතරැස් පෙට්ටියක් තුළ මේවා තැන්පත්කර ඇත. ධාතුන් තැන්පත් කර ඇත්තේ ඒ හාර්මිකා නමැති පෙට්ටිය තුළය.



අලි මස්ජිඩ් ස්තුපය - කයිබර් පාස්



ධර්මරාජික ස්තුප



තක්ෂිලාවේ-සිර්කප් නගරය තුල ස්තූප

ඉතා පූජනීය ගොඩනැගිල්ලක් වන ස්තූප ඉතා ගාම්බීර පෙනුමකින් හා උසකින් යුතුව ගොඩ නගන ලදී. ස්තූප පිළිබඳ ඉතිහාසයේදී ඒවායේ රවුම් හැඩය එක් කොනක් ආරුක්කු වැනි නෙරාගිය හැඩයකින් පිහිටන ලෙස ඉදිකිරීමට අවශ්‍ය විය. එවැනි උදාහරණයක් තක්ෂිලා නිම්නයේ ඇත. පසුව නියම ගන්ධාර ක්‍රමය බිහි වූයේ ස්තූපය හතරැස් ලෙස නිපදවමිනි. එය රජමාලිගාවේ මිදුලේ මධ්‍යයේ ඉදිකරනු ලැබේ. මෙවැනි ස්තූපයන් තක්ඊ-බාහි රජමාලිගයේ ඇත. ගන්ධාරයෙහි මහායාන බුද්ධාගමේ බුදු දහම ඉගැන්වීම සඳහා සාදන ලද ස්තූප හා නියම ස්වරූපයෙන් ඉදිකරන ලද ස්තූප අතර ඇති වෙනස සමාදානයෙන් විසඳාගැනීමට හැකි ගිවිසුමක එළඹී ඇති බව පෙනේ.


## ආගමික ගොඩනැඟිලි ඉදිකරන ස්ථාන තේරීම

ගන්ධාර කොටසේ නගර අභ්‍යන්තරයේ ඇති බෞද්ධ ස්තූප හා සංඝාරාම සංඛ්‍යාව අතේ ඇඟිලි ප්‍රමාණයෙන් ගණන් කල හැක. මෙම ආගමික ගොඩනැගිලි නගරයේ වෙසෙන සාමාන්‍ය ජනයාගේ ප්‍රයෝජනය සඳහා පමණක් විය. කෙසේ වෙතත් සංඝාරාමයන් හා ස්තූපවලින් බොහොමයක් නගර සීමාවෙන් පිටත පිහිටා තිබුණි. පුරාණයේදී මෙම ආයතන වලට, පූජක පක්ෂයේ නැවතීම් ශාලාවලට 'සංඝාරාම' යනුවෙන්ද, වර්ෂා කාලවලදී බණ දේශනා කරමින් සැරිසරණ භික්ෂූන්ට ආවරණය සැලසීම සඳහා ඉදිවූ රාජකීයත්වයෙන් පෙනී සිටි 'විහාර' ද විය. මහජනයාගෙන් පිරුණු නාගරික පරිසරයෙන් බැහැර මෙම ස්ථාන ඉදිකිරීම සඳහා තෝරාගෙන තිබුණේ නිසංසල, සංසුන්, හා නිශ්චල පරිසරයක් ඇති ස්ථානයයි. නමුත් භික්ෂූන් නොහොත් පැවිදි අයට ජීවත්වීමට සිදුවූයේ දිනපතා පිණ්ඩපාතයේ වඩිමින් නිසා මෙම නැවතීමේ ස්ථානද පිහිටුවීමට සිදුවූයේ, විශාල නගර හෝ නගර පෙනෙනතෙක් මානයේයි. මේ පූජනීය ස්ථාන පිහිටුවීමේදී, ඒවා පිහිටවිය යුත්තේ කෙසේද යන්න, ආගමික පොත්පත්වල සඳහන් වී තිබේ. විශ්‍රාමික ජීවිතයකට සුදුසු, මිනිස් වාසයෙන් තොර, මිනිසුන්ගේ ගඳ

සුවඳින් තොර, රාත්‍රියේදී ශබ්දයකින් හෝ අනතුරුවලින් තොර, දිවා කාලයේදී මිනිසුන් රංචු නොගැසෙන, සියලු දෙනාට පහසුවෙන් ළඟාවිය හැකි, යාමට ඒමට සුදුසු, නගරයෙන් ඉතා දුර බැහැර නොවන හා ඉතා ලංනොවන ස්ථානයක් ගැන එහි සඳහන් වේ.

## ආරාම වර්ග

තක්ෂිලා, පෙෂවාර් හා ස්වෙට් නිම්න, ඩර් සහ ඇෆ්ගනිස්ථානයේ නොයෙකුත් ප්‍රදේශවල කරන ලද කැනීම් වලදී ගන්ධාර ගෘහනිර්මාණ ශිල්පය ගැන දන්නා කරුණු වලට බොහෝ අළුත් දේ එකතු කර ඇත. ඉදිකිරීම් ශිල්පයේදී නොයෙක් ස්ථානවල, විශේෂයෙන් තක්ෂිලාවේ කරන ලද කැනීම්වල පෙදරේරු වැඩ මුල් කරගෙන ගන්ධාර ගෘහනිර්මාණ ශිල්පයේ කාල නිර්නයන් සර් ජෝන් මාෂල් විසින් ප්‍රකාශයට පත්කර ඇත. ලොකු හා කුඩා විවිධාකාර ගල් මිශ්‍රනයකින් යුතුව ගොරෝසු පෙදරේරු ක්‍රමයකින් පාතියන් කාලසීමාවේදී  මුල් යුගයේ ගොඩනැගිලි තනා ඇත. ඊළඟ කාලසීමාව වන පැරණිම බුද්ධ කාලයේදී විවිධාකාර සිත් අලවන වෙනස් ක්‍රමයක් වන ලොකු ගල් අතරට කුඩාගල් යොදමින් ගොඩනැගිලි වැඩ නිමකර ඇත. ගන්ධාර ගෘහනිර්මාණ ශිල්පයේ අවසාන යුගයේදී විශේෂයෙන් ක්‍රි.ව. 3 වන ශතවර්ෂයේ පටන් යොදාගෙන ඇති පෙදරේරු ක්‍රමයේ විශාල වෙනසක් සිදුකර ඇත. විශේෂයෙන් තක්ෂිලාවේ යොදාගෙන ඇති මෙම ක්‍රමය ගල්පේලි අතරට ගලින් නිමකර ඇති හතරැස් නිර්මාණ ඉතා විශාල වශයෙන් දක්නට ලැබේ.



තක්ෂිලාවේ, සර්කප්හි, විවිධ කාලපරිච්ඡෙදවලට අයත් මේසන්වැඩ ක්‍රම


පාතියන් කාලසීමාවේ තක්ෂිලාවේදී ලෝනික් ක්‍රමය ගොඩනැගිලි තැනීමේදී භාවිතා කළ අතර කුෂාන් කාලසීමාවේදී ගොඩනැගිලි ඉදිකිරීමේදී කොරින්තියන් වරුන් ප්‍රධාන නගර වල යෙදවූ අතරම රෝමානු මූලාදර්ශ තිබූ බවට උදාහරණ වශයෙන් සිරියාව හා පලස්තීනය ගත හැකි බව රෝලන්ඩ්ගේ මතයයි.

පරිච්ඡේදය 6

# ගෘහ නිර්මාණ ආදර්ශන

## I. තක්ෂිලා නිම්නය






ඉදිරිපත් කරන ලද ගෘහ නිර්මාණ ආදර්ශන වලින් බොහෝමයක් සොයාගෙන ඇත්තේ තක්ෂිලා නිම්නයෙනි. මෙම නිම්නයේ ගෘහ නිර්මාණ සෝදිසිකර බැලීම්වලින් බොහෝමයත් නගර තුනකවූ ශේෂයත් වේ. ඒවානම්, බිර්මවුන්ඩ්, සින්කප් හා සිර්සක්ය. එපමණක් නොව තවත් සංඝාරාම හා ස්තූප වන ධර්මරාජික, ස්තූපය හා සංඝාරාම, මොහ්රා, මොරාඩු ආදී සංඝාරාමද වේ.

ඉතා ප්‍රසිද්ධ පෞරානික ග්‍රීක් නගරයක් වන තක්සාස්හිලා නොහොත් තක්ෂිලා සමඟ ෂංඩේරිවල ලක්ෂණයත් ඇති තක්ෂිලා නිම්නයේ ගොඩැල්ල පළමුවෙන්ම හඳුනාගෙන ඇත්තේ සර් ඇලෙක්සැන්ඩර් විසිනි. එකල චිත්‍ර හා විද්‍යාව ඉගැන්වූ ප්‍රසිද්ධ ඉගෙනීමේ මධ්‍යස්ථානයක් හා විශ්ව විද්‍යාලයක් වූ එම නගරය ඉගෙනීමේ මධ්‍යස්ථානයක්ව තිබුණි. තක්ෂිලාව හා අවට සංඝාරාම බොහෝමයක් සහ ස්තූප වලින් ගොඩගත් බොහෝමයක් දේවලින් කියාපාන්නේ, එකල තිබූ බුද්ධාගමේ අගය සහ එය මහජනයා අතරේ ප්‍රචලිතව තිබූ ආගම බවත් එහි තිබූ කලාව සමකාලීන කලාවන් අභිබවා තිබූ බවත් පවසයි. ආගමානුකූල මධ්‍යස්ථාන හා නගරවලින් ශේෂවී පවතින ගන්ධාර කලාවේ ශ්‍රේෂ්ඨත්වය එයින් පිළිබිඹුවේ.

## 1. පළමුවන නගර පෙදෙස - බීර් මවුන්ඩ්

තක්ෂිලා නිම්නයේ පළමුවන නගර පෙදෙස වන බීර් මවුන්ඩ් තුන්වරක් විනාශකර දමන ලද නමුත් නැවත ඉදි කරන ලදී. ක්‍රි.පූ. පස්වන / හයවන ශතවර්ෂ වල පටන් ක්‍රි.පූ. දෙවෙනි ශතවර්ෂය දක්වා කාලය තුල මෙහි



බාගිර් මවුන්ඩ්: පළමුවන නගරය පිහිටි තැන

පදිංචිව සිටි අතර බැක්ට්‍රියන් ග්‍රීක්වරුන් එය තවදුරටත් ඊසාන දිග කොටසට රැගෙන යන ලදී. මෙහි කරන ලද කැනීම් වලින් හෙළිවී ඇත්තේ මෙහි කරන ලද ඉදිකිරීම් පිළිවෙලකට නොතිබූ බවයි. වීථිවල බොහෝ ස්ථාන පටුවූ අතර ගෙවල් සැලසුම් අපිළිවෙලකට තිබුණි.

## 2. දෙවෙනි නගර පෙදෙස - සර්කප්


ක්‍රි.පූ. දෙවෙනි ශතර්ෂයේ පළමුවන කාර්තුවේ ග්‍රීක්වරුන් විසින් දෙවෙනි නගරයට අත්තිවාරම් දමන ලද අතර එය ඔවුන්ගේ පුරුදු චෙස් - බෝඩ් ආකාරයේ, වීථි එකක් හරහා එකක් යමින් අංශක 90 කෝනාකාර විධියට ගොඩනැගිලි පිහිටුවන ලදී. මෙම නගරයන් විනාශවෙමින් නැවත ඉදිකිරීම් වලට මුහුණ දුන්නත්, ඔවුන් පදිංචිව සිටි අවසාන කාලය දක්වා ග්‍රීක්වරුන් විසින් දමන ලද මුල් අඩිතාලම් ඉතුරුවී තිබුනි. කුෂාන් වරුන් එම නගරය ක්‍රි.ව. දෙවෙනි ශත වර්ෂයේදී අළුත් පෙදෙසක් වෙත ගෙනගිය අතර සර්කප්වල කොටසක පදිංචිය ටික කාලයක් යන තුරු පවත්වන්නට ඇත.

සර්කප් නගරය ඕනෑවට එපාවට ගොඩනගන ලද්දක් නොවූ අතර, එය නියම සැලැස්මක් මත ගොඩනැංවූවක් හෙයින් ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරන අයුරින් ග්‍රීක්වරුන් පෙදෙසක් සෙවීමේ නිරතවිය. ග්‍රීක නගර නිර්මාණ ශිල්පියා විසින් උතුරු දෙසින් පිහිටි හාතියාල් නෙරූ බැවුම එහි උතුරු දෙසින් ඇති හොඳාකාර පිහිටි සාතුව ඉදිරිපත් කරන ලදි. එහි බටහිර දෙසින් ඇති තම්රා නුල්ලාත් උතුරු දෙසින් ඇති ගුආනුල්ලාත් පරිහරණය සඳහා අවශ්‍ය ගලායන වතුරද නගරයේ ආරක්ෂාව සඳහාද සුදුසු විය.



සර්කප්-ප්‍රධාන නගරය

ආරක්ෂිත බැම්ම මුළු නගරය වටාම දිවෙයි. එය සාදා ඇත්තේ, ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද ගොරෝසු ගල්වලිනි. එහි ඝනකම මීටර් 4.5 සිට 6.5 දක්වා වෙනස් වේ. බටහිර සැලැස්ම සමභූමිය දෙසට ක්‍රමානුකූල නොවන අතර උතුරු හා නැගෙනහිර දෙසට එය කෙලින් දිවේ. දකුණු දෙසට කන්දේ සමෝච්ඡ රේඛාව දක්වා දිවේ. තැන් තැන් වලින් බහුනත දිගේ පස් මුද්‍ර හැඩයකින් යුතු අට්ටාල යොදා ඇත. ප්‍රධාන කැනුම් කරු සර් ජෝන් මාෂල් විශ්වාස කරන්නේ මේ අට්ටාල සමහර විට තට්ටු දෙකක් හෝ තුනක් සහිත ඒවා විය හැකි බවයි. ස්ථිර අත්තිවාරමකට උඩින් කුහර හා සිදුරු සහිතව ඒවා පිහිටා ඇත. පිටතින් ඇති බිත්තිය හා සම්බන්ධ වන





සර්කප් නගරයේ සැලැස්ම



ස්ථාන වලට උඩින් කපොලු ඇති අතර එහි ඇතුල් පැත්තේ තට්ටු සාදා ඇත්තේ ආරක්ෂකයින්ගේ ප්‍රයෝජනය සඳහායි. උතුරු බිත්තියේ පිටපැත්තේ මීටර් 7.6 දිග තට්ටුවක්ද තනා තිබුනේ එහි දැඩි බවේ ශක්තිය වැඩිකිරීම සඳහාය.

එකක් එක පැත්තකට සිටිනසේ නගරයේ ගේට්ටු හතරක් තිබූ බවට විශ්වාස කිරීමට හේතු ඇත. කෙසේ වෙතත් කැනුම් කරුවන්ට හමුවී ඇත්තේ උතුරු දිග බිත්තියේ සාදා තිබුණු එවැනි ඇතුල්වීමේ ස්ථානයක් පමණි. ප්‍රධාන මාර්ගයේ කෙලවරේ මෙම ගේට්ටුව යොදා තිබුණේ සමහරවිට ආක්‍රමණිකයින්ගේ හදිසි පහර දීමක් පරීක්ෂා කිරීමට හෝ ප්‍රධාන වීථියේ එකතුවන වැහිවතුරේ වේගය අඩුකිරීමට ගේට්ටුවට පහලින් ඇති විශාල බෝක්කුවට මුදා හැරීම පිණිස විය හැක.








කොරින්තියන් මිනිස්රූප සහිත කුළුණු මුදුන්

මෙම භූමියේ කරන ලද කැනීම් වලින් නගරයේ බොහෝ වැදගත් දේවල් සොයා ගැනීමට හැකිවී ඇත. ලම්බාකාර අතට කරන ලද කැනීම් වලදී මීටර් 5 සිට 7 දක්වා දුරක භූමි තට්ටු 7 ක වර්ෂ 300 සිට 400 දක්වා කාලයක දේ අනාවරණය කර ගැනීමට හැකිවී ඇත. සොයාගන්නා ලද දේවලින් අනාවරණය වී ඇත්තේ ග්‍රීක් අවධියට පෙර මෙහි ජනාවාසයක් තිබූ බවත් එය බර්මවුන්ඩ් නගරයේ උපනගරයක් වී තිබූ බවටද විශ්වාස කෙරේ. ඉතිරිවී තිබූ දේවලින් හයවන තට්ටුවෙන් අනාවරණය වී ඇත්තේ එය බැක්ට්‍රියන් ග්‍රීක්වරුන්ගේ නගරයක්ව තිබූ බවයි. ක්‍රි.පූ. 190 සිට 90 දක්වා කාලයේ ග්‍රීක් ජනාවාසයක්ව තිබූ බවට පස්වන තට්ටුව පෙන්නුම් කරයි. හතරවන තට්ටුවේ සිට දෙවන තට්ටුව දක්වා ක්‍රි.පූ. 90 සිට 25 දක්වා කාලයක සකා වරුන්ගේ වාස භූමියක්ව තිබූ බව පැහැදිලි කරයි. ක්‍රි.ව. 30 දී ඇතිවූ භූමිකම්පාවකින් විනාශවූ ගොඩනැගිලි පාතියන් වරුන් විසින් නැවත ගොඩනගන ලදී. මුදුන් තට්ටුවෙන් පැහැදිලි වන්නේ කුෂාන් වරුන්ගේ අල්ලා ගැනීමෙන් පසු මෙම ජනවාසය සර්සුක්වල තුන්වන ජනාවාසයට ගෙනගිය බවයි.




තක්ෂිලාවේ - සර්කප් නගරයේ සන්බුන්වල සාමාන්‍ය දර්ශනයක්


දෙවෙනි භූමි තට්ටුවේ ඇති සොයාගැනීම් දැන් පෙනෙන්නට තිබේ. නගරයේ සැලැස්ම පැහැදිලිවම හඳුනාගත හැකිය. ප්‍රධාන වීථිය ගිණිකොන අතට නගරයේ මුල පටන් අගදක්වා නගරය දිගේ විහිදී ඇත. බොහෝමයක් ගොඩනැගිලි කපරාදු කර හෝ සුදුහුනු ගා හෝ පාට කර ඇත. වීථියේ දෙපසින්ම කඩසාප්පු තිබී ඇත. ප්‍රධාන වීථියේ දෙපසින්ම තරමක පරතරයක් ඇතිව කුඩා වීථි තිබී ඇත. ප්‍රධාන වීථිය අසලින් පූජනීය ගොඩනැගිලි විහාර හා ස්තූප පිහිටා ඇත. බටහිර දෙසින්, අනිවාර්යයෙන්ම රාජකීය මාලිගාවක් ප්‍රධාන වීථියට මුහුණලා දකුණු දෙසට වන්නට පිහිටා ඇත.

ඉහත සඳහන් කල රජමාලිගාවට අමතරව පහත නගරයේ දකුණු දෙසට වන්නට ඇති උස්භූමියේ ගොඩනැගිලි සංකීර්නයක් පිහිටා ඇත. කැනුම් කරුවන් විසින් මෙම ගොඩනැගිලි සමූහයට 'මහල්' යන නම යොදා ඇත. ඇත්ත වශයෙන්ම මෙය විශාල කාමර ඉඩකඩ ඇති විවෘත ශාලාවන්ගෙන් සමන්විත රාජකීය මාලිගා බව පෙන්වයි. කපරාදු කර තිබූ ගෙවල් වැනි ගොඩනැගිලි ක්‍රි.ව. 1 වෙනි ශතවර්ෂයේ බිහි වූ ඒවා බව සැලකිය හැකිය. පහළ වීථියේ තිබූ රජමාලිගා වලට සමකාලීනව මේවා ඉදිකර ඇත.

සර්කප් වලින් ගොඩ ගන්නා ලද පැරණිදේ අතර විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත්තේ රිදී ආභරණ හා ස්වර්ණාභරණ හමුවී ඇති බවයි. කුඩා කාමරයක පොලොව යටින් ගොඩගෙන ඇති ඒවා අතර රත්තරන් කරාබු, පෙන්ඩන්, වළලු, මෙඩ්ල්ස්, ඇබරුමක් (ටෝර්ක්) සහ මාලයක් ද වේ. රිදී භාණ්ඩ අතර මාල, ජෝගු, ගුරුලේත්තු, කෝප්ප, ලොකු භාජන, පිගන් හා පීරිසි ආදිය වේ. කැනුම්කරුවන් සඳහන් කරන්නේ, නගරයේ අනෙකුත් ස්ථානවල තිබූ වටිනා වස්තු මෙන් කුශාන් වරුන් තක්ෂිලාව අල්ලාගන්නා ලද අවස්ථාවේ පොළොවේ වලලා තිබූ බවයි. තවත් වැදගත් සොයාගැනීමක් වන්නේ ඔලුදෙකේ රාජාලියා සිටින ස්තූප පිහිටි සංඝාරාමයේ තිබී හමුවූ ආර්මේනියන් ශිලාලේඛනයයි. තක්ෂිලාවේ පාලකයා බවට පත්වූ 'ප්‍රියදර්ශී' නමින් හැඳින්වූ අසෝක කුමරුට උසස් පදවි ලැබීමේ ගෞරවය පිණිස මෙම කුළුන ඉදිවූ බව ශිලාලිපියෙන් පෙන්නුම් කරයි. එක් අතකින් එම ශිලා ලිපිය මෙහි ඇති දේවල්වල කාලය තීරණය කිරීමටත්, අනෙක් අතින් ඉතා වැදගත් වන්නේ ආර්මයික් වරුන්ගෙන් තක්ෂිලාවේදී කාරෝස්ති ලේන් කලාව ලබාගත් බවයි.



සර්කප් නගර ප්‍රදේශයේ සාමාන්‍ය දර්ශනයක්



සර්සුක් ප්‍රදේශයේ සාමාන්‍ය දර්ශනයක්

## 3. තුන්වෙනි නගර පෙදෙස - සර්සුක්

දැනට සර්සුක් නමින් හඳුන්වන තුන්වන නගරය පිහිටා ඇත්තේ සර්කප් වලින් කිලෝමීටර් කිහිපයක් දුරින් ලුන්ඩි ගඟේ ඊසාන දිග තොටේදීය. මධ්‍යම ආසියාවේ ශෛලීය අනුව එහි පිහිටීම කුෂාන් කාලය තෙක් දිවයයි. එය ගොඩනඟා තිබුණේ දල වශයෙන් කිලෝමීටර් පහකට වඩා තරමක් අඩු ප්‍රමාණයකින් යුත් සමන් ත්‍රාසයකය. එය ගොරෝසු නිමාවක් වෙනුවට සිනිඳු චිත්‍රකුලයකින් නිමාකල ආරක්ෂක බැම්මකින් වටකර තිබුණි.

ඉහත සඳහන් කළ ලෞකික නිමාවකින් යුත් ගෘහනිර්මාණ ශිල්පයෙන් සමන්විත නගර ප්‍රදේශ තුන හැරුණුවිට ආගමානුකූලව නිමාවට පත්, චෛත්‍ය පිහිටි ස්මාරක ප්‍රධාන වශයෙන් ස්තූප හා භික්ෂු ආරාමද එහිවිය. ඒවායින් වඩා වැදගත් ඒවා පහත දක්වා ඇත.





වැසිකිලි පෝච්චි



ධමරාජිකා, ස්තුපයේ ආසන්න දර්ශනයක් - නිරිත දෙසින් (දු.බ.)

## 4. ධර්මරාජික ස්තුප හා භික්ෂු ආරාම

ගංගා මිටියාවතේ කරන ලද පරීක්ෂණ වලින් පෙනී යන්නේ ගන්ධාර කාලසීමාවේදී සොයාගන්නා ලද දේවල සංඛ්‍යාව දකුණු දිග් භාගයේදී ඉතා විශාල බවයි. එයින් වඩාත්ම පැහැදිලිව ඇත්තේ ධර්මරාජික නොහොත් චීර්ටෝප් ස්තුපය හා සංඝාරාමයයි. අශෝක අධිරාජයා විසින් බුදුන්ගේ පිළිරුව පිහිටුවීම සඳහා තෝරාගත් මෙම බිම්කඩ පූජනීය ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් වෙන් කරන ලද ඉතා වටිනා බිම් කොටසකි. මෙම භූමිය පිහිටා ඇත්තේ පළමු නගරය වන බීර් මවුන්ඩ් වලට කිලෝ මීටර් කිහිපයක් උතුරින් හා ඉමාරා උල්ලා නොහොත් ස්වාභාවික ජල පෙදෙස අසබඩිනි. ධර්මරාජික යන නම එයට ආරූඪ වී ඇත්තේ බුදුන්ගේ පිළිරුව ආවරණය වන පරිදි එම ස්තුපය ගොඩනගා ඇති බව විද්වතුන් පිළිගන්නා නිසයි. එසේම බුදුරදුන්ගේ ධාතුන් වැඩිකොටසක්








වැසිකිලි පෝච්චි

ඇතුළත් වන පරිදි ඉදිකරන ලද ස්තූප රජතුමා විසින් (අශෝක රජු) කරවන ලද හෙයින් ඒවාට ධර්මරාජිකා යන නම පටබැඳුනි. ස්තූප වලට අනෙක් නම වන චීර්ටෝප් සෑදුනේ, ස්තූපවල මුදුනින් බැස සොරුන් විසින් ස්තූප වල තිබූ වස්තුව සොරාගත් නිසා එයට මේ නම පට බැඳුනි. මෙම නම මෑත කාලයේදී ඇති වූවක් බව පෙනේ.

ප්‍රධාන ස්තූපය හැඩයෙන් රවුන් වූවා මෙන්ම තක්සලාවේ අනෙක් ස්තූප වලට වඩා විශාලත්වයෙන්ද පැහැදිලි බවකින්ද යුක්ත විය. එහි වටේට තට්ටු හතරකින් සමන්විත පඩිපෙලක් තිබූ අතර එහි සෑම තට්ටුවක්ම කිසියම් හෝ වැදගත් කමකින් යුතු ස්ථානයකට යොමුකර තිබුණි. ස්තූපයේ පාදයේ සිට එම පඩිපෙලේ තට්ටු හතර වන්දනා කරුවන්ගේ පෙලහැර මාර්ගය වශයෙන් යොදාගැණිනි. කැනුම් කරුවන් විසින් සොයාගන්නා ලද පරිදි වන්දනා කරුවන් ගමන් කල මාර්ගය කිසියම් බදාම වර්ගයක් යොදා සකස්කර තිබූ අතර තවත් කොටසක් හක්ගෙඩි හා වලලු ඔබ්බවා නිමකර තිබූ බවත්, එය නැවත අළුත් වැඩියා කරන අවස්ථාවලදී, වෙනත් ස්ථානවල ප්‍රයෝජනයට ගැනීම සඳහා ගලවා ඉවත්කර ඇති බවත් පෙනේ.

ස්තූපයේ පහළ කොටසේ ඇති විශේෂ ලක්‍ෂණයක් වූයේ ස්තූපයේ නැගෙනහිර දෙසින් පඩිපේලියේ වම්පස කොටසේ කුළුනක හැඩයක් පෙන්වීමයි. බෞද්ධ ස්තූපවල දක්නට ඇති පරිදි සිංහයෙකුගේ රූපයකින් එය ඔසවා සිටීමට සැලසුම් කල හැකිවී තිබුණි.

ස්තූපයේ මධ්‍යය ගොරෝසු ගල්වලින් සකසා ඇත. එතරම් විශාල සංඛ්‍යාවකට ශක්තිය ලබාදීම සඳහා නියමාකාර නොවන බිත්ති දහසයක් මධ්‍යයේ සිට ඉදිකර ඇත. මෙම බිත්ති අත්තිවාරමේ සිට එක්තරා මට්ටමකට




ධර්මරාජික ස්තූප සැලැස්ම

සිටින සේ නිමවා නොමැති බව පෙනීයන හෙයින් මේවා පසු කාලයකදී යොදා ඇති බව විශේෂයෙන් කණිෂ්කගේ කාල සීමාවේදී විනාශයට පත්වූ ගොඩනැගිලි නැවත ප්‍රතිසංස්කරණය කරන අවස්ථාවේ විය හැක. පඩිපෙල පැරණි කාලයේ අර්ධ බදාම තට්ටුවකින් නිමකර ඇති බවක් පෙනේ. 5 වෙනි හෝ 4 වෙනි ශතවර්ෂයේ අගභාගයේදී බෙරයේ පහළම තට්ටුවට ඉහළින් අලංකාර ගල්වැඩ වලින් සරසන ලදී.

ප්‍රධාන ස්තූපය වටා පසුකලකදී කුඩා ස්තූප ගොඩනගා ඇත. ධර්මරාජිකාවේ පෙරහැර මාර්ගය වටා වලල්ලක ආකාරයෙන් මේවා ඉදිකර ඇත. ක්‍රි.පු. පළවෙනි ශතවර්ෂයේ අගභාගයේදී කරන ලද කැනීම් වලදී සකා රජවරුන් වන මාවුයෙස් හා 1 වෙනි ඒසස් ගේ කාර්යය මෙම ස්තූපවල කරඩු වලින් සොයාගෙන ඇත. ක්‍රි.ව. 25-30 අතරතුර කාලයේ දී ඇති වූ භූමිකම්පාවක දී මෙම ගොඩනැගිලිද එයට හසුවිය.

විශාල විනාශයකට පසු ඊළඟ ගොඩනැගිලි අවධිය පටන්ගන්නේ ප්‍රධාන දොරටු හතරේ පඩිපෙලවල් ඉදිරියේ දොරටු ඉදිකිරීමෙනි. ඒ සමඟම ඒ වටා කුඩා දෙව්මැදිරිද ඉදිවිය. මුල් කාලයේ තිබූ විශිෂ්ඨ නිර්මාණයකින් හෙබි පෙදරේරු වැඩ අභාවයට ගොස් තිබූ අතර ගෘහ නිර්මාණ ශිල්පයේ විශාල දියුණුවක් පෙන්නුම් කරයි.
තරමක් උතුරු දෙසට බර වෙමින්, නැගෙනහිර දෙසින් තවත් විශාල ස්තූපයක නටඹුන් තිබේ. ඊට අමතරව හතරැස් අඩිතාලමක් මත ගොඩනැගූ තවත් විශාල සැයක නටඹුන් තිබේ. එය ක්‍රමයෙන් බෑසයන කොටස් තුනකට බෙදා වෙන්කර ඇත. එහි මුදුනින් ඇති කොටසේ පුරුදු ලෙස බෙරය සහ ගීවරය පිහිටා ඇත. එහි මන්දිරය කිහිප වරක් අළුත්වැඩියා කර ඇත. එහි සාමාන්‍ය නිර්මාණය හා පෙදරේරු වැඩ සැලකිල්ලට ගනිමින් පුරාවිද්‍යාඥයින් එය දෙවෙනි ශතවර්ෂයේ අගභාගයේ ගොඩනගන ලද්දක් බවට එළඹ සිටී.

ප්‍රධාන ස්තූපය වටා දෙව් මැදුරු දුසිම් ගණනක් එමභූමියේ විසිරී පවතී. ඊට අමතරව විශාල නිවාස සමූහයක් ධර්මරාජිකා අවට ඇත. ඒවා මහා මන්දිරය දෙසින් පේලි තුනකින් යුතුව බටහිර හා උතුරු දෙසින් පිහිටා ඇත. මේ සියල්ලක්ම ගල්මිශ්‍ර බදාමයෙන් නිමවා ඇත්තේ සකා කලා සීමාවේ අවසාන භාගයේයි. පසුව ඒවා අළුත්වැඩියා කර ඇත්තේ මහත් විනාශකාරී ආපදාවකින් පසුවයි.


මෙම භූමියේ උතුරු දිග කොටසේ ප්‍රධාන සංඝරාම ඉදිකර තිබුණි. ඒවා පළමුවන ශතවර්ෂයේ සිට හයවෙනි හෝ හත්වෙනි ශතවර්ෂය දක්වා ප්‍රධාන කාලසීමා හතරකට අයත් විය. සංඝයා වහන්සේලාට අතිරේක ඉඩපහසුකම් ලබාදීම සඳහා දෙවෙනි තුන්වෙනි ශතවර්ෂවලදී ඇත උතුරු දිග කොටසේ විශාල සංඝාරාම ප්‍රමාණයක් ඉදිකරන ලදී. මෙම භූමියේ පළමුවෙනි වතාවට හොඳින් සැලසුම් කළ හතරැස් කාමර සහිත ගොඩනැගිලි ඉදිකරන්ට යෙදුනි. මෙම භූමියේ උතුරු දිග්භාගයේ ප්‍රාකාරයේ පිටුපසට යාබදව හතරැස් කාමර සහිත කපරාදු කල විශාල ගොඩනැගිලි ඉදිකර තිබුණි.



ධමරාජිකා ස්තූපයේ ආසන්න දර්ශනයක්


මෙම කැනීම් වලදී විශාල වශයෙන් සොයාගත් මුදල් කාසි වලට අමතරව මහා ව්‍යසනයකට හසුවූ ලකුණු සහිත මිනිස් ඇට සැකිලි හයක්ද ගින්නෙන් දවා අළුකල ගොඩනැගිලි ද හමුවිය. පස්වන ශතවර්ෂයේ අගභාගයේදී සුදු හැන්ස්වරුන්ගේ ආක්‍රමණය මෙම විනාශයට හේතුවූ බව කැනුම් කරුවන්ගේ අදහස වී ඇත. සම්පූර්ණයෙන් දැවී නොගිය බර්ච්ගසේ පොතුවලින් සාදන ලද, හමුවී ඇති බ්‍රහ්මී අක්ෂර පිටපතේද

- විශාල වශයෙන් කරන ලද සංහාරයක් පිළිබඳ, විස්තර සඳහන්වේ.
- මිනී ඇටකටු පවා හමුවීමට තරම් මෙම සංහාරයෙන් පසු පළමු තිබූ තත්ත්වයේ මහේශාක්‍ය භාවයක් එම ස්ථාන වල නැවත ගොඩනැගීමට නොහැකි විය.



තක්ෂිලාවේ ධම්රාජික ස්තූප හා සංඝාවාස

මෙහි ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ යම් කාල සීමාවකට පසුව ස්තූප හා දේවාල අළුත්වැඩියා කිරීමට උත්සාහ දරා ඇති බවත් පදිංචි නිවාස තරමක් දුරට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කළ බවත්ය. පළමුවෙන් කරන ලද වැඩ හා සංසන්දනය කර බැලූවිට අලුතෙන් කරන ලද වැඩ මඩකිළුටු ස්වභාවයක් ගත් අතර එහි වැඩවල තත්ත්වයද ඉතා බාලවිය.



## 5. ජවුලියන් සංඝාරාමය

සර්කප්වල සිට කන්පූර් දෙසට වන්නට කි.මී. 10ක් පමණ දුරින් ජවුලියන් සංඝාරාමය පිහිටා ඇත. සංඝාරාමයට මෙම නම ආරූඪවී ඇත්තේ අසල පිහිටි ගම නිසයි. සුසිනිඳු කඳු මුදුනක පිහිටා ඇති මෙය ඊටම ඔබින ස්ථානයක්ද වේ. මීටර් 90ක් උස මෙම පූජනීය ආයතනයේ සිට අවට ඇති, කඳු සහ නිම්නයන් දෙස බැලීමත් සිත කුල්මත් කරවන අතර භාවනා වැඩීමට සිත ධෛර්‍යමත් කරවයි.

පූජනීය ග්‍රන්ථවල සඳහන්වන අන්දමට සියළුම අවශ්‍යතාවයන්ගෙන් සපිරි මෙවැනි හුදකලා ස්ථානයක් සංඝාරාමයක් පිහිටුවීම සඳහා මීට වඩා සුදුසු ස්ථානයක් තේරිය නොහැක. මෙම ස්ථානය සමකාලීන නගරයවූ සර්සුක් වලින් එතරම් දුර නොවේ. සීතල කඳුමුදුනක පිහිටි එය තරමක ඈතින් වුවත්, ජනගහනයෙන් ඉතා බහුල නුවූවත් කිසිම කරදරයකින් තොරව පහසුවෙන් නගරයට ළඟාවී, බෞද්ධ සංඝයා වහන්සේලාට දිනපතා ආහාර පිඩුසිගා වැඩීමට හැකි ස්ථානයක් විය.

රාජකීය ගොඩනැගිල්ලක් වන ජවුලියන්, දෙවෙනි ශතවර්ෂයේ කුෂාන් පාලන කාලයේදී අරඹන ලද්දකි. ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම්, එකතු කිරීම්, ආදිය 5 වන ශතවර්ෂය දක්වා කරගෙන යන ලදී. අවසාන වරට එහි අළුත් වැඩියාවෙන් පසු ජීවයක් ලද සංඝාරාමය මරු තුරුලට ගියේ එප්තාලිට්ස් නොහොත් සුදු හැන්ස් වරුන් විසින් මුළු ගන්ධාර ප්‍රදේශයම විනාශ කල නිසයි.

මෙම ආයතනය සාමාන්‍ය ලක්ෂණ ස්තූප අංගන වලින් හා සංඝාරාමයකින් සමන්විත විය. දකුණු දෙසට එහි ඉහල අංගනය වූ අතර, දෙවැන්න උතුරු දෙසට පහත් ස්ථානයක පිහිටියේය. තුන්වන අංගනය ප්‍රමාණයෙන් කුඩාවූ අතර අනෙක් දෙකද කුඩාවූවා සේම එය බටහිර දෙසින් පිහිටා තිබුණි. වයඹ දෙස

අංශයකින් ආරාමයේ පහත මාලයේ හා ඉහල මාලයේ ගිණිකොන අංශයකින්හා ආරාමයේ නැගෙන හිර දෙසින් මුල්ම ස්මාරක පිහිටුවා තිබුණි.

පහත අංගනයේ සිට ප්‍රවිෂ්ඨවීමේ මග, උදා : ප්‍රධාන ඇතුල්වීමේ මාර්ගය ලෙස ඊසාන දිග අංශය, මෙතැනින් යමෙකු ඇතුල්වූ විට විශාල ස්තූප පහක් ඇති විශාල හතරැස් මිදුලකට පිවිසේ. කැනීම් කරන අවස්ථාවේදී මෙම ස්තූප වල බෙරය හා මුදුනේ ඇති ශිඛරය අහිමිවී ඇත. එහි අලංකාරකොට තිබූ හතරැස් කොටු අනෙකුත් කැනීම් කරන ස්ථානවලට වඩා හොඳ තත්ත්වයක තිබුණි. එක ස්තූපයක පිළිමවල නම් හා ඒවා පරිත්‍යාග කළ අයගේ නම් සඳහන් 'කරොස්ති' ශිලාලේඛනයක් හමුවීම දුර්ලභ මෙන්ම විශේෂ අවස්ථාවක්ද විය. මෙම ස්ථානය අවසන් වරට විනාශ කිරීමට ආසන්නයේදී ක්‍රි.ව. 5 වන ශතවර්ෂයේදී පමණ ස්තූපය අළුත්වැඩියා කරන



ජවුලියන් භූමියේ සාමාන්‍ය දර්ශනයක්

අවස්ථාවේදී අර්ධ ගලින් නිමකරන ලද ගොඩනැගිලි දැකගත හැකිය. චතුරශ්‍රයේ පැති වටේට කුඩා ස්තූප පේලි තිබූ අතර ඒවා සමහර විට වැඳුම් පිදුම් කිරීම සඳහා වන පිළිම තෙලීමට සකස්කල ඒවා විය හැක.

ප්‍රධාන ස්තූපය පිහිටා තිබුණේ ඉහළ භූමියේ වන අතර එයට පිවිසීම සඳහා පඩිපෙලක්ද සාදවා තිබුණි. මෙම ස්තූපය ගොඩනඟන ලද්දේ ක්‍රි.ව. දෙවන ශතවර්ෂයේ කුෂාන් කාලසීමාවේදීය. පස්වන ශතවර්ෂයේ අගභාගයේදී මෙහි බදාම වැඩ නිමකරන ලද්දේ ප්‍රධාන අළුත්වැඩියාවන් ගලින් සහ බදාමයෙන් සිදුකරන අවධියේදීය. ප්‍රධාන ස්තූප අංගනයේ වඩාත්ම වැදගත් අංශය වූයේ නාභියේ සිදුරක් සහිතව ඉදිකර තිබූ ගෞතම බුදුන්ගේ පිළිරුවයි. කිසියම් අයෙකු පැමිණ තමාගේ අසනීපය සුවකර ගැනීම සඳහා බුදුරුව ඉදිරියේ කන්නලව් කරන අතර බුදුරුවේ ඇති පෙකනියේ සිදුරට තම ඇඟිල්ල තබාගැනීමයි. එහි පරමාර්ථය වූයේ භාරය ඔප්පු කරන ලද අයෙකු 'කරෝස්ති' ශිලා ලේඛනයේ පහතින් සඳහන් කර ඇත්තේ බුද්ධ මිත්‍ර නමැති අයෙකුගේ පරිත්‍යාගයක් බවයි.
ධාතු මන්දිරයක තිබී කුඩා ස්තූපයක හැඩය ඇති අසාමාන්‍ය විධියේ උස හා පළලින් යුතුව ධාතුකරඬුවක් හමුවී ඇත. එහි නිමාව ගොරෝසු තත්ත්වයක තිබුණත් එහි ගානට්, ලැපීස් - ලසුලි, කනේලියන්, අක්වා - මාරයින්, එගේට්, ඇමනිස්ට්, ක්‍රිස්ටල් වැනි ඉතා වටිනා හා වටිනා කමින් අඩු ගල් වර්ග ඔබ්බවා නොයෙක් හැඩවලින් හා ක්‍රම වලින් මනබඳිනා අයුරින් සරසා තිබුණි.




ජවුලියන් සංඝාවාසයේ කුස්සිය හා ගබඩා කාමර



ජවුලියන් සංඝාරාමයට පහලින් ඉදිකර ඇති කම්පුර් ඇල නිසා බෞද්ධ පරිසරයේ තිබූ ශාන්ත භාවය කලඹා ඇත



ජවුලියන් සංඝාරාමය




ජවුලියන් සංඝාරාමයේ රැස්වීම් ශාලාව



සංඝාරාමය අහසේ සිට දිස්වන අයුරු

පහත අංගනයේ නැගෙනහිර දෙසින් භික්ෂු ආරාමය පිහිටා ඇත. හතර වටේම භික්ෂූන් විසින් පරිහරණය කරන ලද කුටි සහිත චතුරශ්‍රාකාර සැලැස්මක් එයට ඇත. යමෙකු එයට ඇතුළත් වෙනවාත් සමගම කුඩා දේවාලයක් ඔහුට දකිය හැකිය. එම ශාලාව මධ්‍යයේ පහත්වූ හතරැස් බිමක් ඇත. එහි කොනක වම් අත දෙසට නාන කාමරයක් පිහිටා තිබේ. නැගෙනහිර දිසාවෙන් රැස්වීම් ශාලාවක් ඇත. එයට යාබදව කුස්සිය, ගබඩා කාමරය, භෝජන ශාලාව ආදිය ඇත. පඩිපෙලවල් කිහිපයකින් උඩ තට්ටුවට යාමට හැකිය. ජනේල මගින් කාමරවලට වාතාශ්‍රය සපයා ඇත. මෙහි සමහර කුටිවල ලාම්පු තැබීමට බිත්ති කුහර ඇත. කාමර ඉදිරිපිට පිළිම තැබීම සඳහා කුහර ඇත.

කැනුම් කරුවන් විසින් සොයාගෙන ඇති වැදගත් දෙයක් වන්නේ ස්වර්ණාලේප වලින් පිත්තාරු කරන ලද පිලිස්සුනු මම් පිළිම සොයා ගැනීමයි. පිළිස්සුනු තත්ත්වයේ ඇති ඒවා සොයාගෙන තිබෙන්නේ එම තත්ත්වයේ ඇති තවත් මැටි භාජනත් සමඟ ඇතුල්වන ස්ථානයේ දිය. අනිවාර්යෙන්ම මෙම ගිණිහට ගැනීම් සිදුකර ඇත්තේ වයිට් හැන්ස් වරුන් විසිනි.




මොහ්රා මොරාදු ස්තූපය


# 6. මොහ්රා මොරාදු ස්තූපය හා සංඝාරාමය

තක්ෂිලා නිම්නයේ ගෘහනිර්මාණ ශිල්පයේ වටිනාකමක් ඇති අනෙක් ආගමික ආයතනය නම් සංඝාරාමයයි. එය සර්කප් වල සිට කිලෝමීටර් 5ක් දුරින් හා කම්පූරිවලට යන මාර්ගයට තරමක් දුරින් වර්තමාන මෝහ්රා මොරාදු ගම අසබඩ පිහිටා ඇත. සමකාලීන නගරය වන සර්සුක්වල සිට කිලෝමීටර් කිහිපයක් දුරින් එවැනි පූජනීය ආයතනයක අවශ්‍යතාවයන් සපුරාලමින් ස්තූපය හා සංඝාරාමය පිහිටා ඇත්තේ සෑම අතකින්ම වටවී ඇති සාමාන්‍යයෙන් උස්ව පිහිටි කඳු ශිඛර වලිනි. දිගටි මළුවක මෙය ගොඩනගා ඇත්තේ විශේෂයෙන් බෞද්ධයින්ගේ අවශ්‍යතාවයන් සඳහායි. ස්තූපය එහි නැගෙනහිර කෙලවරේ ඇති අතර සංඝාරාම පිහිටියේ බටහිර කෙළවරෙයි. පුරාවිද්‍යාඥයින් විසින් මෙම ගොඩනැගිලි සංකීර්ණය මතුකර ඇත්තේ අනෙකුත් ස්ථානයන්ට වඩා හොඳින් ආරක්ෂා කිරීම පිණිසයි. කඳුකරයේ ඇති ස්වාභාවික ආකාරයක පිහිටා තිබීම නිසා එය මෙම කෙලවරේ ප්‍රධාන කාර්යයක් ඉටුකරයි. ක්‍රි.ව. 5 වන ශත වර්ෂයේදී වයිට් හැන්ස් වරුන් විසින් කරන ලද මහා විනාශයෙන් පසු එය භාවිතයෙන් ඉවත්වූ අතර, ගල් කඳු වලින් කඩා හැලුනු අපද්‍රව්‍යයන්ගෙන් මෙම සංකීර්ණය සම්පූර්ණයෙන්ම වැලලී ගිය අතර, ස්තූපයේ කැඩීගිය බඳට මීටර් කිහිපයක් හැර ඉතුරු සියල්ල විනාශ විය. පස්කඳු කඩාවැටීමෙන් සිදුවූ මෙම වැලලීම සොරුන්ගෙන් ආරක්ෂා වීමත්, එමඟින් ස්වාභාවිකව ආරක්ෂා වීමකුත් සිදුවිය. ධාතු කරඬුව ලබාගැනීම සඳහා නිදන් හොරුන් විසින් සුන්බුන් අතරින් මතුවී තිබූ ස්තූපයේ මුදුනේ තිබූ ගෝලාකාර ශිඛරය කඩා විනාශකර දමා ඇත. කරන ලද විනාශයන් කියා නිමකල නොහැක. වැඩිහරියක් ස්තූප විනාශකර ඇත්තේ වටිනා කැටයම් වැඩ හා ධාතුකරඬු වැනි වටිනා වස්තු සෙවීමේ යෙදී සිටි වෙළෙන්දන් විසිනි. කෙසේ වෙතත් අවට කඳුවලින් කඩාවැටුනු ගල්වල කොටස් වැනි එකතුවූ අපද්‍රව්‍යයන් නිසා ගොඩනැගිලිවලට අත පෙවීමක් සිදුකර නොමැත. විසිවෙනි ශතවර්ෂයේ පුරාවිද්‍යාඥයින් ඒ අතින් වාසනාවන්තයින්



ස්තූපයේ ආසන්න දර්ශනයක්







මොහ්රා මොරාදුවල සාමානය දර්ශනයක්

මොහ්රා මොරාදු

MOHRA MORADU



(a) Plan and sections of monastery.



(b) Plan, section and details of stūpas.

ස්තූපයේ සැලැස්ම හා හරස්කඩය හා විස්තර

වී ඇත්තේ එම ස්ථානවල සමහර අවස්ථාවල ගොඩනැගිලි මීටර් හයක් පමණ උසට ගොඩනැගිලිත්, ගොඩනැගිලිවල කපරාදු කිරීම් ආදියත් පුදුමාකාර විධියට ආරක්ෂාවී තිබුණි.

දිගටි මළුවේ බටහිර දෙසින් ස්තූප දෙකක් පිහිටා ඇත. ප්‍රධාන ස්තූපයේ මුදුනේ ඇති ගෝලාකාර ශිඛරය සොරුන් විසින් කඩාදමා ඇත. එය කුඩා ස්තූපයේ උතුරුදෙසින් පිහිටා ඇත. එයද මහා ස්තූපය සේම සකසා ඇත. එහි දකුණු හා බටහිරින් ඇති පිටපැත්තේ කැටයම් වලින් පලුඳුවී ඇති බිත්ති කපරාදු කර ඇත. ප්‍රධාන ස්තූපයේ මුදුන් කොටස හැර පිටපැත්තේ සෑම තැනම බුදුන්ගේ හා බොධිසත්ව රූපවලින් සහ කැටයම් වලින් සරසා ඇත. හතරැස් කුළුනු අතරේත් ගෝලාකාර ශිඛරයේත් පඩිපෙලවල සෑම පැත්තකමත්, එක සමාන විධියටම රූපවලින් සරසා ඇත. ස්ථානයේ හැටියට ගැලපෙන ආකාරයෙන් එමරූප නිර්මානය කර තිබේ. බෞද්ධ කලාකරුවන් විසින් ලබාගෙන ඇති කලාක්‍රම හා තාක්ෂණය පිළිබඳ දැනුම 'ජීවිතය හා හැසිරීමේ එකතුව ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ සමාධිය' බිහිකරයි.

මළුවේ නැගෙනහිර පැත්තේ පිහිටි බෞද්ධ ආයතනය වන සංඝාරාමයේ අනෙකුත් සලකුණු වන්නේ, මළුවේ නැගෙනහිර පැත්තේ පිහිටි කාමර කිහිපයකින් යුත් විවෘත අංගනයයි. උතුරු දෙසින් ඇති සමචතුරශ්‍රාකාර අංගනයට නැගීම සඳහා පඩිපෙලවල් ඇත. එය කෙලවර වන්නේ ඉස්තෝප්පුවකිනි. බටහිර බිත්තියේ ඇති කවාකාර කුහරයේ එක්පැත්තකින් හතරදෙනෙකු වැඳගෙනසේ සිටින බුදුන්ගේ පිළිරුවක් එහි ඇත.

සංඝාරාමයේ පතුල හතර පැත්තේම කාමර 27ක් ඇත. සෑම පැත්තකින්ම පඩිපෙලවල් සහිත සෙ.මී. 75 ක ශිලාබැස්මක් එහි මධ්‍යයේ ඇත. එවැනි ආයතනයක අත්‍යාවශ්‍ය අංගයක් වන නාන කාමරය දකුණු කෙලවරේ උසට ඇති තට්ටුවේ පිහිටා තිබෙන්නට ඇත. ශිලාබැස ඇති කොටසේ සමාන්තර දුරකින් පිහිටා ඇති ගල්ලෑලි වලින් පැහැදිලි වන්නේ ලී කනු මත ඉදිකල ඉස්තෝප්පුවක් තිබූ බවයි. එයින් පහත මාලයේ තිබූ කාමරවලට සෙවන සැපයූ අතර, ඉහළ මාලයේ ඇති කාමර සමඟ අදහස් හුවමාරු කරගැනීමට යොදා ගත්තාද විය හැක.


පළමුවන මහල මීටර් 35ක් පමණ උසින් පිහිටියේය. දෙවෙනි මහලට යාමට ඇත්තේ එක කාමරයක් තුලනි. එය ජුවුලියන් සංඝාරාමයට සමානය. එසේම පහත මාලයේ ජනෙල් මුදුනට වන්නට පලල්වූ අතර පිටපැත්තට වන්නට එය කුඩාවිය.

ඇතුලතින් කිසිම ද්‍රව්‍යයක සාක්ෂියක් නොමැති හෙයින් සංඝයා වහන්සේලාගේ කාමර එතරම් සැරසිලිමත් කමකින් තොරව සාමාන්‍ය පෙනුමකින් තිබූ බව පෙනේ. ඉස්තෝප්පුවේ බිත්ති සරසා තිබූ අතර අංගනයේ ගමන් මාර්ගය බුදුන්ගේ විශාල ප්‍රතිමා වලින් සරසා තිබුණි. ප්‍රතිමා තැබීමට සාදා තිබූ බිත්තිවල සැලකිය යුතු පූජක වරුන්ගේ ප්‍රතිමා වලින් සරසා තිබුණි.

ආරාමයේ නැගෙනහිර පෙදෙසේ කාමරයක තිබී හමුවූ ස්තූපයක් ඒ අයුරින්ම තිබීම ගැන කැනුම් කරුවන් මවිතයට පත්කල දෙයක් විය. එහි අරටුව සාදා තිබුණේ ප්‍රාදේශිකව සඳහන් වන කන්ජූර් නමැති දෙයකිනි. නමුත් පිටතින් කරන ලද කපරාදු සියුම් හුණු බදාමයකින් නිමවී තිබුණි. හුණු බදාමය මත කරන ලද සායම් කිරීම. නිල්, කහ සහ දම්පාටින් දක්නට ලැබුණි. ස්තූපය ඉතාමත් නිරුපද්‍රිත තත්ත්වයේ තිබුණි. විදාස් තොහොත් කුඩය කල්යාම නිසා එයින් පහලට වැටී ස්තූපය පාමුල තිබී ඉතා හොඳ තත්ත්වයෙන් සොයාගන්නා ලදී.

ගන්ධාර යුගයේ අමතක කළ නොහැකි දෙයක්වූ සංඝාරාම, අංගනයේ නැගෙනහිර දෙසින් වූ කාමර පද්ධතියේ ගොඩනඟා තිබුණි. මෙම ගොඩනැගිලි රැස්වීම් ශාලාවකින්, භෝජන ශාලාවකින්, කුස්සියකින්, ගබඩා කාමරයකින් හා වැසිකිලියකින් සමන්විත විය. ප්‍රධාන ශාලාවේ නැගෙනහිර දෙසින් ඇති කාමරයකින් මෙම ගොඩනැගිල්ලට ඇතුල් විය හැකිය. බෞද්ධයන් විසින් විශාල වශයෙන් කරන ලද අළුත්වැඩියාවන් එක් එක් ගොඩනැගිල්ල වෙනුවෙන් කළ බැව් හඳුනාගත හැකිව ඇත්තේ, පෙනෙන තෙක් මානයේ පිහිටි ජවුලියන් වල සංඝාරාම ගැන පරීක්ෂණ පැවැත්වීමෙන් පසු සැක දුරුකර ගැනීමෙන් පසුවයි.

චිත්‍රකුල හැඩයට ඇති සංඝාරාමය ගොඩනැගීම ක්‍රි.ව. දෙවෙනි ශත වර්ෂය තුළදී සිදුකර ඇත. මෙම ගොඩනැගිල්ලේ අළුත්වැඩියාවන් හා එකතු කිරීම් ක්‍රි.ව. 4-5 වෙනි ශත වර්ෂ කරා දික්වේ. කුෂාන් රජවරුන් වන හුවිෂ්ක හා වාසුදේව (ක්‍රි.ව. 169-230) කාලයේදී කාසි මෙම භූමියෙන් සොයාගැනීම නිසා මෙය ගොඩනැගූ කාලය ගැන නිගමනයකට පැමිණිය හැක.



මොග්රා මොරාදු ආශ්‍රමයේ හා ස්තූපයේ සාමාන්‍ය දර්ශනයක්

පෞරානික වස්තු වලට අමතරව මොහ්රා මොරඩු වල ස්තූපය හා සංඝාරාමය ගැන කල කැනීම් වලදී සියුම් කපරාදුවෙන් නිමකල ඉතා ලස්සනට හා හොඳ පෙනුමකින් යුක්තව නිමකල ප්‍රතිනිර්මාන කඳින් වෙන්කළ ශීර්ෂවල සිට නොයෙකුත් මුද්‍රාවලින් පෙනී සිටින අතිවිශාල බුද්ධ ප්‍රතිමා සොයා ගෙන ඇත.


## ජන්දියාල් විහාරය

විශාල භූගෝල සැලැස්මවල් වලින් පිටත තක්ෂිලා නිම්නයේ තිබෙන එකම ගොඩනැගිල්ල ජන්දියාල්වල පිහිටුවන ලද ෆයර් ආශ්‍රමයයි. එය තනිවම දුරස්ථව පිහිටි දාගැබක්වේ. මෙම ගොඩනැගිල්ලේ සැලැස්ම පාරම්පරික විහාරයකට විරුද්ධව පිහිටියකි. මෙයින් දැනට සොයාගෙන ඇති දේවල් අනුමාන වශයෙන් සලකන්නේ, මුලින්ම ශක්තිමත් කනු හතරක් මෙයට පිටුපසින් තිබූ බවත්, තවද කාමරයක් හා දෙවෙනි කොටසේ ඇතුල් පැත්තේ පාතිනන්වල චෛත්‍යයක්ද තිබූ බවයි. විහාරයේ පිටපැත්ත ගල් මිශ්‍ර බදාමයකින් සාදා තිබුනු බවත් අතරින් පතර ග්‍රීක් පන්සලක මෙන් කනු සිටුවා තිබූ බවත් කියයි. කෙසේ වෙතත් මෙහි දැක්වෙන සැලැස්ම ඉරානයේ ආකිමීඩ් හා පාතියන් කාලසීමාවේ තිබූ සංඝාරාම වල සැලැස්මවල් වලට කිට්ටුවෙන් මෙහි සැලැස්ම සාදා ඇති බවයි. උපකල්පනයක් නොමැතිවීම නිසා මැස්ඩාකන් ක්‍රමයට කැපවෙමින් වැඳුම් පිදුම් කළ බවට සිතිය හැක. මෙය තවදුරටත් ස්ථිර කළ හැකිවන්නේ, පිටුපසින් තරප්පුවක් ඉදිකර තිබීමෙන් පෙනී යන්නේ, මුලදී මෙය ගින්දර




තක්ෂිලාවේ - ජන්ඩියාල්වල සෝරාස්ට්‍රියන් සංඝාරාමය

කුළුනට ආධාරකයක් වශයෙන් තිබෙන්නට ඇති බවයි. ග්‍රීක ක්‍රමය අනුව සැලසුම් කිරීම අනුගමනය කිරීමෙන් ඉස්තෝප්පුවෙහි තිබුන ශක්තිමත් කුළුනු බෙර යොදා සාදන ලදී. ග්‍රීක ප්‍රාදේශීය හා මූලස්ථාන අනුගමනය කරමින් නියම දිනයක්, ආරාමයට වෙන්කළේ (ක්‍රි.පූ. 50 - ක්‍රි.ව. 65 දක්වා) තක්ෂිලාවේ පාතියන් වරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අනුගමනය කරමිනි.



තක්ෂිලාවේ - ජන්ඩියාල්වල යකඩ කුළුනු හිස සහ පාදම



ජන්ඩියාල ඡයර් පන්සලේ සැලස්ම

# III. පෙෂවෝර් නිම්නය

පෙෂවෝර් නිම්නය තක්ෂිලා සානුවේ ඇති ගන්ධාර ගෘහ නිර්මාණ ශිල්පයේ බොහෝ විරුද්ධවාදීන් ඇති කළ තැනකි. ගන්ධාරයෙහි ඉතාම විශිෂ්ඨ ගනයේ දියුණුවක් ඇති වූ උසස්ම කාලසීමාව හා ස්ථාන ලෙස පෙෂවෝර්හි සා-ජී-කි-ඩේරි වල ඇති ස්තූප පෙන්වයි. තක්හි - ඊ-බාහි සංඝාරාමය වානක ඩේරි හා වෙනත් ස්තූප ගණනාවක් සහ බෞද්ධ මධ්‍යස්ථාන මෙම නිම්නයේ පිහිටා ඇත.

## 1. සා-ජී-කි-ඩේරි

කණිෂ්ක රජු බෞද්ධාගමට හැරීම සිහිපත් කරමින් පෙෂවෝර් අසල සා-ජී-කි-ඩේරි වල ඉදිකරන ලද ස්තූපය ගන්ධාරයෙහි ඇති ස්තූප වලින් ඉතාමත් දර්ශනීය ඉදිකිරීම බවට පත්වී ඇත. මෑතකදී කරන ලද පුරාවිද්‍යා කැනීම් වලදී බදාමයෙන් නිමකල බුදුන්ගේ පිළිරුවින් අලංකාරවත් විශාල වේදිකාවක් හමුවී ඇත. එය තරප්පු පෙළිය ඉහළ ස්ථානයකට යොමුවී තිබුණි. ක්‍රි.ව. 6 වෙනි ශතවර්ෂයේදී එහි පැමිණි ප්‍රසිද්ධ චීන වන්දනා කරු සුං යන්ග්, පවසා ඇත්තේ, එහි උඩ කොටස සියළුම වර්ගයේ දැව වලින් නිමාකර තිබූ බවයි. ඔහු තවදුරටත් කියා ඇත්තේ අඩි 700ක් උසට තට්ටු 13කින් එය සමන්විත වූ බවයි. ගොඩනැගිල්ල මුදුනින් යකඩින් නිමකල තට්ටුවක් තිබූ අතර එහි දිලිසෙන කුඩ 13ක් සවිකර තිබුණි. තක්ෂිලාවේ හා තවත් ප්‍රදේශවල ඇති කුළුනු වැනි ස්ථූප සා-ජී-කි-ඩේරි වල ඇති ස්තූපය හා සමාන වන අතර ගන්ධාර ප්‍රදේශයේ කැනීම් වලින් ලැබුණු මංජුසා වලින් හොඳම ඒවා එහි විය. හිඳගෙන සිටින බුදුන්ගේ පිළිරුව හා බෝධිසත්ව රූප දෙකක් වටා තවත් පින්තූර කොටා තිබුණි. කවාකාර භාජනයේ උඩපැත්තේ ඉගිලෙන තාරාවුන් රංචුවක් පහත කොටසේ බිත්ති හිසෙහි මල්මාලා සහිත බැතිමතුන් පිරිවරාගත් මල්දාමයක් සහිත කණිෂ්ක රජුගේ පිළිරුවකි. එහි තනිකගේ නම සඳහන් වන අතර මේසත් වරයාගේ නම වශයෙන් අගිස්හල යන නම සඳහන් කර ඇත.

පිත්තල ධාතු කරඬුවේ ඇතුලේ පැති හයකින් යුත් ක්‍රිස්ටල් භාණ්ඩයේ ඇට කැබැලි තුනක් ඇත. ඒවා අනිවාර්යයෙන්ම බුදුන්ගේ ධාතු විය හැක.


## 2. තක් - ඊ- බාහි සංඝාරාමය

ගන්ධාරයේ බෞද්ධ ආරාම වල ඇති හොඳම පිළිමවලින් එකක්, මරදන් දිස්ත්‍රික්කයේ කඳුකරයේ වැදගත් ස්ථානයක පිහිටා ඇති. තක් - ඊ- බාහි වල පිහිටා ඇත. තක් - ඊ- බාහි යන්නෙන් අදහස් වන්නේ දිය උල්පතක් සහිත උස් තැනිතලා භූමියකි. එහි නම ඇතිවීමට මුල්වී ඇත්තේ කඳු මුදුනේ ඇති වතුර උල්පතයි. මෙම පූජනීය ජනාවාසය ඇතිවීමටත් එය නඩත්තු කිරීමටත් මෙය මුල්වූ බව පෙනේ.

ගන්ධාර ප්‍රදේශයේ කරන ලද කැනීම් වලින් සොයාගත් දේ අතරින් මෙම සංඝාරාමයෙන් සොයාගත් දෑ අනෙකුත් ස්ථානවලින් සොයාගත් දේ වලට වඩා උසස් තත්ත්වයක පැවැතුනි. මෙම ස්ථානය තරමක් දුරට හෝ



තක්හි-ඊ-බාහි අළුතෙන් සොයාගත් කරෝෂ්ඨි ශිලාලේඛනය






*Layout of Takht-e-Bahi Monastery and Stupas*

තක්ති-ඊ-බාහි සංඝාරාමයේ හා ස්තූපයේ පිහිටීම

කොල්ල කරුවන්ගේ දරුණු හිංසා වලින් හා කොල්ලකෑම් වලින් බේරී තිබීමට හේතු වූයේ ප්‍රධාන මාර්ගයෙන් පිට කඳු වැටියකට මුවාවී තිබුනු නිසයි. කෙසේ වෙතත් මේවා හොඳින් තිබෙනවා දකින්නට පිළිම හොරුන්ගේ කිසිම අනුකම්පාවක් නොතිබූ අතර ඔවුන් බෞද්ධ කලාවන්ගෙන් හොඳම ඒවායින් කොටසක් ඉවත්කරගෙන තිබූ අතර සුළු ප්‍රමාණයක් පමණක් පෙෂවෝර් කෞතුකාගාරයේ දක්නට තිබේ.

ආයත චතුරශ්‍රාකාර බොහෝ ස්තූපයන්ගෙන් සැදුම්ලත් අංගනයේ වර්තමානයේ සංඝාරාම පරිශ්‍රයට ඇතුළුවීමට ඇත්තේ පිටපැත්තෙනි. බැස්ම ඇති පැත්තේ අවස්ථා කිහිපයක දී බදාම ඇල්ලීමේ හේතුව නිසා නැගෙනහිර පැත්ත විශාලවී ඇත. නැගෙනහිර ඇත දිගු කෙලවරේ රැස්වීම් ශාලාවක් ඇත. බටහිර කොටසේ භාරයන් ඔප්පු කිරීම සඳහා වන ස්තූප ගණනාවක් ඇත. නමුත් මුල්කාලයේදී මෙම ප්‍රදේශයේ විශාල ස්තූපයක් විය.





හි-ඊ-බාහි සංඝාරාමය සාමාන්‍ය දර්ශනයක්

මෙම ස්තූපවල අඩිතාලමට විශාල කුළුනු යොදා තිබුණි. එක කාලයකදී එම කුළුනු කැටයම් බදාමයෙන් සරසා තිබුණි. මෙම ස්තූපවලින් බොහෝමයක් හතරැස් ඒවා විය. නමුත් අටපැති හා රවුම් ඒවාද විය. විශාල ස්තූප වල බිත්ති කුහර දෙක බැගින් යොදා තිබුණේ ඒවායේ පිළිම තැන්පත් කිරීමේ අදහසිනි. මේවා සමඟ අංගනයේ තුන් පැත්තක තවත් බිත්ති කුහර සාදා තිබුණි. මෙම බිත්ති කුහර අංගනය මධ්‍යයේ සිට උතුරු දකුණු මාර්ගයක් සිටිනසේ පැත්තකින් සාදා තිබුණි.

උතුරු දෙසට වන්නට උස්භූමියක ප්‍රධාන සංඝාරාමය පිහිටි අතර දකුණු දෙසට වන්නට හොඳින් සැලසුම් කල සංඝාරාම චෛත්‍යය උස් භූමියක පිහිටා තිබුණි. මෙම අසමසම පූජනීය ගොඩනැගිල්ලේ මධ්‍යයේ ස්තූපයක් හා පැතිවල බිත්ති කුහර තිබුණි බිත්ති කුහරවල ජේකඩගල් ගෝලාකාර ශිඛර හා මධ්‍යම කාලයේ ප්‍රාකාර වැඩද විය. සංඝාරාම සංකීර්නයේ මධ්‍යයේ විවෘත අංගනයක් ඇති අතර පදිංචි පංසල් පසෙකින් විය. කාමර දෙකේ ආකාරයට සාදා ඇති එකක් හැර මේ සියල්ලම තනි කාමර ඒවා විය. අංශයක ඉඩ පහසුකම් ඇති නාන කාමරයකි. දැනට සංඝාරාමය තනි ගොඩනැඟිල්ලක් වශයෙන් පෙනී සිටියත් බිඳහෙළිය නොහැකි කරුණු අනුව එහි දෙවැනි තට්ටුවක්ද තිබූ බව පෙනේ. උතුරින් ඇති හිස් කොටසින් පෙන්වන්නේ උඩ තට්ටුවේ තිබූ දාන ශාලාවකට යාම සඳහා යොමු වූ බදාමයෙන් කල පඩි පෙලක් තිබූ



තඛ්ති-ඊ-බාහි සංඝාරාමය ස්තූපයෙ විශාල සංඛ්‍යාවක් ඇති කොටසේ සමීප දර්ශනයක්

බවයි. පහත් භූමි ප්‍රදේශයක පිහිටා ඇති පසුකාලයකදී ඇතිවූ ස්තූප සංකීර්ණයක් ඇත. භාර ඔප්පු කිරීම සඳහා පිළියෙල කල තවත් ස්තූප දෙකක් සමඟ ප්‍රධාන ස්තූපයක් ද විය. සිහින් හුණු බදාමයෙන් නිම කල පිළිරූ වලින් මෙම ස්තූපය අලංකාර කර ඇත. අංගනයේ කෙලවර බිත්තියේ සිනිඳු කපරාදුවෙන් නිම කල විශාල පාද සහ බුදුන්ගේ ශීර්ෂ ආදර්ශන වශයෙන් ආරක්‍ෂිතව තබා තිබුණි. ගලින් නෙලන ලද ප්‍රතිමාද මෙහි විය.

ප්‍රධාන ස්තූපයේ අංගනයෙන් බිම් කාමර වශයෙන් අයත් කාමර සංකීර්ණයකට යාමට පඩිපෙලක් ඇත. මෙම කාමර ඉස්තෝප්පුවේ දෙපැත්තේම පිහිටා ඇත. මේවායේ වහලවල් ජේකඩගල් ආරුක්කු වලින් නිමවී ඇත. ඒවා පහත් බිමක පිහිටියත් ඇත්ත වශයෙන්ම එය පොලව යට නොවේ. ප්‍රධාන ස්තූපයේ ආරක්‍ෂක බැම්ම නිමකලාට පසු මෙම කාමර සාදා ඇතත් එයට සම්බන්ධ කිරීමක් කර නැත. පහකින් සමන්විත මෙම කාමර සෑදීමේ අරමුන පැහැදිලි නැත. වැදගත්කමක් ඇති මෙම කාමර, භාවනා කිරීමේ හා නිදහස්ව සිටීමේ හෝ ධාන්‍යාගාර වශයෙන් පාවිච්චි කලා විය හැක. කරොස්කි භාෂාවෙන් අකුරු යොදා ඇති, කැඩීගිය කළුපාටින් යුත් මැටි කැබලි කැනීම් වලදී සොයාගෙන ඇතත් එම කුටි කුමන කරුණක් සඳහා යොදා ගත්තේ දැයි දැන ගැනීමට එම මැටි කැබලි ඉවහල් වී නැත.

මෙම විශාල සංඝාරාම ගොඩනැගිලි සංකීර්ණයේ කොටසක්ව තිබූ මෙම වටිනා භූමියේ ගොඩනැගිලි පද්ධතිය ගොඩනැඟීම පිළිබඳව නියම විස්තර හා කාලසීමා ආදිය දැක්වීමට අවශ්‍ය පැහැදිලි සාක්ෂි නොමැතිවීම අභාග්‍යට කරුණකි. වර්ෂ 103 දක්වන ගොන්ඩාපරස් නමැති පාතියන් පාලකයාගේ ශිලා ලේඛනයක් හමුවී ඇත. විද්වතුන්ට අනුව මෙම කාලසීමාව ක්‍රි.ව. 15 විය හැකිය. එය මූලාරම්භයක් කරගෙන මෙහි ගොඩනැගිලි ඉදිකිරීම සංඝාවාස ඇතිකර ඒවායේ පදිංචිවීම කුශාන් කාලයීමාවේ උච්චමය, පළවන හා දෙවන ක්‍රිස්තියානි ශතවර්ෂවලට බැරකල හැක. මෙම කාලසීමාව සැලකිල්ලට ගනිමින්, පහත් භූමියේ පසුව ඉදිකරන ලද සංඝාරාම පද්ධතිය, ඒ අනුව ගනන් බැලීමේදී ක්‍රි.ව. 5 වන හා 6 වන ශතවර්ෂ ආසන්නයේදී ගොඩනගා ඇති බවට නිගමනයකට ආහැක.

බටහිර කඳුවැටියේ ගොඩනැගිල්ල ගැන මෙතෙක් පැහැදිලිකර නැති, එහෙත් 1977 දී ඉෂාන් එ. ච්. නදීම් නමැති අය විසින් නැවත සංශෝධනය කරන ලද කරොස්කිවලින් ලියන ලද නිල්පාට ගල් පතුරක් සොයාගෙන ඇත. ඔහු එය කියවා, එහි සඳහන් දේ, විශාල ගන්ධාර කොටසේ කොතැනින් හෝ සොයාගත් ලේඛනයේ සඳහන් ස්ථානය සහ නම නිවැරදි බවට සඳහන් කර ඇත.

'උඩක් හද්රේ ධර්ම වද හවි (විහ) රිහා
(හි?) කුන සිබෙනා ඉජ්හානෝ - පුත්රෙනා ඉහා'

පරිවර්තනය
'උඩකබාද්‍රාහි (වර්ධනා වතුර) ධර්ම - වාර්තාහි (ඉමහත් පූජනීය සංඝාරාමය අරඹන ලද) ඉපානාගේ පුත් භික්ෂු සිව විසිනි'

වර්තමාන තක්-ඊ-බාහි යන නම උඩකාහදා යන නමෙහි සංශෝධන පරිවර්තනයක් බව සටහන් කර ගැනීම වටී.




තක්හි-ඊ-බාහි සංඝාරාමය සමීප දර්ශනයක්

# IIII. ස්වට් නිම්නය

ස්වට් ගැන සඳහන් නොකළොත් පකිස්තානයේ ගාන්ධාර පළාත ගැන කීම සම්පූර්ණ නොවේ. පැරැණි උද්‍යාන සංස්කෘත භාෂාවේ උරිග්‍යාන් වචනයෙන් බිඳී ආවකි. එහි තේරුම මල්වත්තයි. එය නියම වශයෙන්ම පිරිසිදු සීතල වතුර ගලාබසින තද කොළ පැහැයෙන් සපිරි නිම්න හා පාටපාට මල්වලින් පිරි භූමියකි. මෙය පිහිටා ඇත්තේ රටේ වයඹ දිග ප්‍රදේශයේයි. හිමාලයේ කාර කෝරම්, හින්දුකුෂ්, ෆාමීර් යන කඳු පන්තියේ ඊසාන හා බටහිර පෙදෙස්වල පැතිර පවතී. දකුණු දෙසින් බුනර්. මර්දන්, සවාබි හා චර්සද්ද යන දිස්ත්‍රික්ක වල නිම්න වල පැතිරී ඇත.

පූර්ව ඉතිහාස කාලයේ පටන් මෙම මිටියාවත බොහෝ සංස්කෘතිකයයන්ගේ තොටිල්ල බවට පත්ව තිබුණත් ගන්ධාර කාලසීමාවේදී පළාතම දීප්තිමත් කරමින් ඉතා දියුණු අස්වැන්නක් ලබාගෙන ඇත්තේ ගල්පිළිමයන් හා




ස්වෙට්හි බත්කාරාවල පූජනීය කොටසේ සාමාන්‍ය දර්ශනයක්

වෙනත් සුළු සොයාගැනීම් වලිනි. එකල ගෘහ නිර්මාණ ශිල්පයේ එලිය පතුරුවමින් එම කාලයේදී ගන්ධාරයේ වැදගත් වැඩබිම් පිළිබඳ විස්තර පහත දක්වේ.

## 1. බුකාරා සංඝාරාමය

සයිදු ශරීෆ් වල පිහිටි ස්වට් කෞතුකාගාර විශ්ව විද්‍යාලයට ගලකින් ගැසිය හැකි දුරකින් උතුරු දෙසට බුකාරා I පෙදෙස පිහිටා ඇත. ස්වට් ගඟේ කුඩා අතු ගංගාවක් වන පම්බාල් අසබඩ එය පිහිටා ඇති බව කාසි හා පදක්කම් උපයෝගි කරගනිමින් අනාවරණය කරගෙන ඇත. ක්‍රි.පූ. 3 වන ශතවර්ෂයේ පටන් ක්‍රි.ව. 10 වෙනි ශතවර්ෂය දක්වා කාලයේ මෙම භූමිය තිබූ බව ප්‍රකාශ කරයි.

කැනීම් වලින් සොයාගන්නා ලද වස්තු වලින් අනාවරණය වී ඇත්තේ (අ) පදිංචි ප්‍රදේශ (බී) පූජනීය භූමිය,



ස්වෙට්හි බත්කාරාවල පූජනීය කොටසේ සාමාන්‍ය දර්ශනයක්




ස්වෙට්වල බුත්කාරාගි අනුරාගි යුවලක්

බටහිර දෙසට ඇති පදිංචි ප්‍රදේශවල හොඳින් සැලසුම් කල දර්ශනීය කානු පද්ධතියක් පිහිටා තිබූ බවයි. මෙම ප්‍රදේශයෙන් ගෘහ භාණ්ඩ සෑහෙන ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇති අතර, ගොඩනැගිලි වලින් ලද නෂ්ඨාවශේෂ වලින් කාල නිර්නයන් දක්වයි.

බොකාරා පූජනීය ප්‍රදේශය පැතිරී තිබුණේ තැනිතලා භූමියකය. එය පිහිටියේ මිනිසුන්ගේ වාසභූමි ප්‍රදේශයේ නැගෙනහිර කෙලවරේයි. පසුව සඳහන් කළ ප්‍රදේශ පූජා ප්‍රදේශ හා සම්බන්ධ වී ඇත්තේ බටහිරට තිබූ දොරකඩිනි. දකුණටද එවැන්නක් තිබී ඇත. මුළු ප්‍රදේශයටම තිබූ සීමාව කළුගල් පතුරුවලින් පෙන්නුම් කලේ වැරදි සමසතරැස් කොටුවකි. මහා ස්තූපය පෙන්නුම් කළේ ස්තූප, විහාර හා මිනිසුන් ගැවසෙන ස්ථානයක් මධ්‍යයේයි. විශාල ගොඩනැගිලි වල නෂ්ඨාවශේෂ පෙන්නුම් කළේ උතුරු පැත්තේ වන අතර, පඩි පෙලවල් දකුණු දෙසට විහිදුවමිනි. විහාර හා කාමර ගණනාවක් පැතිවලින් දැකිය හැකිවිය. මෙහි ඇති තට්ටුවලින් පැහැදිලිව පෙන්නුම් කළේ නොයෙකුත් කාල සීමාවන් හිදී කරන ලද එකතු කිරීම් හා අළුත්වැඩියාවන්ය.


මහා ස්තූපය සැලැස්මට අනුව රවුමට පෙන්වා ඇත. නැවත ඉදිකිරීම් පස්වතාවක් පෙන්නුම් කරයි. එහි පළමු ඉදිකිරීම ක්‍රමයෙන් විශාල කර පෙන්වා ඇත්තේ පළමු එක වටා අළුත් එකක් ඉදි කිරීමෙනි.



බුත්කාරා - ප්‍රධාන ස්තූපය ඉදිරිපිට ගලෙන් නිමකල සිංහයෙකි

සිද්ධස්ථානයේ කාල සීමාව ක්‍රි.පූ. 3 වන ශතවර්ෂයේ සිට ක්‍රි.ව. 100 වෙනි ශතවර්ෂය දක්වා කාලයක් තුල පැවැති බව මුල් කැනුම් කරු වන ඩොමිනිකෝ ෆසිනා පවසයි. ඔහු තවදුරටත් පවසා සිටින්නේ මහාචාර්ය 'ගිසෙප්පේ ටයල්' ට අනුව මෙම ජනපදයේ ප්‍රධාන නගරය වන මෙන්ග් - චිච් - ලී අළුතෙන් සොයා ගැනීමේදී පාරාදිසය හඳුනාගෙන ඇත්තේ ටෝ-ලෝ පාරාදිසය වශයෙනි. එය ක්‍රි.ව. 520 දී සන්ග් යුන් විසින් සොයාගෙන ඇත්තේ මෙම කොටසේ විශාලම හා පොහොසත්ම ප්‍රදේශය බවයි.

කැනීම් කරන ලද වර්තමාන සීමාව, කෙසේවත් මීට ප්‍රථම කරන ලද කැනීම් සීමාවල හා පදිංචි ප්‍රදේශ වලින් ස්ථිර වෙන්නේ නැත. මෑතකදී කරන ලද කැනීම් වලින් සොයාගත් ගෘහ නිර්මාණ ශේෂයන්ගෙන් පැහැදිලි වන්නේ එම කොටසේ ජනාවාස ඇති වෙන්නට ගත්විට ප්‍රදේශය පුළුල්වූ බවයි.



ස්වට් පැනර් හාර ඔප්පුකරණ ස්තූප


## 2. පානර් සංඝාරාමය

පානර් වල බෞද්ධ පෙදෙස පිහිටා ඇත්තේ මින්ගෝරා වල සිට කිලෝ මීටර් 3ක් ඈතිනි. එය ජම්බීර් නිම්නයට යන දර්ශනීය පාරෙන් තරමක් ඔබ්බෙනි. එය පිහිටා ඇත්තේ උස කන්දක බෑවුමේය. බූකර වල පූජනීය වූ ප්‍රිසින්ට් මෙන් නොව බෑවුමේ කොටස් දෙකකට පහත් කිරීමෙනි. ඒ අනුව මෙම පූජනීය වූ ප්‍රදේශය ගොඩනැගිලි පිළිබඳ අළුත් විධි හා අදහස් සැලසුම් හා අත්තිවාරම් පිළිබඳ අළුත් ක්‍රම හා විධි ඉදිරිපත් කරයි. මෙම භූමියේ කැනීම් 1961 දී ආරම්භ කර 1962 සිට 1964 දක්වා මෙම පොතේ කතෘ යටතේ කරන ලදී.



ස්වට් පැනර්වල ධාතුන් අඩංගු කරඬුවක් අතැතිව සිටින පිරිමි රූවක්


පහළ මලුවේ ගොඩනැගිලි E-W අක්ෂරයෙන්ද පළමුවෙනි මළුවේ ඒවා N-S අක්ෂරයෙන් ද පෙන්වයි. සංඝාරාමයේ නටඹුන් නැගෙනහිර පෙදෙසේ ඇත. මළුව සම්බන්ධ කර ඇති පඩිපෙලවල් ගල් පතුරුවලින් සාදා නිමකර



ඇත. කන්ද කැපීමෙන් උඩමළුවේ පිටුපස බිත්තියක් හා සමානව පවතී. පහත මාලයේ පිටුපස බිත්තියද හදිසි ආපදාවකදී උරදීමට සූදානමින් සිටී. ගොඩනැගිලි සෑදීම හා කපරාදුව ගලින් නිම කරන ලද දියමන්ති හැඩයට නිමකර ඇත.

ඉහළ මාලයේ මධ්‍යම ගොඩනැගිල්ල වන්නේ දකුණු දෙසට මුහුණ ලා සිටින ප්‍රධාන ස්තූපයයි. දෙපසින් කුඩා ස්තූප දෙකක් හා සිනිඳු ගල්වලින් නිමවූ දෙකකින්. හොඳින් ආරක්ෂාවී තිබුනු එක ස්ථම්භයක් තරමක් හොඳ තත්ත්වයකින් තිබූ අතර කපරාදු කරන ලද, පඩියකට සවිකර තිබුණි. එහි පාදම ස්කොට් වර්ගයේ නිමාවකින් සමන්විත විය.

බුකාරා I හි ඇති ගොඩනැගිලි ආදියෙහි ව්‍යූහාත්මක තත්ත්වයන් හා සංසන්දනය කිරීමේදී PNAR හි ඇති ඒවා ක්‍රි.ව. 1 සිට 5 වෙනි ශත වර්ෂය දක්වා දිවේ.



පැතර් භූමියේ සාමාන්‍ය දර්ශනය

## 3. සයිදු ෂරීෆ්

නගරයේ නැගෙනහිර දිසාවෙන් නගරයට ආසන්නව බෞද්ධ පූජනීය පෙදෙස සයිදු ෂරීෆ් - 1 නමින් හඳුන්වනු ලැබේ. ජම්බාල් මිටියාවතෙන් සයිදු මිටියාවත වෙන්කරන කඳුපාමුල පිහිටා ඇත. ISMEO (Instituto per it Medico Estromo Orient Rome) නමැති ආයතනයත් සමග සහයෝගයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉසාම්. එච්. නදීම්ගේ පරීක්ෂණය යටතේ මෙම පරිශ්‍රයේ කැනීම් 1963 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඉතාලියේ පුරාවිද්‍යා මිසමෙහි (Archaelogical Mission) ඩොමිනිකෝ ෆැසීනාගේ මගපෙන්වීම යටතේ 1968, 1977, 1982 සහ 1989 වර්ෂවල මෙම කැනීම් කරන ලදී.

මෙම ප්‍රදේශය ස්ථර දෙකක පැතිර පවතී. පහළ ස්ථරයේ ස්තූප තිබූ අතර ඉහළ ස්ථරයේ මීටර් 3ක් පමණ උසින් පිහිටි අතර එහි සංඝාරාම විය. උතුරු දෙසට පඩිපෙලවල් සහිතව හතරැස් හැඩයෙන් යුත් ප්‍රධාන ස්තූපය පහළ ස්ථරයේ පිහිටා ඇත. එහි භාර ඔප්පු කිරීම සඳහා කුඩා ස්තූප තිබූ අතර පේළි කිහිපයකට විහාර පිහිටා තිබුණි. කාල සීමා සඳහන් වන කිසිවක් හමුවී නැත. එහි කාල නිර්නය තීරණය කිරීමට ඇත්තේ දර්ශන වාදය හා ස්වර්ට් වලින් සොයාගන්නා ලද විශේෂයෙන් බුකාරා 1 Panr වල බඳින ලද ගෙවල්වල හා අනෙකුත් සිහිවටන හා සංසන්දනය කිරීමෙන් මෙම ගොඩනැගිලි වලින් ස්තූප ඇති පරිශ්‍රයේ ඇති ගොඩනැගිලි ක්‍රි.ව. 1 සිට 5 වෙනි ශත වර්ෂය දක්වා කාලයකට දිවෙයි.

දෙවෙනි පරිශ්‍රයේ සංඝාරාම වල ඇති සොයාගැනීම් වලින් පැහැදිලි වන්නේ එය විශාල බැම්මකින් වටකර තිබූ බවත් ආයත චතුරශ්‍රාකාර සැලැස්මක තිබූ බවත් I-W අක්ෂරේඛාවකින් පෙන්නුම් කරන බවත්ය.

කැඩුනු බිත්ති අළුතෙන් බැඳීම, මූලික ගෙවීමට උඩින් ගල්පතුරු යොදා ඒවා උස්කිරීම, දොරවල් යෙදීම හා අළුත් ගොඩනැගිලි එකතු කිරීම් ආදියෙන්, සංඝාරාම බොහෝ වෙනස්වීම් වලට බඳුන්වී තිබූ බැව් පෙනේ. කාසි විද්‍යාව, වෙනත් වකවානු තීරණය කළ ස්ථාන සමග සසදා බැලීමෙනුත්, සංඝාරාමය ක්‍රි.ව. දෙවෙනි ශතවර්ෂයේ සිට 5 වන ශත වර්ෂය දක්වා කාලයක පැවැති බව පරීක්ෂණවලින් පැහැදිලිවේ.

සංඝාරාමය පිහිටි සම්පූර්ණ පූජනීය ප්‍රදේශය, කලින් පැවැති සුසාන භූමියක් මත ඉදිකර ඇති බව පෙනේ. සමහර මිනී වලවල්වල පතුල දක්වා හාරා ඇති බවත් නමුත් කිසිම දෙයක් ඒවායින් හමුනොවූ බවත් පුරාවිද්‍යා කැනීම් වලින් අනාවරනය වී ඇත.

